# මහ රහතුන් වැඩි මහ ඔස්සේ

# යහපත් රාත්‍රියක්

සුදත් චන්ද්‍රසේකර ඉදිරිපත් කිරීමක්

දිවයින ඉරිදා සංග්‍රහය ලිපි මාලාවක් ඇසුරෙනි

**තෙරුවන් සරණයි**

මෙය හුදෙක් ධර්ම දානයක් වශයෙන් හැකිතාක් බෙදා හරින්න.

http://www.maharahathunwadimaga.com

***“ මේ සෝර, කටුක, භයානක සංසාරයේ භිය දැක, මේ ආත්මභාවයේම සසර දුකින් එතෙර වීමට අධිෂ්ඨාන කරමින්, වීර්ය වඩමින්, නිවන් මග පුරන, 'දක්ෂ', ගිහි පැවිදි උතුමන්ට පමණක් මේ අහිංසක ව්‍යයාමය, උපකාරයක්ම වේවා, ශක්තියක්ම වේවා, මාර්ගයක්ම වේවා.***

***තම තමන්ට වැටහෙන ප්‍රමාණයට තම තමන්ගේ ජීවිත වලට ගලපාගනිත්වා, අර්ථ හෝ ව්‍යාකරණ වැරදි ඇතොත් ඔබ නොකළ වරදකට ඔබ නොගැටේවා, අනුනටද අනුකම්පා කෙරේවා, වැරදි නැතොත් නිවැරදි දෙය නිවැරදි ලෙස දකීවා.***

***මෙහි සටහන් හැම අර්ථයක් තුළින්ම ඔබ සැමට යහපතක් වේවා! තමා තමාටම පිහිටකොට ගනිත්වා... ”***

යැයි උන්වහන්සේ ඒ පොත් පෙළ ඇරඹුමේ ලියා ඇත්තාහ.

වේලාව සවස හතරට පමණ ඇති, නොවැම්බර් වැසි කාලයේ, වැසි වළාකුළු බොහෝම ඉක්මනට, කඳු සහිත තෙත්කලාපීය පරිසරයට, අඳුර රැගෙන එනවා. ගහකොළ නිසොල්මන්ව තිබෙන්නේ, කුරුල්ලන්ගේ එකිනෙකට වෙනස් වූ කිචි බිචිය, නොරතෝංචියක් නැතුව ඇසෙනවා. දිනයේ අවසාන ආහාර වේලට, රසවත් පණුවෙක්, දළඹුවෙක් සොයමින් ගහෙන් ගහට පියාඹන කුරුල්ලන් මේ උත්සාහ ගන්නේ, දිනයේ අවසාන ප්‍රාණඝාත අකුසලයක් සිදුකොට ගෙනම රාත්‍රී නින්දට යන්න. දවස පුරාම ප්‍රාණඝාත අකුසල්ම සිදුකර ගනිමින් පණුවන්, දළඹුවන් මරාගෙන කෑමෙන්, කුස පිරෙනකොට කුරුල්ලන්ගේ කිචි බිචියේ හඬ තව වැඩිවෙනවා. පිංවත් ඔබ ආශ්වාදය ලබන කුරුල්ලන්ගේ කිචි බිචිය කියන්නේ, එම කුරුල්ලන් ලබන කාම ආශ්වාදය. එම ආශ්වාදය උදෙසා, අතීත අකුසල් සංස්කාර හේතුවෙන්ම, පණුවන්, දළඹුවන් දස දහස් ගණනක් දිනකට මේ වනපෙතේ, මරණයට පත්වෙනවා. අකුසල් සංස්කාරයන්ගේ කුරිරු ස්වභාවය පිලිබඳ පැහැදිලි කමටහනක්, කුරුල්ලන්ගේ කිචි බිචිය තුළ සැඟවී තිබෙනවා. තව මොහොතකින් ඇඳිරි වැටේවි, වැසි වළාකුළු බරවෙච්ච මළානික අඳුරු පරිසරය, ජීවිතයට අනිත්‍ය සංඥාවන් තව තවත් මෝදුකොට දෙනවා. අඳුර වැටුණාය කියන කාරණය නොවේ ජීවිතයට දැනෙන්නේ. උදෑසන පෑයූ ඉර අනිත්‍යව ගියාය කියන කාරණයයි. උදෑසන දිනය පටන් ගන්නා කොට තිබූ පරිසරයේ දීප්තිමත්භාවය, අඳුර විසින් ගිලගන්නා කොට, දිනය පුරාවට, පින්වත් ඔබ තුළ සක්ස්වුන සිතුවිලි කීදාහක් සංස්කාර විසින් ගිලගන්නට ඇතිද. ඉර ගාලගෙන යන වේගයෙන්ම සංස්කාරයන් ගලාගෙන යනවා. වරෙක ඉර විසින්ම ලෝකය එළිය කරනවා, වරෙක ඉර විසින්ම ලෝකය අඳුරු කරනවා. පිංවත් ඔබ රැස්කරන සංස්කාරයන්ද වරෙක ඔබව සුගතියට යොමුකරනවා, වරෙක ඔබව දුගතියට යොමුකරනවා. සතර මහා ධාතුවෙන් නිර්මාණය වූ, ඉර නමැති රූපයද, ශරීරය නමැති ආයතන හයෙන් නිර්මාණය වූ රූපයද, එම රූපයන් කෙරෙහි චන්දරාගයෙන් සකස්වෙන පංචඋපාදානස්කන්ධයද පරිසරයට චමත්කාර අර්ථකතනයක් ලබාදෙනවා. මෝහය දළුලනවා, දළු කෙරෙහි තෘෂ්ණාවෙන් බැඳුනු පණුවන්, දළඹුවන් දළුවල සාරය උරා බොන විට, කුරුල්ලන් එම සතුන්ව මරාගෙන කනවා. ලෝකයේ අර්ථය අවිද්‍යාවෙන් පටලවාගතහොත්, පිංවත් ඔබ තුළත්, අවිද්‍යාවේ දළු මෝදුවෙනවා. අවිද්‍යාවේ දළු අතර සුවසේ වැඩෙන, අකුසල් මූලයන්, පින්වත් ඔබේ සුගතියේ සැපය මරාදමනවා. දැන් අඳුර,වැටෙන්න හුඟාක් කිට්ටුයි. දිනය පුරාවට මුළු ආසියාවම ආලෝකමත් කරපු ඉර එළිය අනිත්‍ය වී යනවා. උපැස් යුවළ පැළඳගෙන මේ සටහන ලියන භික්ෂුවගේ දෑස් දෙකත් කෙවෙනවා. එකම මොහොත මුළු ආසියාවම ආලෝකමත් කරපු ඉර අනිත්‍ය වී ගිය නම් මේ පුංචි ඇස් දෙක ගැන මොන බලාපොරොත්තු තබා ගන්නද. රූපය, රූපයේ ස්වභාවය වන ජාති ජරා ව්‍යාධි මරණ ස්වභාවයෙන්ම තිබුණාදෙන්. අවබෝධය තුලින්ම ඉරත්, ඇසත් දකින්න ඔබ දක්ෂවෙන්න ඕනේ. ආලෝකයත්, පෙනීමත් දකින්න ඔබ දක්ෂවෙන්න ඕනේ.

රාත්‍රිය ගැන කථාකරන කොට, ලොව්තුරා බුදුරජාණන්වහන්සේ, කුමාරකාශ්‍යප මහරහතන් වහන්සේට, අර්ථදැක්වූ සූත්‍රයක් මතකයට එනවා. එය වම්මික සූත්‍රය. සම්‍යක්දෘෂ්ටික දෙවියෙක් තමයි රාත්‍රී කාලයේ කුමාරකාශ්‍යප මහරහතන් වහන්සේ මුණගැසීමට පැමිණිලා, මේ සූත්‍රය නිධාන වෙච්ච කාරණය තමයි පවසන්නේ. මෙම දෙවියා විමසනවා කුමාරකාශ්‍යප මහරහතන් වහන්සේගෙන් හිමියනි තුඹසක් තිබෙනවා. එම තුඹස රාත්‍රී කාලයට දුම් දමනවා. දහවල් කාලයට මේ තුඹස ගිනි ගන්නවා. මේ තුඹස කියන්නේ කුමක්ද, මේ තුඹස රාත්‍රී කාලයට දුම් දමනවා, දහවල් කාලයට මේ තුඹස ගිනි ගන්නවා කියන්නේ කුමක්ද කියලා. කුමාරකාශ්‍යප මහරහතන් වහන්සේ මෙම ප්‍රශ්නය බුදුරජාණන්වහන්සේ හමුවට අරගෙන යනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා කුමාරකාශ්‍යප, මේ තුඹස තමයි සතර මහා ධාතුවෙන් සෑදුන, ආහාර නිසා පෝෂණය වන, මේ ශරීරය කියලා. මේ මනුෂ්‍යයා රාත්‍රී කාලයට දුම් දමනවා. පිංවත් ඔබ දිනය නිමාකරලා නිදි පැදුරට වැටුනට පස්සේ නින්ද පැමිණෙන තුරාවට පසු දවසේ කළ යුතු ගොඩාක් දේවල් සැලසුම්කරනවා. රැකියාව,ව්‍යාපාරය, අධ්‍යාපනය, පවුල, සමාජ සේවය,

විනෝදය, හෙට දවසේ මේවා විඳින හැටි අයිතිකොට ගන්නා හැටි, මනසින් චිත්‍ර මවාගන්නවා, විතර්ක ගොඩනගා ගන්නවා. රාත්‍රී කාලයම ජීවිතය නමැති තුඹස දුම්දැමීම නිසාම, හුඟදෙනෙකුට වර්තමානයේ නින්ද කියන කාරණය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ හේතුව නිසාම වර්තමානයේ මනුෂ්‍යයා බෙහෙත් පෙත්තකින් නින්ද ලබාගැනීමේ උත්සාහයට පැමිණ තිබෙනවා. වර්තමානයේ පිරිටන් පෙත්තක් ෆාමසියකින් ලබාගන්නත්, වෛද්‍ය නිර්දේශයක් අවශ්‍ය වෙනවා. ඒ තරමට නින්ද නොයාම මනුෂ්‍යයාට ප්‍රශ්නයක් වෙලා. ප්‍රශ්නය විසඳා ගන්න මනුෂ්‍යයා උත්සාහගන්නේ, බෙහෙත්පෙති ගිල දමමින්, එසේත් නැත්නම් මත්ද්‍රව්‍ය ගිලදමමින් තව තව අතුරු ආබාධ කරා ජීවිතය යොමුකරවමින්. අනාගත ලෝකයේ ඖෂධ රෝහල් සේවාවන් මේ හේතූන් නිසාම ලාභදායි ව්‍යාපාරයක් වෙනවා. මෙම ව්‍යාපාරයන්ගෙන්, සේවාවන්ගෙන් තොරව ජීවත් වීමට මනුෂ්‍යයාට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. රෝගීන් නිසාම අතිරික්ත ධනය මේවාට ගලාගෙන එනවා. එම ක්ෂේත්‍රයන්හි සේවයන් සලසන පිංවතුන්ද එම අතිරික්ත ධනය නිසාම, අකුසල මූලයන්ට කොටුවෙනවා. මාරයා ලෝකය ලස්සනට නිර්මාණය කරනවා. එක පැත්තකින් ධර්මයෙන් ඈතට යන මනුෂ්‍යයින් රෝගීන් බවට පත්වෙනකොට, නිරෝගීභාවය උදෙසා බෙහෙත් කරන ආයතන, අතිරික්ත ධනය තුලින් අකුසලයට යොමුකරනවා. භික්ෂුවට මතකයි මීට වසර විසිපහකට පමණ පෙර, භික්ෂුවගේ ගම් පළාතේ සුදුසුකම්ලත් බටහිර දොස්තර මහත්මයෙක් සිටියා. එම දොස්තර මහත්මයා රෝගීන් පරීක්ෂා කරලා අවශ්‍ය බෙහෙත් ලබාදීලා අයකලේ රුපියල් විස්සයි. එතුමාම ලංගම බසයෙන් ඔසුසලට ගිහිල්ලා සතියකට වතාවක් අවශ්‍ය ඖෂධ අරගෙන එනවා. අවුරුදු විසිපහක කාලයක් තුළ අපි වර්තමානයේ සිටින අවිවේකි, දිගු පෝලිම් සහිත, මිල අධික, වෛද්‍ය සේවාවක් කියන තැනට පැමිණ තිබෙනවා. සුපිරි පන්තියේ රෝහල්, ඉහල ශ්‍රේණියේ වෛද්‍ය පහසුකම්, දියුණු කරන ලද ඖෂධ සහ සේවාවන් තුලින්, වර්තමානයේ අපි දකින්නේ මන්ෂ්‍යයාගේ අකුසල් මූලයන්ගේ දියුණුභාවයයි. දුස්සීලභාවයන් නිසාම ලෝභ, ද්වේශ, මෝහ ධර්මතාවයන් නිසාම, මන්ෂ්‍යයාගේ උපත සහ මරණය, අතර කාල පරාසය හීනවෙනකොට, එම අඩු කාලපරාසය පිරවෙන්නේ රෝගාබාධවලින්. මේ හේතුවෙන් ඉහත ක්ෂේත්‍රය තව තව වෙනවා. එම ජනප්‍රියභාවය පිංවත් ඔබව අකුසල මූලයන් දෙසටමයි යොමු කරන්නේ. එම නිසා පිංවත් ඔබ දක්ෂවෙන්න ඕනේ මාරයා සැලසුම් කරන දිශාවට නොව, සද්ධර්මයේ අර්ථයන් වැඩෙන දිශාවට ගමන් කරන්න. ධර්මානුකූලව ජීවිතය ගලපාගැනීමට අදක්ෂ අය, ඕනෑම දිශාවකට ගිය දෙන්. පිංවත් ඔබ ගලා එන මුදල් හමුවේ දූක සැප පටලවාගන්න එපා. ආශ්වාදයන් හමුවේ ආදීනවයත් තිබෙනවාමයි. එය ධර්මතාවයකි. එම නිසා තමාගේ සීමාව කුමක්ද යන්න ධර්මානුකූලව ගලපාගන්න දක්ෂ වෙන්න ඕනේ.

භික්ෂුව හොඳින් හඳුනන රජයේ රෝහලක වසර තිහකට වැඩි කාලයක් සේවය කල හෙදි පාලිකාවක් සිටියා. ඇය තම රෝහලේ සේවය අකුරටම සිදුකල හෙදි සොයුරියක්. ඇය නිරතුරුව ප්‍රකාශ කලේ තමාට සිල් සමාදන්වීමට දන්දීමට, භාවනා කිරීමට, අවශ්‍ය නොවන බවත්, තමා රෝගීන් වෙනුවෙන් කරන සේවය, රෝගී උපස්ථානය, තමාට හොඳටම ප්‍රමාණවත් බවයි. ඇය රෝහලේ සේවය තුලින්, රෝගීන්ට කරන උපස්ථානය, ලොකුම පිංකම හැටියටයි විශ්වාස කලේ. මේ හේතුව නිසාම ඇය පන්සල් යාම සිල්සමාදන් වීම, දන්දීම සිදුකලේ බොහෝම අඩුවෙන්. මේ සටහන් ලියන වේලාවේ, විශ්‍රාමික ඇය දැඩිලෙස රෝගීව, සිහිමද ගතියෙන් පසුවන්නේ, ඇය මෙලෙස රෝගීව මාස හයකට වැඩියි. ඇයගේ ඥාතීන් කියන්නේ ඇය හුඟාක් දුක් විඳින බවයි. පිංවත් වෛද්‍ය ක්ෂේත්‍රයේ ඔබ නුවණින් දකින්න උතුම් තෙරුවන් සරණ පැත්තකින් තබලා, රෝගීන් සරණකරගත් හෙදි සොහොයුරියක්, උතුම් ශීලය, සිල්වතුන් උදෙසාම පූජාකරන දානය පැත්තකින් තබලා, රෝගීන්ට පමණක් සලකපු, උපස්ථාන කරපු ගෞරවනීය හෙදි සොහොයුරියගේ ජීවිතය තුළ මෙවැනි මොහොතක ශක්තිමත්ව මතුකොට ගැනීමට කුසලයක් තිබිය හැකිද. සමහරක් පිංවතුන් සිතනවා, තමන් රාජකාරිය හැටියට රෝගීන්ට කරන්නා වූ ප්‍රතිකාර, උපස්ථාන

නිසා තමන්ට දාන, ශීල භාවනා කටයුතු කිරීමට අවශ්‍ය වෙන්නේ නැහැ කියලා. පිංවත් ඔබ මේ මුලාවෙන් බැහැර වෙන්නට ඕනේ. පිංවත් ඔබ රෝගීන් උදෙසා කරන සේවය, ඔබේ මරණය නැමති අභියෝගාත්මක අවස්ථාවේදී, ශක්තිමත් කුසලයක් බවට මතුකොට ගැනීමට, ඇති ඉඩකඩ ඉතාමත් සීමිතයි. මොකද පිංවත් ඔබ, රැකියාවක් වශයෙන්, වැටුපක් උදෙසායි මේ උපස්ථානයන් සිදු කරන්නේ. උසස් වීම්, අතිකාල, දිරි දීමනා, සේවා සුරක්ෂිතභාවය, වෘත්තීමය අයිතිවාසිකම්, මේවා ලබාගනිමිනුයි ඔබ රෝගීන්ට උපස්ථානය කරන්නේ. දෙවැනි කාරණය තමයි,පිංවත් ඔබේ උපස්ථානයට ලක්වෙන රෝගියා සමහර විට පංචසීලය රකින්නේ නැති කෙනෙක් වෙන්න පුළුවන්. එසේත් නැතිනම්, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැර කෙනෙක් වෙන්නත් පුළුවන්. එහෙම වෙනකොට කුසල් මූලයන් ශක්තිමත්ව මතුකොට ගැනීමට හැකියාව නැතිවෙනවා. රෝගීන්ට උපස්ථානය කිරීම් සම්බන්ධව ලොව්තුරා බුදුරජාණන්වහන්සේ බොහෝම පැහැදිලි දේශනාවක් කොට තිබෙනවා. මේ දේශනාවට වැරදි අර්ථයන් දක්වමින් පිංවතුන් සිතනවා, රෝගීන්ට උපස්ථානය කිරීම, බුදුරජාණන්වහන්සේට උපස්ථානය කිරීමක්ය කියලා. මේ මතය නිසාම රැකියාවක් වශයෙන් රෝගීන්ට ප්‍රතිකාර කිරීම, උපස්ථාන කිරීම තුළින් ප්‍රාතිහාර්යයක් බලාපොරොත්තු වෙනවා. ඉහත මතය සම්පූර්ණ වැරදි මතයක්. බුදුරජාණන්වහන්සේ දේශනා කොට ඇත්තේ, යමෙක් රෝගීන්ට උපස්ථානය කරන්නේ නම්, ඔහු හෝ ඇය, බුදුරජාණන්වහන්සේ දේශාන කළ දෙය කරන කෙනෙක් වෙනවාය කියලයි. ලොව්තුරා බුදුරජාණන්වහන්සේට කරන උපස්ථානය, ප්‍රතිකාරය ලෝකයේ ඇති ශ්‍රේෂ්ඨම පිංකමක් වෙනවා. එය ශ්‍රේෂ්ඨම පිංකමක් වන්නේ, බුදුරජාණන්වහන්සේ ගුණයන්, ඥාණයන් නිසාමයි. දෙවැනි ශ්‍රේෂ්ඨ පිංකම වන්නේ, මහාසංඝරත්නය උදෙසා කරන උපස්ථානයයි. තෙවනුව ශ්‍රේෂ්ඨවන්නේ ශීලයන් ආරක්ෂාකර ගනිමින් ජීවත්වන පිංවතුනට කරන උපස්ථානයයි. අනෙකුත් සියළුම උපස්ථානයන් මේ සීමාවෙන් පහළටයි ගැනෙන්නේ. ඉහත උපස්ථාන ඔබ කළ යුත්තේ ලාභසත්කාර, කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුව නොවෙයි. එසේ බලාපොරොත්තු ඇති කරගතහොත්, ආනිශංස පක්ෂය හීන වෙනවා. මොනම හේතුවක් නිසාවත් රෝගීන්ට උපස්ථානය කිරීම බුදුරජාණන්වහන්සේට කරන උපස්ථානයක් වශයෙන් දකින්න එපා. එහෙම වුනොත් පිංවත් ඔබට බුදුරජාණන්වහන්සේගේ උතුම් ඥාණයන්, ගුණයන් කෙරෙහි ශ්‍රද්ධාව සකස්කොට ගැනීමට නොහැකිවෙනවා. මෙම කාරණය සඳහන් කිරීමට භික්ෂුව අසහස් කලේ වෛද්‍ය ක්ෂේත්‍රයේ සමහරක් පිංවතුන්, තමන් රෝගීන්ට කරන උපස්ථාන තුළින් පමණක් සෑහීමට පත්වෙන ප්‍රවණතාවයක් දැකීමට තිබෙන නිසා. පිංවත් ඔබ රෝගී උපස්ථානය, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, ශීලයත්, දානයත් තුළින් අයෝමය ශක්තියක් බවට පත්කොට ගැනීමට දක්ෂවෙන්න. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා රෝගියා යනු දේවදූතයෙක්ය කියලා. රෝගියා තුළින් දේවදූතයා මතු කොට ගන්නේ පිංවත් ඔබත් ලෙඩවෙන මැරෙන ස්වභාවයෙන් යුක්ත බව තේරුම් ගැනීමෙන්. රෝහල කියන්නේ රෝගියා කියන්නේ කායානුපස්සනාව, වේදනානුපස්සනාව, සතර සතිපට්ඨාන ධර්මයන්ම හොඳින් වැඩෙන මරණානුස්සතිය අසුභය කමටහන් හොඳින් වැඩෙන තෝතැන්නක්. මෙතනදී පිංවත් ඔබ දක්ෂ වෙන්න ඕනේ, මෛත්‍රිය නැමැති විපාකදී අවසන් වන සංස්කාරයන්ගෙන් ඔබ්බට ගොස්, ධර්මයේ සැබෑම අරටුව වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ධර්මතාවයන්ම රෝගියා තුළින් මතුකොට ගන්න. රෝගියා තුළින් තමාව දකින්න. අතීත සංස්කාරයන්ගේ බියකරුබව නුවණින් මෙනෙහි කරන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, කර්මය කර්මඵල විශ්වාසය නොදන්න බටහිර සමාජය, රෝගී උපස්ථානය තුළින් ආශ්චර්යයක් බලපොරොත්තුවෙනවා. ප්‍රේත ලෝකයේත්, තිරිසන් ලෝකයේත් නීරෝගී ප්‍රේතයන්, නීරෝගී තිරිසන් සතුන් සිටිනවා. මේ අය පෙර මනුෂ්‍ය ජීවිතවල ඉපිද රෝගීන්ට හොඳින් උපස්ථාන කළ උදවිය. නමුත් ශ්‍රද්ධාව, ශීලය කියන කාරණාවන්, කර්මය කර්මඵල විශ්වාසය ජීවිතයට එකතුකොට ගන්නේ නැහැ. අපි මරණින් මතු නීරෝගී ප්‍රේතයෙක්, නීරෝගී තිරිසන් සතෙක් වෙලා වැඩක් නැහැ. උතුම් සම්මා දිට්ඨියට පත්වූ මනුෂ්‍යත්වයයි,

දේවත්වයයි වටින්නේ. ඒ වටිනාකම ලබාගන්න නම්, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, ශීලය, දානයට ජීවිතය තුලින් වටිනාකම ලබාදෙන ගමන්ම, රෝගී උපස්ථානයද කරුණාවෙන් ගෞරවයෙන් යුතුව සිදුකරමින් රෝගී උපස්ථානය අර්ථවත්කොට ගන්න දක්ෂ වෙන්න.

පිංවත් දොස්තර මහත්මයෙක් ධර්ම සාකච්ඡාවකදී ප්‍රශ්නයක් අසුවා, ලෝකයේ වෛද්‍ය විද්‍යාව දියුණුවෙනකොට මනුෂ්‍යයාගේ ආයුෂ වැඩිවෙන්න, රෝගී භාවයන් අඩු වෙන්න ඕනේ නේද කියලා. වෛද්‍ය විද්‍යාව කොතෙක් දියුණු වුවද, වෛද්‍ය විද්‍යාවට හැකියාවක් නැහැ ලොව්තුරා සම්මා සම්බුද්ධ ඥානයට අභියෝග කිරීමට. බුදුරජාණන්වහන්සේ ලෝකය විවරණය කරන්නේ සංස්කාරයන්ට අනුව, හේතුඵල ධර්මයන්ට අනුව. වෛද්‍ය විද්‍යාව යනු දැනුම් සම්භාරයක් පමණයි. සංස්කාරයනුයි ලෝකය තීරණය කරන්නේ. වෛද්‍ය විද්‍යාව කොපමණ දියුණු ඖෂධ සොයගත්තත්, මනුෂ්‍යයාගේ ආයුෂ දීර්ඝ කිරීමට, මනුෂ්‍යා නීරෝගී කිරීමට බැහැ. ඊටත් වඩා ශක්තිමත්, විෂබීජයක්, වෛරසයක් මනුෂ්‍යා තුලින් සකස්වෙනවා. මනුෂ්‍යා තුල මේ විෂබීජ, වෛරස සකස්කරන්නේ දුස්සීලභාවය විසින්. ඒඩ්ස් කියන වෛරසය නිර්මාණය කළේ, දුස්සීලභාවය විසින්. පිළිකාව කියන රෝගය නිර්මාණය කළේ අතීතයේ සිදුකළ අකුසල් හේතුවෙන්. අකුසල් කියන්නේ සීලයෙන් දුර්වල වීම. අනාගතයේදී මීට වඩා දරුණු රෝගාබාධ මනුෂ්‍යා තුලින් මතුවී එන්නේ දුස්සීලභාවය නිසාමයි. එසේ නම් පිංවත් ඔබට ලෝකයා නීරෝගීභාවයට පත්කිරීමට අවශ්‍ය නම්, වෛද්‍ය විද්‍යාවේ දියුණුව මනුෂ්‍ය ප්‍රජාව උදෙසා සැබෑ ලෙසටම ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය නම්, මනුෂ්‍යා සිල්වත්භාවයට පත් කිරීමෙන් පමණයි එය කළ හැක්කේ. දුස්සීලභාවයමයි ආයුෂ අඩුවීමත් රෝගාබාධයන්ටත් හේතු සාධක වන්නේ. පිංවත් රෝගීන් දිනකට බෙහෙත් වේල් තුනක් ගන්නවා වගේම, අවම වශයෙන් දිනකට එක් වතාවක්වත්, ජාති ආගම් භේදයකින් තොරව පංචශීලය සමාදන්ව, ආරක්ෂාකොට ගන්නවා නම්, එය රෝගියා ලබාගන්නා වටිනාම ප්‍රතිකාරය වෙනවා. උතුම් සිල්වත්භාවය තුල සිටිමින්ම, එක මොහොතක් හරි මෛත්‍රී චිත්තයක් සකස්කොට ගන්නවා නම් එය උතුම් ප්‍රතිකාරයක්මයි වෙන්නේ. පිංවත් වෛද්‍ය මහත්මයෙක් රෝගියාට ප්‍රතිකාර කරනවා යනු සංස්කාරයන්ට ප්‍රතිකාර කිරීමක්. සංස්කාරයන්ට ප්‍රතිකාරකොට නිමාවක් අවසානයක් දැකිය නොහැකි බව, පිංවත් ඔබලාගේ ක්ෂේත්‍රයේ අත්දැකීම් තුලින්ම අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. පිංවත් ඔබෙන් ප්‍රතිකාර ලබන රෝගියා සංස්කාරයන්ගේම ඵලයන් වගේම පිංවත් ඔබගේ වෛද්‍ය ක්ෂේත්‍රයේ දැනුම, හැකියාව, විශේෂඥ හැකියාවද සංස්කාරයන්ගේම ප්‍රතිඵලයක් බව නුවණින් දැකීමට දක්ෂවුවහොත්, පිංවත් ඔබට යම් ප්‍රමාණයකට සංස්කාර නැමති පැටළුන නූල් පන්දුවේ පැටළුම හඳුනා ගත්තා වනු ඇත. මේ නූල් පන්දුව පැටළුම දිගහැරගන්නා ප්‍රමාණයටයි ඔබ තුළ වෘත්තීය හැකියාවන් පිලිබඳව, මමත්වයේ දැඩිභාවය තුනී වෙන්නේ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා යමෙක් උසස් අධ්‍යාපනයට යොමුවෙන්නේ උසස් අධ්‍යාපනය තුලින් සමාජයේ පැසසුම් ලබන වෘත්තකක් බවට පත්වන්නේ, පෙර ජීවිතයේදී අනුන්ගේ දියුණුවට ඊර්ෂ්‍යා නොකළ නිසා, ගරුකලයුත්තන්ට ගරු කල නිසා. අනුන්ට දැනුම සත්පුරුෂභාවයෙන් උපකාර කල නිසා, මහණ බමුණන්ගෙන් කුසලය කුමක්ද, අකුසලය කුමක්ද, කලයුතු දෙය කුමක්ද නොකල යුතු දෙය කුමක්ද කියලා ඇසීමට දක්ෂ වූ නිසාය කියලා. මේ අතීත කුසල් සංස්කාරයන්ගේ ශක්තියයි ඔබ ලබා ඇති උසස් වෘත්තියේ හැකියාව. දැන් ඔබට පුළුවන් තරාදියේ දෙපැත්ත හොඳින් දකින්න. රෝගියෙක් යනු කුසල් සංස්කාරයන්ගේ ඵලයයි. රෝගයට ප්‍රතිකාර කරන ඔබේ විශේෂඥ දැනුම කුසල් සංස්කාරයන්ගේ ඵලයයි. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා දක්ෂයා, අදක්ෂයා, නූගත් බව, පණ්ඩිත බව යනු කර්මයන්ම මූලිකකොට ඇතිවන්නක්ය කියලා. මෙතන ඇත්තේ හුදු කුසල් අකුසල් ගනුදෙනුවක් පමණි. මෙතැන ඇත්තේ ධනය, කීර්තිය, මමත්වය රැස්කළයුතු ක්‍රියාවක් නොව අවබෝධයෙන් හඳුනාගත යුතු ක්‍රියාවලියකි. ලොව්තුරා බුදුරජාණන්වහන්සේට ප්‍රතිකාර උපස්ථාන කල ජීවක වෛද්‍ය වරයා පවා නිවන් අවබෝධ කරගත්තාය

කියන කාරණය භික්ෂුව අසා නැත. එය එසේ වුයේ බුදුරජාණන්වහන්සේට ප්‍රතිකාර කලද තමන්ගේ උපස්ථානයට ලක්වූ රෝගියාද තම විශේෂඥ වෛද්‍ය හැකියාවද සංස්කාරයන්ගේම ඵලයක් හැටියට දැකීමට දක්ෂභාවය ඔහු තුල නොතිබුන නිසාමය. සංස්කාරයන්ට අනුව ජීවිතය දකිනකොට ඔබ තුළ ධර්මරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාවයි මෝදුවෙන්නේ. අචල ශ්‍රද්ධාව මෝදුවෙන ප්‍රමාණයට ඔබ තුලින්ම විචිකිච්චාව තුනී වෙනවා. උතුම් ධර්මරත්නය ආරක්ෂා කර ගන්නා සංඝරත්නය කෙරෙහි ගෞරවය සකස්වෙනවා. මෙන්න මේ හේතු ධර්මයන් ඔබ තුලින් වෘත්තියේ මමත්වයේ දැඩිභාවය තුනීකොට දමන්නේ. වෘත්තීය කෙරෙහි ඇති කරගන්නා මමත්වයේ දැඩිභාවය නිරතුරුවම ඔබව අකුසලයට යොමුකරනවා. මෙවැනි අවස්ථාවන්හීදී ගිහි පැවිදි දෙපාර්ෂවයේ වෙනස හඳුනා ගැනීමට පිංවත් ඔබට නොහැකි වෙනවා. ශිල්වත්භාවය හඳුනාගැනීමට නොහැකි වෙනවා. මෙය සටහන් තබන භික්ෂුව හොඳින් හඳුනන එක ස්වාමීන්වහන්සේ නමක් දැඩි හිසේ කැක්කුමක් සෑදීම නිසා කැපකරු මහත්තයෙක් ප්‍රධාන පෞද්ගලික රෝහලක පිංවත් විශේෂඥ වෛද්‍යවරියක් ලඟට යොමු කළා. නියමිත කාමරයේදී වෛද්‍යවරිය අසල වාඩි වී ඇය රෝග විස්තර සටහන් කරගෙන රෝග පරික්ෂාවට යොමුවෙලා, ඇය මොහොතකින් තමා ඉදිරිපිට සිටි රෝගී භික්ෂුවගේ ගෙල වටා තමාගේ අත දමා භික්ෂුවගේ හිස තමාගේ හිසට සමාන්තරව කිට්ටුවට අරගෙන, බොහෝම තියුණුව භික්ෂුවගේ ඇස් සහ දත් පරික්ෂාවට සිදුකොට තිබෙනවා. එය පැසසිය යුත්තකි. නමුත් මේ පිංවත් වෛද්‍යතුමියට මොහොතක්වත් කල්පනාවුනේ නැහැ තමා ඉදිරියේ සිටින රෝගියා ස්වාමීන්වහන්සේ නමක් බව. ඉහත ස්වාමීන්වහන්සේ කවදාවත් හිතලා නැහැ තමා පැවිදි වූවාට පසුව කාන්තාවක් තමාගේ කරට අත දමාවී කියලා. නමුත් පිංවත් එම දොස්තර මහත්මිය එය එසේ කළා. මෙවැනි නොදැනුවත් භාවයන් සිද්ධවෙන්නේ, ශ්‍රද්ධාවේ දුර්වලතාවයන් නිසා. තෙරුවන් කෙරෙහි ඇතිකරගන්නා ශ්‍රද්ධාව තුලින්මයි අපි කරන වෘත්තිය වගකීම් කුසලයන් බවට පත්කොට දෙන්නේ. උතුම් අනාගාමීඵලයට පත්වූ කාම, රාග, පටිඝ ධර්මතාවන් නැසූ අනාගාමී උපාසක මහත්මයාත්, අද පැවිදිවෙච්ච සාමනේරයන් වහන්සේට වන්දනා කළ යුතුය. පැවිදිභාවයේ වටිනාකම බුදුරජාණන්වහන්සේ එසේයි දේශනා කොට තිබෙන්නේ. අද පැවිදිවෙච්ච සාමනේරයන් වහන්සේටත් අනාගාමී උපාසක මහත්මයා වන්දනා කළ යුතු යැයි බුදුරජාණන්වහන්සේ දේශනාකොට තිබේ නම්, ගිහි පිංවතුන්ලා දරණ උසස් වෘත්තීන් උතුම් අනාගාමී ඵලයටත් වඩා ඉහළ බව සිතන්න හොඳ නැහැ. එය පිංවත් ඔබට අනතුරක්මයි. දැනුමේ භාවිතයෙන් අපිට කවදාවත් සිත පිළිබඳ දැනගන්න බැහැ. ප්‍රඥාව භාවිතයන්මයි, සකස් වෙන සිතුවිලි යහපත් කරගත හැකිවෙන්නේ.

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ළදරු යැයි සිතා සාමනේර ස්වාමීන්වහන්සේට නොසලකා හරින්න එපා කියලා. මොකද කුඩා සාමනේරයන් තුලත් ලොකු ගුණයක් සැඟවී තිබෙන්න පුළුවන් නිග්රෝධ කියන පුංචි සාමනේර හාමුදුරුවෝ තුල චණ්ඩාශෝක මහ රජතුමා ධර්මාශෝක මහරජතුමා බවට පත් කිරීමට අවශ්‍ය මහා ශක්තියක්, ගුණයක්, ඥානයක් සැඟවී තිබුණා.

රෝහිතතිස්ස කියන දෙවියා බුදුරජාණන්වහන්සේ හමුවීමට පැමිණිලා, තමා අතීත භවයේදී ඍධිමත් ඍෂි වරයෙක් වශයෙන් ඉපදිලා තම අසහාය ඍධිමත්භාවය ප්‍රයෝජනයට අරගෙන ලෝකයේ අවසානය සොයාගෙන ගොස් වෙච්ච අකරතැබ්බය ප්‍රකාශ කළා. ලෝකයේ අවසානය තබා අවසානය කියන කාරණය සිතාගැනීමටවත් ඉඩක් නොමැතිව රෝහිතතිස්ස ඍෂිවරයා එම ජීවිතයෙන් චුතව යනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා සයුරට වැටුන පුද්ගලයා පිහිනා දූපතක් පිහිටකොට ගන්නා සේ තමා තමාව පිහිටකොට පිළිසරණ කොටගන්න කියලා. ධර්මයම පිළිසරණ කොට ගන්න කියලා. එවිට පිංවත් ඔබ මුලින්ම නුවණින් විමසා බලන්නේ මනුෂ්‍යා තුල ජරා, ව්‍යාධි, මරණ හටගන්නේ කුමක් නිසාද කියලා. මොකද වෛද්‍ය ක්ෂේත්‍රයේ පිංවතුන්ට හොඳින්ම ප්‍රකට වෙනවා මනුෂ්‍යාගේ ජරා, ව්‍යාධි, මරණ ධර්මතාවන්. දුක කියන අවසානය අල්ලා ගත්තොත් අපිට පුළුවන් අවිද්‍යාව කියන ආරම්භය

මතුකොට ගන්න. අතීතයේ සිටි රෝහිතතිස්ස ඍෂිවරයාට සොයාගැනීමට තබා සිතාගැනීමටවත් නොහැකි වූ ලෝකයේ මුල සහ අවසානය ඔතනයි තිබෙන්නේ. ලෝකයේ මුල සහ අවසානය ඔතනයි තිබෙන්නේ. ලෝකයේ මුල සහ අවසානය තමා තුලම තබාගෙන අනුවණ රෝහිතතිස්ස ඍෂිවරයා අවිද්‍යාව තුලින් ගොඩනගා දුන් සම්මුති ලෝකය තුල අසරණයෙක් මංමුලා වුවෙක් බවට පත්වුනා. මෙතනදී පිංවත් ඔබට ජරා, ව්‍යාධි, මරණ, ශෝක කියන හේතූන්ට සැබෑම ප්‍රතිකාරය, සරළ මාර්ගයක් තුලින් මතුකොට දුන්, ලොව්තුරා බුදුරජාණන්වහන්සේ කියන වෛද්‍යවරයාගේ විශේෂඥ අවබෝධයේ ආශ්චර්යය මතුකොට ගන්න පුළුවන්. බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ දුකත්, දුකේ අවසානයත්, බෙහෙත් පෙත්තකින්, බෙහෙත් කරලකින්, සැත්කමකින් නොව මේවා කෙරෙහි බලාපොරොත්තු ඇති කරන අවිද්‍යාව තුලයි තිබෙන්නේ කියලා.

පිංවත් වෛද්‍ය ක්ෂේත්‍රයේ මහත්වරුන් නිරතුරුවම සිද්ධකරන්නේ විෂඝෝර සර්පයන් හතර දෙනෙක් පෝෂණය කිරීමට උපකාර කිරීමකි. මේ විෂඝෝර සර්පයන් හතරදෙනායි, සතර මහා ධාතුවෙන් සෑදුන රූපය. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ජීවත්වීමට කැමති සත්වයින් නිරතුරුවම මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන විෂකුරු සර්පයින් හතරදෙනාට කවනවා, පොවනවා, නිදිකරනවා, බෙහෙත් දෙනවා කියලා. එසේ නොකලොත් මේ සර්පයින් කිපෙනවා, දෂ්ඨකරනවා, මරණයට පත්කරනවා. මෙන්න මේ විෂකුරු සර්පයින් දෂ්ඨ කරන කොට තමයි වෛද්‍යවරයාගේ සේවය සොයාගෙන සර්පයින් අයිතිකරුවා දුවගෙන එන්නේ. මෙතනදී අපි වඩාත් දක්ෂවෙන්න ඕනේ, වෛද්‍යවරයත් රෝගියාත් මේ දෙදෙනාම මේ විෂකුරු සර්පයින් හතර දෙනාගේ දෂ්ඨ කිරීම් වලට ලක්වෙමිනුයි සිටින්නේ කියන කාරණය මතුකොට ගන්න. මේ විෂකුරු සර්පයින් හතරදෙනා කෙරෙහි ඇතිකොට තිබෙන තෘෂ්ණාවයි ඔබේ වධකයා කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ. මේ වංචාකාරී වධකයාව ඔබ වධකයා හැටියට හඳුනානොගත් නිසාම ඔබ ඔහුට උවටැන් කරනවා, ප්‍රතිකාර කරනවා, පෝෂණය කරනවා, ඔබ ලකුණු දෙනවා. ඔබ ඔහු වධකයා කියා හඳුනා ගන්නේ නැහැ. මේ නොහඳුනාගැනීම නිසාම, යම් දින වධකයා විසින්ම තියුණු විසෙන් ඔබව විනාශයට පත්කරනවා. සත්පුරුෂ ඇසුර නොලබන්නා සත් ධර්මයන් නොහඳුනන්නා, රූපය ආත්මය කොට, ආත්මයෙහි රූපය ඇතැයි දකිනවා. අනිත්‍ය වූ රූපය තතු සේ නොදකින්නා වධකයාගේ පළිගැනීම නිසාම අකුසල් සංස්කාරයන්ම ඉතිරිකොට ගන්නවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා යමෙක් රූපය අභිනන්දනය කරත්ද ඔහු සතුටින් පිළිගන්නේ දුකයි කියලා. එම නිසාම රූපය නිරෝගී කල හැකි යැයි ඔබ වෘත්තීය මමත්වයේ දැඩිභාවය නිසාම සිතන්නේ නම්, එම සිත ඔබගේ සැපය අභිමිකිරීම පිණිසමයි හේතු වෙන්නේ. කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ කාලයේ මනුෂ්‍යාගේ ආයුෂ අවුරුදු විසිදාහයි. මේ කාලයේ ජීවත්වෙච්ච මනුෂ්‍යයින්ට පීඩාවන් පහකට පමණයි මුහුණ දෙන්න සිද්ධ වුනේ කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. හිරු එළිය හේතුවෙන්, ශීතල හේතුවෙන්, කුසගින්න හේතුවෙන්, පිපාසය හේතුවෙන්, දරු ප්‍රසූතිය හේතුවෙන් ඇති වෙන්නා වූ දුක් පහට පමණයි එදා මනුෂ්‍යායෝ මුහුණදුන්නේ. වර්තමානයේ වගේ සියගණන් ලෙඩ රෝග පාරිසරික දූෂණ යුධමය ප්‍රශ්න එදා තිබුණේ නැහැ. මෙවැනි සංසිඳුණු කාලපරිච්ඡේදයක එදා ජීවත් වුන "අර්ථ" කියන තෙරුවන් සරණ ගිය තාපසය, තමන්ගේ දහස් ගණනක් ශිෂ්‍යයින්ට ජීවිතය විග්‍රහ කලේ තණ අග රැඳුන පිණි කැටයක් වගේය කියලා. මරණයට ගෙනයන ගවයෙක් වගේය කියලා. ජීවිතය කියන්නේ එපමණ වේගයකින් මරණය කරා ගමන් කරන දෙයක් වශයෙනුයි අර්ථ තාපසය, තම ශිෂ්‍යයින්ට ඉගැන්වූයේ. ඉහත ජීවිතයේ සැබෑම අර්ථය වර්තමානයේ සියගණනාවක් රෝගාබාධවලින් පෙලෙන තමා ඉදිරියේ සිටින රෝගියා තුලින් මතුකොට ගන්න වෛද්‍ය ක්ෂේත්‍රයේ පිංවතුන් දක්ෂ වෙන්න ඕනේ. මේ දක්ෂභාවයයි ඔබේ සුවපත් භාවය උදෙසා ඔබ කරගන්නා වටිනාකම ප්‍රතිකාරය වෙන්නේ.

රෝගී පුද්ගලයා තුලිනුත් නිරෝගී පුද්ගලයා තුලිනුත් පිංවත් ඔබ දක්ෂනම් කුසල්, අකුසල් මූලයන්ගේ යථා ස්වභාවය මතුකොට ගන්න. ඒ මතුකොට ගැනීම තුලම පිංවත් ඔබ සම්මා දිට්ඨියට පත්වීමට අවශ්‍ය කාරණා ජීවිතයට එකතුකොට ගන්නවා. ඉහත කාරණය නිසාමයි රෝගියා දේවදූතයෙක් කියන අර්ථය ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, නිවන් මාර්ගයේ ගමන් කරන පිංවතා තුවාල වලට බෙහෙත් දැමීමට දැනගත යුතුය කියලා. මෙතනදී තුවාලය කියන්නේ ආයතන හයයි. මේ තුවාල ඇති කර ගන්නේ අවිද්‍යාව කියන විෂබීජයෙන්. ඇසෙන් රූප දැක, කනෙන් ශබ්ද අසා, මනසින් සිතුවිලි සිතමින්, අකුසල් අරමුණු ඇති කර ගැනීමෙන්, නිරතුරුවම අපි තුවාල වැඩිකර ගන්නවා. සත්වයා ඵස්සය කියන තුවාලය නිරතුරුව වේදනා නැමති කෝටුවෙන් පැහැරීමට ලක්කර ගන්නවා. අපි අනුන්ගේ තුවාල සනීපකලත් ඇස නිසා, කන, නාසය නිසා භවයට උඩු දුවන තුවාල අපි ඇති කරගන්නවා නම් එය අපේ භවගමනට රිදුම් දෙන තුවාලයක් වෙනවා. ඉහත සූත්‍රයේදීම බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා දක්ෂ නිවන් මාර්ගයේ ගමන් කරන්නා සුදුසු හොඳ තණ බිම් දැන ගතයුතුය කියලා. මෙතැනදී හොඳ තණ බිම් කියලා බුදුරජාණන්වහන්සේ හඳුන්වන්නේ ධර්මධර විනයධර මහා සංඝරත්නයයි. කල්‍යාණ මිත්‍ර ඇසුරයි. ඉහත හොඳ තණ බිම් ඇසුරු කිරීම තුළින්මයි, භවයට උඩු දුවන රිදුම් දෙන තුවාල සනීප කොට ගැනීමේ හැකියාව තිබෙන්නේ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, මල් වලින් හමන සුවඳින් අග්‍රම සුවඳ දෑසමන් මල් සුවඳයි කියලා. මුල් වලින් හමන සුවඳින් අග්‍රම සුවඳ කලු අගිල් මල් සුවඳයි කියලා. අරටුවෙන් හමන සුවඳ අතරින් අග්‍රම සුවඳ රත් හඳුන් අරටුවේ සුවඳයි කියලා. ලෝකයේ ඇති අවවාදයන් අතරින් අග්‍රම අවවාදය බුදුරජාණන්වහන්සේගේ අවවාදය කියලා. මොකද්ද අපිට බුදුරජාණන්වහන්සේ කරන උතුම්ම අවවාදය. ලෝකය යනු දැනුමෙන් සුවපත් කල හැකි දෙයක් නොව ප්‍රඥාවෙන්ම අවබෝධකල යුතු දෙයක් බවයි. පිංවත් ඔබ ඉදිරියේ සිටින රෝගියා තුළින් ඔබ ලබන දැනුම විදර්ශනා නුවණින් විමසුමට ලක් කිරීමේදී, අවබෝධය සඳහා අවශ්‍ය ප්‍රඥාව ඔබ තුළින් ඔබට සකස්කොට ගතහැකි වනු ඇත. රෝගී භාවය ගැන කථාකරන විට නීරෝගී භාවය ගැන සිංහනාද කරපු බක්කුල මහරතන් වහන්සේ මතකයට නැගෙනවා. උන්වහන්සේ අවුරුදු 160ක් දීර්ඝායුෂ ලබපු උත්තමයෙක්. උන්වහන්සේ පිරිනිවන් පෑමට පෙරාතුව සිංහනාද කරනවා, මාගේ පැවිදි ජීවිතය වසර අසූවක් වෙනවා. මෙතෙක් කලකට එලදෙනෙකගේ තනපුඩුවකින් කිරි ස්වල්පයක් දොවනා තරමේ කාලයක්වත් අසනීපයක් හැදුන බවක් දන්නේ නැහැ කියලා.මෙතෙක් කලකට බෙහෙතක් වශයෙන් අරළු කැබැල්ලක් පාවිච්චි කල බවක් දන්නේ නැහැ කියලා. අතීත කුසල් සංස්කාර හේතුවෙන්ම බක්කුල මහරතන්වහන්සේ අත්විඳි නීරෝගීභාවය, සංස්කාරයන්ගේ ස්වභාවය තේරුම් ගන්න අපට උපකාරී වෙනවා. එසේ නම් සැබෑ සුවපත් භාවය, නීරෝගීභාවය බෙහෙත් කරලක් තුල නොවේ කුසල් සංස්කාරයන් තුලමයි සැඟවී තිබෙන්නේ.

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මනුෂ්‍යයා කාමයේ ආශ්වාදයන්ට යොමු වීම නිසා දීර්ඝ වූ ආදීනවයන් ලබනවා කියලා. කාමයේ ආශ්වාදය කියන්නේ ඉන්ද්‍රිය පිනවීමෙන් ලැබෙන සැපය. එම කාම ආශ්වාදයේ එක ආදිනවයක් තමයි ඔබ තුල ඇති කායික, මානසික රෝගී තත්ත්වයන්. දියවැඩියාව වේවා, කොලෙස්ටරෝල් අධිකවීම වේවා වෙනත් රෝගී තත්ත්වයන් වේවා මනුෂ්‍ය ඉන්ද්‍රියන් පිනවීමට යාමේ අතුරුඵලයන්මයි.

මනුෂ්‍යයා තුල අකුසල් වැඩිවෙන කොට එම අකුසල් ක්‍රියාත්මක වීමට අවශ්‍ය ක්‍රමවේදයන් මනුෂ්‍යයා තුලින්මයි සකස්වෙන්නේ. මනුෂ්‍ය සිතුවිලි වලම ප්‍රතිඵලයක් වශයෙන් තාක්ෂණය ඉදිරියට එන්නේ, මාරයට අයත් අකුසලයේ ලෝකය තව තවත් ශක්තිමත් කොට දෙන්න. තාක්ෂණය විසින්ම අත දිගු කොට පෙන්වන නවීන ආහාර රටාවන්ට පිංවත් ඔබ යොමුවෙන කොට ඒ හේතුවෙන්ම ඔබ තුළ රෝගාබාධ

ඇතිවෙනවා. තාක්ෂණය විසින්මයි එම රෝගාබාධ සුවකිරීමට අවශ්‍ය ඖෂධයන් නිපදවා දෙන්නේ. මෙතැනදී හේතුවත් ඵලයත් දෙකම ඔබට අලෙවි කරන්නේ මාරයා විසිනි. බුදුරජාණන්වහන්සේ මාරයා වශයෙන් මෙතැනදී දේශනා කරන්නේ තෘෂ්ණාවෙන් බැඳුණු මනුෂ්‍ය සිතුවිලියි. මාරයාගේ මේ අසාධාරණ වෙළඳාම මෙතනින් නවතින්නේ නැහැ. තවත් හේතුඵල ධර්මයන් සකස්කොට දෙමින් ඉදිරියට යනවා. කය පිනවීමට යාම නිසා රෝගාබාධයන්ට ගොදුරු වෙන කොට එම රෝගාබාධයන්ට ගන්නා ඖෂධ හේතුවෙන්ම මනුෂ්‍යයා අතුරු ආබාධයන්ට යොමුවෙනවා. දැන් මුළු සමාජයම රෝගීන්. සමාජයම රෝගීන් වෙනකොට වෛද්‍ය ක්ෂේත්‍රය උදෙසා මුදල් ආයෝජන ගලාගෙන එනවා. එම සම්පත් ගලා ඒම මනුෂ්‍යයා තව තවත් තෘෂ්ණාව දෙසටමයි යොමුකරන්නේ. තෘෂ්ණාව වැඩිවෙන කොට ලාභයමයි පරමාර්ථය වෙන්නේ. රෝගයක් සුවකර ගැනීමට වැයවෙන මුදල එම රෝගියාටත්, රෝගියාගේ භාර කරුවන්ටත් කායික රෝගාබාධයන් ඉක්මවාගිය මනසින් සිදුවන බලවත්ම අකුසලයක් වන ද්වේශය කියන කාරණය ඇතිකොට දෙනවා. අවසානයේ රෝගියාත් රෝග සුවකිරීමත් කියන අංශ දෙකම මාරයා පටලවන නූල් බෝලයේ තවතවත් පැටලෙනවා. පැටලෙන පැටලෙන ප්‍රමාණයට අස්වැන්න වැඩියි. මෙතැනදී අස්වැන්න හැටියට ලැබෙන්නේ අකුසලයයි. රෝගියාත් රෝගයට ඖෂධයත්, අතුරු ආබාධයන් තුලින් පිරියන රෝහල් පද්ධතිය මනුෂ්‍ය සිතක සකස්වෙන තෘෂ්ණාව නිසාම ඇති වූවක් බව මනසින් දකිමින් නින්දට යන්න. එම රාත්‍රිය ඔබට යහපත් රාත්‍රියක් වේවි. ආශ්වාදයට නොබැඳෙන ආදීනවය තුනීකරගන්නා, සිහිනුවණින් පමණ දැන අහාර ගන්න හෙට දවසක ආරම්භයක් වේවි.

නින්දගැන කථාකරන්න ගිහිල්ලා රෝගියා කියන තැනට වෛද්‍ය ක්ෂේත්‍රය තියන තැනට එන්න සිද්ධ වුණා. අපි නැවතත් නින්ද කියන තැනට යමු. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මනුෂ්‍යයා රාත්‍රියට දුම් දමනවා කියලා. ඒ කියන්නේ නිදි පැදුරට ගියාට පස්සේ නින්ද යන්නේ නැහැ. ගොඩාක් සිතුවිලි සිතට ගාලගෙන එනවා. හෙට දවසේ රාජකාරි සැලසුම් කරනවා. සිතුවිලි සිතට නැගෙන තරමට නින්ද ඈතට යනවා. විඳීම සකස් වන තැනදී ඔබට හමුවන්නේ තෘෂ්ණාව. ඔබ තුල රූපයන් කෙරෙහි ඇතිවන තෘෂ්ණාව නිසාම ලෝභ, ද්වේශ, මෝහ අකුසල මූලයන් සකස් කොට ගන්නවා. මෙන්න මේ සැලසුම් කොට ගැනීමටයි තුඹස රාත්‍රියට දුම් දමනවා කියලා කියන්නේ. පිංවත් මහත්මයෙක් ප්‍රකාශ කළා හාමුදුරුවනේ රාත්‍රියට නින්ද යන්නේ නැහැ. ගොඩාක් සිතුවිලි සිතට ගලාගෙන එනවා හෙට දවස ජය ගන්න සැලසුම් නිරායාසයෙන්ම සිතට ගලාගෙන එනවා. කොච්චර ඇස් දෙක පියාගන්න හැදුවත්, සිතේ ඇතිවන සිතුවිලි නින්ද පලවාහරිනවා කියලා. නිදිපැදුරේදී ඔබේ ජීවිතය මේ ආකාරයෙන් දුම්දමන්නේ හෙට උදෑසන පටන් ඔබේ ජීවිතය ගිනිගන්න. ගිනිගන්නවය කියලා කියන්නේ, රාත්‍රී සැලසුම් කල කරුණු දහවල් ක්‍රියාත්මක කරනවාය කියන කාරණයයි. ඔබේ ජීවිතයේ ඊයේ දවසට ආපසු හැරී බලන්න, රාත්‍රියට දුම් දමන, දහවලට ගිනිගන්නා ජීවිතයක් නේද ඔබටත් තිබෙන්නේ. අතීතභව ගමනේ රාත්‍රියට දුම් දමමින්, දහවලට ගිනි ගනිමින් පැමිණි දුමත්, ගින්දරත් නිසා කොපමණ දුකකට අප පත්වී ඇතිද. ජීවිතය ඉදිරියේ ප්‍රශ්න ඇතිවන විට, දුම හෝ ගින්දර මුණගැසී වැඩක් නැහැ. ප්‍රශ්නයක් ඇතිවන විටදී සද්ධර්මයයි මුණගැසෙන්න ඕනේ. ඔබේ ජීවිතයට පැමිණෙන කුමන ප්‍රශ්නයක් වුවද නිවැරදි විසඳුම ඇත්තේ සද්ධර්මය තුලයි. සද්ධර්මයයි ජීවමාන බුදුරජාණන්වහන්සේ. බුදුරජාණන්වහන්සේ භද්දෙකරත්ත සූත්‍රයේදී දේශනා කරනවා අද කලයුතු දෙය අදම කරන්න. හෙට මරණය පැමිණිය හැකියි. සේනාසහිත මාරයා සමග කවර සැලසුම්ද, කවර ගිවිසුම්ද කියලා. පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය දකින, පටන්ගත් වීර්යය ඇති තැනැත්තා යහපත් රාත්‍රියක් ගතකරන්නේය කියලා. පිංවත් ඔබගේ රාත්‍රියට නින්ද නොයාමේ ප්‍රශ්නයට සැබෑම විසඳුම බුදුරජාණන්වහන්සේ බොහෝම පැහැදිලිව දේශනා කොට තිබෙනවා.

රූපය කෙරෙහි ඡන්දරාගයෙන් බැඳුන සිතිවිලි නැමැති මාරයා සමග කෙසේ නම් විවේකයක් ලබා ගන්නද. සිතුවිලි නැමැති මාරයා රූප ඉව කරමින් දුවනවා. වරෙක සම්මතය තුල දිව යනවා. වරෙක අසම්මතය තුළ දිවයනවා. ආශ්වාදයේ නිරුවතට ලස්සන සළුපිළි අන්දවමින් වසා පෙන්වනවා. වැඩිපුර අයිතිකොට ගැනීමේ තරඟයටමයි ඇද දමන්නේ. පිංවත් ඔබ නොදන්නා මාර සේනාවේ ඉලක්කයන් තිබෙනවා. රූප පෙන්වා ඔබගේ අකුසල මූලයන්ගේ ගොඩ වැඩිකරනවා. අනිත්‍ය සංඥාව පිංවත් ඔබගේ ජීවිතය කිට්ටුවට ගන්න. එවිට ඔබ ධර්මයට ගොඩාක් කිට්ටු වෙනවා. ජරා, ව්‍යාධි, මරණ ධර්මතාවයන් හැකිතාක් ඔබේ ජීවිතය කිට්ටුවටම ගන්න. එතකොට පිංවත් ඔබට හිතෙනවා හෙට උදේ වෙනකොට ඔබ මරණයට පත්වෙන්න පුළුවන් කියලා. දැන් ඔබ සැලසුම් කරන්නේ හෙට ජීවත්වෙන්න නොවේ. හෙට උදෑසනට පෙර පැමිණෙන මරණයට මුහුණ දෙන්න. පිංවත් ඔබ රාත්‍රියට හිස කොට්ටය මත තබාගත්ත මොහොතේ පටන් හෙට උදෑසන ඔබ මිය ගොස් සිටිතියි දකිමින් නිදන්න. බාහිර කිසිම සිතුවිල්ලකට ඉඩ නොදෙන්න. ඔබේ මළකඳ මනසින් දකිමින් නිදන්න. ගිහි පිංවතුන්ලා වන ඔබ, මරණය දකිමින් නිදන්න භය වෙන්න එපා. මෙතැනදී යහපත් රාත්‍රියක් උදෙසා උපක්‍රමයකුයි යොදන්නේ. රාත්‍රිය අයහපත් කරන සිතුවිලි නැමැති මාර සේනාව යටපත් කොට දැමීම සඳහා සිතුලිවිලිවලට වැටබැඳීමකුයි කරන්නේ. මරණය දකිමින් නින්දට ගියොත්, හෙට දවසේ ඔබ සුවසේ පිබිදේවි. එවිට වඩාත් ප්‍රබෝධයෙන් යුතුව වීර්යෙන් යුතුව දවස අරඹන්න. යහපත් රාත්‍රියක් තුලින් යහපත් දිනයක් උදාකොට ගන්න. මෙවැනි යහපත් රාත්‍රියක් තුලින් යහපත් දිනයක් උදාකොට ගන්න. මෙවැනි යහපත් රාත්‍රියකදී ඔබ මිය ගියහොත් එම මරණයද ශ්‍රේෂ්ඨ මරණයක් වේවි. රූපයන් කෙරෙහි ඡන්දරාගයෙන් සිතුවිලි ගලා එනවාය කියන්නේ මාර සේනාව හඹා එනවාය කියන කාරණයයි. සිතට ඇතිවන සෑම සිතුවිල්ලක්ම මාරයා හැටියට දකින්න. පිංවත් ඔබ දැන් උත්සහ ගන්නේ අද කළ යුතු දෙය අදම කරන්න. රාත්‍රිය උදාවුනාට අද දවස තවම ගෙවී නැහැ. තව කරගන්න ගොඩාක් දේවල් තියෙනවා. අද කළයුතු දෙය අදම කරන්නේ නැතිව හෙට ගැන සිතන්න යන්න එපා. උදෑසන අවදී වූ මොහොතේ පටන්ම නිත්‍ය සංඥාවන්මයි වැඩුවේ. දිනයේ නිත්‍යභාවයෙන් ගත සියළුම සංඥාවන්ගේ අනිත්‍යභාවය නින්දට පෙර මොහොතක් මෙනෙහි කරන්න. අනිත්‍ය සංඥාවෙන් රූපය මෙනෙහි කරන කොට පිංවත් ඔබ අතීතයේ තිබූ රූපය අතීතයේ තිබූ රූපය වර්තමානයේ මට ලැබේවා කියලා ප්‍රර්ථනා කරන්නේ නැහැ. අනාගතයේදී මට මෙවැනි රූපයක් ලැබේවා කියලා ප්‍රර්ථනා කරන්නේ නැහැ. රාත්‍රී නිදි පැදුරේදී තෘෂ්ණාවෙන් බැඳුනු මාරසිතුවිලිවලට ඉඩ නොදී රූපයේ අනිත්‍යභාවය අතීත, වර්තමාන, අනාගත වශයෙන් නුවණින් මෙනෙහි කරන්න. මෙලෙස අනිත්‍ය සංඥාවන් මෙනෙහි කරමින් ඔබ නින්දට ගියොත්, එම රාත්‍රිය පිංවත් ඔබට යහපත් රාත්‍රියක් වේවි. සෑම රාත්‍රියකදීම අතීත පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් අතීතය ගැන සිතිවිලි වලින් බැහැර වන්න. අනාගත පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් අනාගතය ගැන සිතිවිලි වලින් බැහැර වන්න. අතීතය, අනාගතය පිංවත් ඔබට මැකීගොසින් දැන් ඔබ වර්තමානය තුල ජීවත්වෙන්න. වර්තමානය තුලද ඔබ ජීවත්විය යුත්තේ වර්තමානයේද අනිත්‍යභාවය දකිමින්ය. ආශ්වාස ප්‍රාශ්වාසය දෙසට සිහිය පිහිටවීමෙන් අනිත්‍ය වන්න වූ වර්තමානයද පිංවත් ඔබට හොඳින් අරමුණු වනු ඇත.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දවස, කොසොල් රජතුමා මගුල් ඇතු පිට නැගී නගර සංචාරය කරන කොට, නිවසක සිටි රූමත් කාන්තාවක් දැකීමෙන් කාමච්ඡන්දයක් ඇතිවුණා. ඇය දුටු මොහොතේ පටන් ඇයව අයිති කොට ගැනීමේ උපක්‍රමයක් ගැනමයි රජු සිතුවේ. ඇයගේ ස්වාමිපුරුෂයා මරා දමා ඇය අයිති කොට ගැනීමට රජු උපායක් යෙදුවත් ස්වාමිපුරුෂයා මරා දැමීමේ උත්සාහයන් ව්‍යර්ථ වී ගියා. මේ රූමත් කාන්තාව ගැන සිතීම නිසාම රජතුමාට සෑම රාත්‍රියකම නින්ද නොයන අයහපත් රාත්‍රියක් බවටමයි පත් වුනේ. අදාළ කාන්තාව ගැන සිතමින්ම නින්ද නැති දීර්ඝ රාත්‍රියක් ගත කරමින් සිටියදී, එදින රාත්‍රියේදී රජතුමාට බොහෝම නපුරු වේගවත් ශබ්දයක් ඇසුනා. මේ ශබ්දයට රජතුමා ගොඩාක් බිය වුණා. රජතුමා

සැකකලා මේ නපුරු ශබ්දය රජතුමාට, රාජ්‍යයට අනතුරක්ය කියලා. හිමිදිරියේම පුරෝහිත බමුණාව කැඳවලා අදාළ බියකරු සිහිනය ගැන පුරෝහිත බමුණාට දැනුම් දුන්නා. බමුණා ප්‍රකාශ කළේ රජතුමාට ඇසුණු නපුරු ශබ්දය රජතුමාටත්, රාජ්‍යයටත් බරපතල අපලයක් නපුරක් බවත්, වහාම සත්ව යාගයක් සිදු කරලා දෙවියන් සතුටු කරලා මේ අනතුරින් මිදෙන්න පුළුවන්ය කියලා. පුරෝහිත බමුණාගේ මෝඩ අවවාදය හිස මුදුනින් පිළිගන්න රජතුමා සේවකයන්ට නියෝග කළා, යාගයට අවශ්‍ය සතුන් සහ සියළු පුදපිරිකර සූදානම් කරන්න කියලා. යාගයට අවශ්‍ය සතුන් සහ පුදපිරිකර රජ උයනේ ගාල් කරනවා දුටු කොසොල් රජුතුමාගේ මල්ලිකා බිසවගේ පෙරත්තය නිසාම රජතුමා බුදුරජාණන්වහන්සේ බැහැදැකීමට ගොස් තමාට රාත්‍රියේදී අසුන නපුරු ශබ්දය ගැන ප්‍රකාශ කළා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මහරජ ඔබ ඊයේ රාත්‍රියේ බියට පත්කළ ඒ නපුරු ශබ්දය ඔබේ ජීවිතයට හෝ රාජ්‍යයට හෝ අනතුරක්, නපුරක් වන ශබ්දයක් නොවේ. ලොහොකුඹු කියන නිරයෙන් ඉහළට මතු වූ නිරිසතුන් සතර දෙනෙකුගේ වචන උච්චාරණය කිරීමේ හඬයි රජතුමාට රාත්‍රියේදී ඇසී තිබෙන්නේ කියලා. රූමත් අන්සතු කාන්තාවක් කෙරෙහි කාමයෙන් ගිනි ගෙන නිදි සයනේ නින්ද නොමැති අයහපත් රාත්‍රියක් ගත කළ කොසොල් රජතුමාට බුදුරජාණන්වහන්සේ මේ අවාසනාවන්ත නිරිසතුන් හතර දෙනා කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ කාලයේ ජීවත් වුනු ධනවතුන් හතර දෙනෙක්. ඒ කාලයේ මනුෂ්‍යයකුගේ ආයුෂ අවුරුදු විසිදාහක්. මේ ධනවත් තරුණයින් හතර දෙනා කල්පනා කරනවා තමන්ගේ විශාල ධනයට මොනවද කරන්නේ කියලා. දීර්ඝ සාකච්ඡාකින් පසුව මේ තරුණයින් හතර දෙනාම සාමූහිකව තීරණයකට එනවා මේ විශාල ධනයෙන් කාලා බීලා විනෝද වෙලා ජීවත් වෙමුය කියලා. කාශ්‍යප බුදුරජාණන්වහන්සේ මේ කාලයේ ජීවමානව වැඩ සිටියා. මෙමෙ තරුණයින් හතර දෙනාට මස් ඇස හොඳින් පෙනුනාට කල්‍යාණ මිත්‍ර ඇසුර නොලැබුණ නිසාම නුවණැස අන්ධ වෙලායි තිබුණේ. තම විශාල ධනයෙන් මේ අය හොඳට විනෝද වුණා. කාන්තාවන්, මත්වතුර, මස් මාංශ, නැටුම් ගැයුම්, ජීවිතය කොට ගත්තා. ඔවුනගේ මෝහ මූලික මිම්මෙන් ඔවුන් අන්ධ වෙලා සිටියේ. මේ කම් සැප වින්ද මහත්වරු හතර දෙනා මැරිලා ලොහොකුඹු කියන නිරයේ උපදින්නේ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ලොහොකුඹු නිරය යොදුන් හැටක් දිගින් පළලින් යුක්තයි කියලා. මේ ලොහොකුඹු නිරයේ ගින්දරට, ලෝධියට පිච්චෙමින් අවුරුදු පහළොස්දාහක් ගත කොට නිරයේ මතු පිටට පැමිණි මොහොතේ මේ නිරිසතුන් හතර දෙනාගේ මුවින් නික්මුණ වේදනාත්මක වචන වල හඬයි, රජතුමාට රාත්‍රියේදී ඇසිලා රජතුමා බියට පත්වෙලා තිබෙන්නේ කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. මේ නිරිසතුන් හතර දෙනා ලොහොකුඹු නිරයෙන් වසර පහළොස්දාහකට පසුව මතුපිටට පැමිණි මොහොතේම මුවින් එක් වචනයක් ප්‍රකාශකරන මොහොතේම නැවත ලොහොකුඹු නිරයේම ගිලී යනවා. තවත් වසර පහළොස්දාහකින් තමයි නැවත මතුපිටට පැමිණෙන්නේ කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. අනුන්ගේ සැමියන් අයිතිකරගන්න අනුන්ගේ බිරින්දෑවරුන් අයිතිකරගන්න සිහින මවන වර්තමානයේ කාටත් වගේම විනෝදය ජීවිතය කොටගත් කාටත් ඉහත ධනවත් තරුණයන් හතර දෙනාටම වෙච්ච දෙය හොඳ පාඩමක් වෙනවා.

නගර සංචාරය කරනකොට දුටුව අන්සතු කාන්තාවක් අයිතිකොට ගන්න අයහපත් රාත්‍රියක් ගතකරමින් සිටි රජතුමා කාමයේ ආදීනවයන් ඇසීමෙන් අන්සතු ස්ත්‍රිය අයිතිකරගැනීමට තිබූ කැමැත්තෙන් මිදුනා. පිංවත් ඔබගේ කාමාස්වාදය නිසා ලබන කෙටි සැපය නිරයේ මහා ගිනිජාලාවක් වශයෙන් දකින්න. ඔබ ලබන කෙටි වින්දනය කල්ප ගණනක් දීර්ඝ වූ මරණීය අඳෝනාවක් ලෙස දකින්න. කාමච්ඡන්දය නිසාම රාත්‍රිය අපිට බොහෝම දිගු වෙනවා. දීර්ඝ රාත්‍රිවල නින්ද ඈතට යන වේගයෙන්ම හිරි ඔතප් දෙකත් ඈතට යනවා/ සකස්වෙන සිතුවිලි අකුසලයටමයි බරවෙන්නේ. එනිසාම පිංවත් ඔබ සෑම රාත්‍රියකදීම අට්ඨික සංඥාව මෙනෙහි කරමින් නින්දට යන්න. මනසින් ශරීරයේ මස ගලවලා බිමින් තියන්න. ඔබගේ

ශරීරය මාසෙන් තොර ඇටසැකිල්ල සිතෙන් මවාගන්න. ඇටසැකිල්ල සිතෙන් මවාගැනීමට නොහැකි නම් රූප සටහනක, ඡායාරූපයක ඇති ඇටසැකිල්ලක් හොඳින් නිරීක්ෂණය කරන්න. එවිට ඔබට පහසු වේවි ඔබේම ඇටසැකිල්ල සිතෙන් මවා ගන්න. ඔබ කැමතිම ඔබ අකමැතිම ඔබ තුල කාමච්ඡන්දයක් සකස් කරන සෑම රූපයක්ම අට්ඨික සංඥාවෙන් දකින්න. එවිට එම රාත්‍රිය කාමච්ඡන්දයන්ගෙන් තොර යහපත් රාත්‍රියක් වේවි.

මෙය සටහන් තබන වේලාව රාත්‍රී හතට පමණ ඇති. හුදෙකලා කුටිය අවට රාත්‍රී රැහැයියන්ගේ හඬ වේගවත්ව ඇසෙනවා. ලෝකයම මැකී ගොසින්, අනිත්‍ය වූ කායසංස්කාර පමණයි අරමුණු වෙන්නේ. උතුම් ධර්ම මාර්ගයේ යහපත් රාත්‍රියක පෙරනිමිත්තියි මේ අත්දකින්නේ. මේ යහපත් රාත්‍රිය මේ ලෝකයේ කොච්චරනම් මනුෂ්‍යයෝ අයපත් රාත්‍රියක් බවට පත්කොට ගනීවිද. අනාගතයේ නිරයන්හි නිරිසතුන්ගේ ගහණය කොච්චර නම් ඉහළයාවිද. මනුෂ්‍යාගේ නුවණැස අන්ධවෙන කොට මස් වලට තිබෙන වටිනාකම වැඩිවෙනවා. තෘෂ්ණාව විසින් මසට හැඩතල නිර්මාණය කොට දෙනවා. ලස්සන රටා රිද්මයන් ඇති කොට දෙනවා. මේ සියල්ලම සිතුවිල්ලක්ය කියන කාරණය දකින්නේ නැහැ. මස් වලට ලොබ බඳින මිනිස්සු නිරයට වැටුනම ලෝදියෙන්, ගින්දරෙන් මසම පිච්චෙමින් මරණීය වේදනාවන් ලබනවා. මස සතර මහා ධාතුව වශයෙන් දකින්න. එවිට පිංවත් ඔබ මසෙන් හැදුන රූපයෙන් නිදහස්වීමේ දිශාවට ගමන්කරාවි.

ඉහත සිද්ධියේදී කොසොල් රජතුමා කාමගින්නෙන් දැවෙමින් සිටි අයහපත් රාත්‍රියේදී ඇසුණු නපුරු බියකරු ශබ්දය නිසා බියට පත්වෙලා උදේ පාන්දරම පුරෝහිත බමුණා කඳවලා ප්‍රශනය ගැන උපදෙස් ගැනීමේදී , පුරෝහිත බමුණා ප්‍රකාශ කළේ රාත්‍රියේ අසුන නපුරු ශබ්දය රජතුමාට රාජ්‍යයට අනතුරක්, අපලයක් කියන කාරණය. අනතුරෙන් මිදෙන්න මහා සත්ව ඝාතන යාගයක් කරන්න කියලයි යෝජනා කළේ. වර්තමානයේද රූපය නිත්‍යභාවයෙන් ගැනීම නිසාම අයහපත් රාත්‍රීන් නිදි නොලබා ගත කරන මනුෂ්‍යයින්ට නොයෙක් ආකාරයේ නපුරු ශබ්ද අඩනින්දේදී ඇසෙන්න පුළුවන්. එවැනි ශබ්ද ඇසිලා සමහරු බියට පත් වෙන්න පුළුවන්, සිහිනයෙන් කෑගසන්න, උගුර කට වේලිලා වතුර සොයන්න පුළුවන්, නිදි ඇඳෙන් වැටෙන්න පුළුවන්. මෙවැනි තත්ත්වයන් ඇතිවෙනකොට බියට පත්වෙලා වර්තමාන සමාජය හුභාක් දුරට යාගහෝම, පුදපූජා, යන්ත්‍ර මන්ත්‍ර තමයි සිදුකරන්නේ. මේ ක්‍රියාවෙනුත් හරියට මිත්‍යා දෘෂ්ටික පුරෝහිත බමුණා කොසොල් රජතුමාට දුන්න වැරදි උපදේශය වගේමයි. අකුසලය නිසාම තව තවත් අකුසලයට යොමුවෙනවා. ඔබටත් නින්ද නොයන අයහපත් රාත්‍රීන් වලදී මෙවැනි වේදනාත්මක නපුරු හඬක් ඇසුනහොත් ඔබත් තේරුම් ගන්න මොකක් හෝ කුසල් ශක්තියක් නිසාම ඔබට අනතුරු හැඟවීමක් තමයි ලැබුණේ කියලා. අකුසලයෙන් කුසලය දෙසට යොමුවෙන්න කියන අනතුරු හැඟවීම සමහර විට එම හඬක් නිරයෙන් ඇසෙන හඬක් වෙන්න පුළුවන්. එසේත් නැතිනම් විෂම ප්‍රේතයෙක්ගෙන්, අමනුෂ්‍යයෙකුගෙන් නැගෙන වේදනාත්මක හඬක් වෙන්නත් පුළුවන්. වරක් භික්ෂුවක් වනගත ආරණ්‍යයක වැඩසිටින කොට ඉතාමත්ම බිය කරු වේදනාත්මක ලතෝනියක් ඇසුණා. එය හරිම වේගවත්, අශුභ, අමිහිරි, මුසල ලතෝනියක්. එම භික්ෂුවට උතුම් සමාධිය තුළින් පෙනෙනවා විශාල ගසක ඇති දෙබලක්. දෙබලක් කියන්නේ ගසේ ඉහළ හතර පැත්තට අතු බෙදී ගිය තැනක්. මෙම දෙබලේ ලොකු කලගෙඩියක් තරම් කලු මස් කුට්ටියක් භික්ෂුවට දර්ශනය වුනේ. ඇත පය නැති කලු මස් කුට්ටියක් ආකාරයට ඉපිද සිටින නපුරු ප්‍රේතියක් තමයි ඉහත නපුරු වේදනාත්මක හඬ නගන්නේ. එම හඬ කොච්චර වේගවත්ද කියනවනම් එම ප්‍රේතිය ද්වේශයෙන් පුපුරනවා වගෙයි. සමහර විට එම ප්‍රේතිය භික්ෂුව තම සීමාවේ සිටිනවාට විරෝධය දක්වනවා විය හැකිය. මෙවැනි විෂම ප්‍රේතියන් සිල්වතුන්ට අකමැතිය. සිල්වතුන් දකිනකොට ඒ අයව පිච්චෙනවා වගේ සීලයට කුසලයට ඇති විරෝධය නිසා

වෛරයෙන් පුපුරනවා. මෙවැනි බියකරු ශබ්ද සතර අපයේම සත්වයින්ගේ මුවින් නික්මෙන අකුසලයන්ගේ දෝංකාරයන්ය. ඔබට එම ශබ්ද ඇසෙන්නේ හේතුවක් බව නිසාම සිතන්න. ජීවිතය තුලින් කුසල් ධර්මයන් ශක්තිමත් කොට ගන්න. නින්ද නොඑන දීර්ඝ රාත්‍රීවල සිතෙට නැගෙන කාම සිතුවිලි,ද්වේශ සිතුවිලි ඉහත සත්වයින්ගේ විෂම ජීවිත ගැන සිතමින් යටපත් කොට ගන්න. එවිට රාත්‍රියේදී විවේක මනසින් සිතන්න, ගස් දෙබලක් මත ජීවත් වෙන, අතපය නොමැති, කලු මස් කුට්ටියක් වැනි විෂම ප්‍රේතිය එවැනි විෂම උපතකට ඇදදැමුවේ කාමය, ද්වේශය කියන කාරණය බව.

පුද්ගලභාවයෙන් යුතුව, කාමයේ වරදවා හැසිරීමට වඩා මනුෂ්‍යාව කාමය වරදවා හැසිරවීමට, පෙළඹවීම් ඇති කරන පිරිස් ඉන්නවා. නවීන තාක්ෂණික ක්‍රම වේදයන් හරහා මනුෂ්‍යයා කාමාස්වාදයේ ගොදුරු බවට පත් කරන ඉහත පිරිස් බොහෝම ප්‍රවේසම්වෙන්න ඕනේ. වයස් භේදයකින් තොරව, තාක්ෂණික මෙවලම් මනුෂ්‍යයා පංචනීවරණයන්ගේ වහලෙක් බවට පත්කොට තිබෙනවා. තාක්ෂණික මෙවලම් තුලින් මනුෂ්‍යයාට කතා කරන ලෝකය, ලජ්ජා, භිය හීන වී ගිය ලෝකයක්. බුදුරජාණන්වහන්සේගේ කාලයේ නටගාමිණී කියලා තරුණයෙක් සිටියා. එදා දඹදිව සිටිය හොඳම නාට්‍ය ශිල්පියා තමයි නටගාමිණී. බොහෝම කඩවසම් රංගන හැකියාවෙන් පරිපූර්ණ තරුණයෙක්. මේ නටගාමිණී බුදුරජාණන්වහන්සේට ප්‍රකාශ කරනවා මගේ ගුරුවරුන් මට උගන්වලා තියෙන්නේ අපි වගේ මනුෂ්‍යයින්ව විනෝදමත් කරන සතුටු කරන අය මරණින් පසුව පායාස කියන දිව්‍ය ලෝකයේ උපත ලබනවා කියලා. නටගාමිණී එම ප්‍රශ්නය අවශ්‍ය නැහැයි බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනවා. නටගාමිණී දෙවැනි වතාවටත්, තෙවැනි වතාවටත් එම ප්‍රශ්නය බුදුරජාණන්වහන්සේගෙන් විමසා සිටියා. තුන්වැනි වතාවේ බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, නටගාමිණී මනුෂ්‍යයාව කාමච්ඡන්දයට යොමු කරවන ය මරණින් පසුව පායාස කියන නිරයටයි වැටෙන්නේ කියලා. නටගාමිණී කලාකරුවාට ලොකු වැරදීමක් වෙලා තිබුණා. ඔහු සිතාගෙන සිටියේ මනුෂ්‍යයින් විනෝද කරලා විහිළු කරලා කාමච්ඡන්දයන් සකස් කරවල පායාස කියන දිව්‍යතලයට යන්න. නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා පායාසය කියන්නේ දිව්‍යතලයක් නොව නිරයක්ය කියලා. කල්‍යාණමිත්‍ර ඇසුර නොලැබුණ නිසාම නටගාමිණී නිරය සහ දිව්‍යතලය පටලවාගෙන සිටියේ බුදුරජාණන්වහන්සේ දේශනා කළ පායාස නිරය ගැන අහලා නටගාමිණී කලාකරුවා උතුම් පැවිදිභායවට පත් වෙනවා. මෙතෙක් ලෝකයාගේ රසාස්වාදය උදෙසා හැඩ වැඩ කොට ප්‍රදර්ශනය කළ තම සුන්දර රූපය පාංශකුල චීවරයකින් වසා ගන්නවා. කල්‍යාණමිත්‍ර ඇසුර නිසාම පායාස නිරයට වැටෙන්න සිටි මනුෂ්‍යයෙක් ධර්මයේ සැනසීම ලබනවා. ලෝකයේ මනුෂ්‍යා කාමච්ඡන්දයන්ට පොළොඹවන ව්‍යාපාර පුද්ගලයින් වැඩිවන්න වැඩිවන්න නිරයන් අතරින් පායාස නිරයේ ජනගහණය වැඩිවෙනවා. ලෝකයාව රසාස්වාදයෙන් කුල්මත් කරන නෝනා, මහත්වරුන් මිය ගිහින් පායාසයේ අඳුරට වැටෙනවා. එක්තරා භික්ෂුවක් උතුම් සමාධිය තුළින් පායාස නිරය අරමුණු කොට බලනවා. භික්ෂුවට දර්ශනය වෙන්නේ පායාස නිරයේ සිටින නිරිසතුන් ඇටසැකිල්ලක් ලෙසයි පායාස නිරයේ පහළ වෙලා තිබෙන්නේ. ශරීරයේ මස නැහැ. මනුෂ්‍ය ජීවිතයේදී තම ශරීරයේ අඟපසඟ, මස නිත්‍ය වූ සැපයක්, සතුටක් හැටියට ලෝකයාට පෙන්වීම නිසාම, තම අඟපසඟ ලෝකයාගේ කාමාස්වාදය උදෙසා යෙදවීම නිසාම ශරීරයේ හැඩය, වර්ණය, රිද්මය තුලින් ලෝකයාව මුලාවට පත්කිරීම හේතුවෙන්ම පායාස නිරයේ නිරිසතුනට ශරීරයේ මස ලැබිලා නැහැ. ඇටසැකිල්ලක් හැටියටයි උපත ලබන්නේ. අතීත භවයන්හි කල පිංකම් නිසාම, ඔබට ලැබුණු ලස්සන සුන්දර රූපය නිසා තමනුත් මෝහ මූලිකව කාමාස්වාදයන්ගෙන් මත්වී, අන්‍යන්වද මෝහයෙන් මුලා කිරීම නිසාම පායාස නිරයේ නිරිසතුනට ශරීරයේ මස ලැබී නැහැ. වර්තමාන සමාජයේ ටියුෂන් යන දරුවාගේ පටන් වැඩිහිටි ය දක්වාම ශරීර මාංශය හිරකොට, තදකොට ඇඳුම් අන්දවා මසම ලෝකයාට පෙන්වා තමන් කාමච්ඡන්දයන් සකස් කිරීමේ බරපතල අකුසලය නිරතුරුවම සිදුකරගනිමින් පවතිනවා. පිංවත් මනුෂ්‍ය ඔබ ඔබේ ඔය උණුසම් මස අකුසලයට යොමු කලොත්, මස් නැති

ඇටසකිල්ලකුයි පායාස නිරයේදී ලැබෙන්නේ. ඔබ පායාස නිරයේ ඉපදී සිටින ඇටසැකිලි නිරිසතුන් ගැන සිතලා බිය ඇති කරගන්න. පායාස නිරයේ ජීවත්වෙන තවත් එක් නිරිසතෙක් සිටිනවා. ඔහු හම ගැසූ නිරිසතෙක්. ඔබට උදාහරණයක් කියන්නම්. මනුෂ්‍යයෙක් අරගෙන ඔහුගේ මතුපිට සිනිඳු සම ගලවා ඉවත් කරන්න. දැන් ඔබ මනසින් එම සම ගැලවූ ශරීරය මෙනෙහි කරන්න. සියුම් සම පමණක් ගලවා දැමූ මස්, ලේ, නහර මතු වී පෙනෙන ශරීරයක් ඔබට පෙනේවි. මෙන්න මේ නිරිසතාත්, සම ගහපු නිරිසතෙකු වශයෙනුයි පායාස නිරයේ ඉපදී සිටින්නේ. මේ සියළු දෙනාම ගිය ජීවිතයේදී මනුෂ්‍යයාව කාමච්ඡන්දයන්ට යොමු කරපු මහත්වරු නෝනාවරු. මේවා ඔබ කමටහන් කොට ගන්න පිංවත් ඔබ පරිස්සම් වන්න. වර්තමාන සමාජයේ හොඳම අදායම් ලබන ධන උල්පත් බවට පත්වී ඇත්තේ මනුෂ්‍යයාට කාමාස්වාදය ලබාදෙන උපකරණ සහ ව්‍යාපාරයන්මයි. මේ සෑම ව්‍යාපාරයකම අවසාන ඉලක්කය, මනුෂ්‍යයා කෙටි ආශ්වාදයකින් මත්කොට තම අරමුණු ඉටුකර ගැනීමයි. මෙවැනි ව්‍යාපාර වලින් කෝටිගණනින් මුදල් ගොඩගැසූනද එම සල්ලි කොළ අවසානයේ ඔබ පාවඩ එලන්නේ, පායාස නිරයට බවයි බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ. වසර හැත්තෑවක් වැනි කෙටි ජීවිත කාලයක් තුළ, පිංවත් ඔබ නිදි නොලබා වෙහෙස මහන්සි වී ලෝකයාට කාමාස්වාදය ලබාදෙමින් අවසානය සකස්කොට ගන්නේ පායාස නිරයට නම්, තවමත් ඔබ ප්‍රමාද නැහැ. නැවත සිතන්න. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ උතුම් සම්මා සම්බුද්ධ ඥානයෙන් දැකලයි නටගාමිණී තරුණයට පායාස නිරය ගැන දේශනා කරන්නේ. ඉහත යථාර්තය නුවණින් තේරුම් ගෙන, අනුන් කාමස්වාදයේ මත්කරවන ව්‍යාපාරයන්ගෙන් මිදෙන්න. මේ ශරීරය වෙනස් වන දෙයක්. වෙනස් වන දෙයක, සැපයක් ලස්සනක්, රිද්මයක් තිබෙන්නට බැහැ. පිංවත් ඔබ නොදැනුවත්භාවය නිසාම මේ රූපය නිත්‍ය සැපයක් රස්ගුහාවක් ලෙස ලෝකයාට පෙන්නුවොත්, පිංවත් ඔබ අධර්මයයි ලෝකයාට පෙන්වන්නේ. කාම සිතුවිල්ලක් සිතට නැගෙනකොට නිතරම අසුභ සංඥාවන් සිතේ ඇතිකොට ගන්න. පිංවත් ඔබ ඔබ සුන්දරයි කියලා දකින ඔය රූපය තුලින් සේම, සොටු, අසූචි, මුත්‍රා මතුකොට ගන්න. කාමයන්ට බැඳෙන කොට රූපය අසූචි ගොඩක් වශයෙන් දකින්න. ඔබගේ ශරීරය අට්ඨික සංඥාවෙන් දකින්න. අට්ඨික සංඥාව කියන්නේ ඇටසැකිල්ලක් වශයෙන් රූපය දැකීමයි. මනුෂ්‍ය ජීවිතයේදී රූපය වැරදි විදියට ප්‍රයෝජනයට ගත්ත පායාස නිරයේ නිරිසතුනට උපතින්ම ඇටසැකිලි ජීවිතයක් ලැබිලා තියෙන්නේ, අකුසලය විසින්ම මස පිච්චිලා. ඇටසැකිල්ල තිබුණත් එම නිරිසතුන් අට්ඨික සංඥාව කියන්නේ මොකද්ද කියලා දන්නේ නැහැ. පිංවත් ඔබ අට්ඨික සංඥාව පුහුණු කරලා කාමයන්ගේ ආශ්වාදයේ නිසරු බව දැක්කොත් නැවත කවදාවත් පායාස නිරයේ හමගහපු නිරිසතෙක්, ඇටසැකිලි නිරිසතෙක් වෙන්නේ නැහැ. සංස්කාර ඒ තරමටම සාධාරණයි. ආශ්වාදයට වඩා ආදීනවය ගැඹුරු කොට දෙනවා. මේසා ගැඹුරු බියකරු ලෝකයක් අපි ඉදිරියේ තිබියදී සංසාර බිය දකින්නේ නැහැ. මුළු ලෝකයාම වන්දනා කරනා තරු පංතියේ මනුෂ්‍යයෝ, පායාස නිරයට වැටෙනකොට අපිට මොකක් වේවිද කියලා නුවණින් මෙනෙහි කරන්න ඕනේ. මේ සටහන පිංවත් ඔබට සිතන්නයි තැබුවේ. මොකක්ද ඔබ සිතන්න ඕනේ, කාමයන්ගේ බියකරු ආදීනවයමයි සිතන්න ඕනේ. ආශ්වාදයට අතවනන, පාපකාරී සිතුවිලි වලින් බැහැර වෙන්න ඕනේ. එම රාත්‍රී ඔබට යහපත් රාත්‍රියක් වේවි.

ධර්ම සාකච්ඡාවක් අවසානයේදී, පිංවත් කාන්තාවක් ප්‍රශ්නයක් විමසුවා. ස්වාමීන් වහන්ස, මට ගොඩක් ප්‍රශ්න තිබෙනවා. පවුල් ජීවිතයේදී, ස්වාමි පුරුෂයා සමග අඬදබර වෙනවා. දරුවන් අකීකරුයි. ස්වාමිපුරුෂයා මත් වතුර බොනවා, ඥාතීන්ගෙනුත් හොඳක් අහන්න නැහැ. ස්වාමීන්වහන්ස මට ජීවිතය එපා වෙලයි තිබෙන්නේ කියලා. භික්ෂුව ඒ වේලාවේ එම පිංවත් කාන්තාවට මතක් කළේ ඔබ කරපු දෙයයි ලැබිලා තියෙන්නේ. ඒ නිසා ඔබම කරගත්තා වූ දෙයට ඔබ ගැටෙන්න එපාය කියලා. සංසාරේ අපි කල්‍යාණමිත්‍ර ඇසුර නොලැබූ නිසාම ගොඩාක් අකුසල් කරගෙන තිබෙනවා. එම අකුසල් අපිට විපාක දෙනකොට, එම අකුසල් විපාකය අපි නැවත නැවත අකුසල් වැඩෙන දිශාවටමයි යොමු කරගන්නේ.

අතීතයේ ඉසිදාසි කියලා තරුණියක් සිටියා. ඇය සිටුගෙදරක රූමත් සිටුදියණියක්. ඇයට තම දෙමාපියන් සිටුකුල වලින් විවාහ දෙකක් කරලා දෙනවා. විවාහ දෙකම අසාර්ථකයි. මේ අසාර්ථකත්වයට හේතුව ඇය කල්‍යාණමිත්‍ර ඇසුර නිසාම හඳුනාගන්නවා. තමාට ලැබුණු සැමියාගේ වරදක් නොවේ, තමාම සංසාරයේ කලාවූ අකුසලයකුයි මේ විපාක දෙන්නේ කියලා. අසාර්ථක පවුල් ජීවිතය තුළින් ඇය සාර්ථක පැවිදි ජීවිතයට පත් වෙනවා. ඇය උතුම් අරහත් භාවයට පත් වීමට පෙරාතුව ඇයම පූර්වේනිවාසානුස්සති ඥාණයෙන් දකිනවා අතීත භවයන්හිදී තමාම සතුටින් කලා වූ කාමයේ වරදවා හැසිරීමේ අකුසල් විපාකයන්මයි තමන්ව දුකට පත් කළේ කියලා. පිංවත් ඔබ කඳුලක් හෙලන්නේ අතීතයේ ඔබම කාටහරි කඳුලක් දුන්න නිසාමයි. එම නිසා එම කඳුල ළඟ ඔබ නවතින්න. කඳුල ළඟ නවතින්න කියන්නේ, අකුසල් උදෙසා කඳුළුවලට හේතුවෙන තව අකුසල් කරගන්න එපා කියන කාරණයයි. බුදුරජාණන්වහන්සේ කාන්තා විමුක්තිය කියන්නේ, දුකට එරෙහිව සටන් කිරීම නොවේ. පුරුෂාධිපත්‍යයට විරුද්ධව තනිකඩව සිටීමද නොවේ. මේ නූතන කාන්තා විමුක්තිය තුල සැඟවී ඇත්තේ ද්වේශයයි, වෛරයයි. තව තවත් අකුසල් වැඩෙන දිශාවටයි ඔබව අරගෙන යන්නේ. කාන්තා විමුක්තියේ නාමයෙන් පුරුෂාධිපත්‍යයට එරෙහිව අකුසලයේ කඳුළු පෙළගස්වන අසත්පුරුෂ ධර්මයන්ට, පිංවත් කාන්තා ඔබ රැවටෙන්න එපා. පිංවත් ඔබේ පවුල් ජීවිතයේ දුකට හේතුව ඔබම අතීතයේ කරගත්තා වූ අකුසල් බව හඳුනාගෙන කුසලය තුලින්ම සැප සොයන මාර්ගයට අවතීර්ණ වෙන්න. සමාජය තුළ ඉතා වේගයෙන් පවුල් සබඳතා බිඳී දෙදරායනවා. දික්කසාදයන් වැඩිවෙනවා, අසම්මත සම්බධතා වැඩිවෙනවා. අනාගතයේ නවකථා කරුවන්ට තම සිහින නවකථා වලට ගොඩාක් වස්තු බීජයන් සැපයෙනවා. ලෝකය කියන්නේ ගණුදෙනුවක්. කෙනෙකුගේ දුක තවකෙනෙකුන් විකුණනවා. කෙනෙක්ගේ දුක විකුණා තව කෙනෙක් සිනා සේනවා. නැවතීමකින් තොරව මේ ප්‍රශ්නයේ නිමාවක් දකින්න බැහැ. ඒ නිසා දුකට හඬන ඔබ නවතින්න. සද්ධර්මය අභියස ඔබේ සැමියාගෙන් ගුටි කමින් ඔබ සැමියාට මෛත්‍රී කරන්න. සැමියාගේ බැනුම් අසමින් සැමියාට මෛත්‍රී කරන්න. ඥාතීන්ට ගරුකරන්න, ලෝකයාට පෙනෙන්නට නොවේ, නිහඬ ඔබේ හදවතින්. මුලින් සඳහන් කළ ඉසිදාසිය තම ස්වාමිපුරුෂයාගෙන් පීඩාවට පත්වෙන කොට ස්වාමිපුරුෂයින්ට වෛර කරන්න ගියේ නැහැ. ඇය දැනගත්තා අනුන්ට වෛර කිරීම තමන්ට වෛර කිරීමක් බව. පිංවත් ඔබත් සද්ධර්මයේම සෙවණට එන්න, අසද්ධර්මයේ ගුටි බැට වලට එරෙහිව. අකුසල් සංස්කාරයන්ගේ බියකරුභාවය සහ අතීත කාමයේ වරදවා හැසිරීමේ වැරදි වල විපාකයන් හොඳින් නුවණින් මෙනෙහි කොට සම්මත විවාහයෙන් පීඩාවට පත්වෙනකොට අසම්මත සම්බන්ධතාවයන්ට යොමු වෙන්න එපා. එය තවත් කඳුළු ගංගාවක ආරම්භයක්ම වේවි. යම් පින්වතෙක් තම පවුල් ජීවිතයේදී දුකට පත්වෙනවා නම්, එය තමා පෙර ජීවිතයේ කරගත් කාමයේ වරදවා හැසිරීමේ අකුසල් විපාකයන් බවම දකින්න. වෙන ක්‍රමයකින් මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලැබෙන්නේ නැහැ. පිංවත් ඔබ රාත්‍රී නින්දට යනකොට දවස පුරාවටම ඔබට ස්වාමිපුරුෂයාගෙන්, දරුවන්ගෙන්, බිරියගෙන් ලැබුණු සිත් වේදනාවන් විදර්ශනා නුවණින් දකිමින් නින්දට යන්න. ස්වාමිපුරුෂයා කියන්නේ මෙවැනි දුකක් නම්, මේ භව ගමනේ තමා ලබනා අවසාන ස්වාමිපුරුෂයා මොහු බව දකිමින් නින්දට යන්න. බිරිඳ කියන්නේ මෙවැනි දුකක් නම්, තමා මේ භව ගමනේ ලබන අවසාන බිරිඳ ඇය බව දකිමින් නින්දට යන්න. දරුවා කියන්නේ දෙමාපියන්ට මෙවැනි දුකක් නම්, මේ භව ගමනේදී තමන් ලබනා අවසාන දරුවා බව දකිමින් නින්දට යන්න. දුකට හේතුවන රූපය කෙරෙහි අවබෝධයෙන් කලකිරීම ඇති කොටගන්න. සංසාරයන් පුරාවට පැමිණි ගමනේදී, ස්වාමිපුරුෂයින් බිරින්දෑවරුන් දරුවන් උදෙසා ඔබ හෙළූ මහා සාගරයේ ජලය ප්‍රමාණය කොට දකින්න. මේ ජීවිතයේදී තවත් කඳුළු බාල්දි කිහිපයක් එම කඳුළු සාගරයට එකතු කොට මිය යන අවාසනාවන්තයෙක් නොවන්න. විදර්ශනා නුවණින් සංස්කාරයන්ගේ යථා ස්වභාවය දකිමින් රාත්‍රී නින්දට යන්න. අවබෝධයෙන්ම දුක හඳුනාගෙන, දුකට හේතුවන අකුසලයන්ගෙන් මිදෙන

දිශාවටම යොමුවන්න. ඔබ විසින්ම ඇති කොටගත් ප්‍රශ්නය, ඔබ විසින්ම විසඳා ගතයුතු බව සිහිනුවණින් දකින්න. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ඔබෙන් බලාපොරොත්තු වන යහපත් රාත්‍රියක සැබෑම අර්ථය, ගිනිගත් ලෝකය තුලින් මතුකොට ගෙන, හෙට උදාවෙන දවස අකුසල් නොවැඩෙන සද්ධර්මයේ අර්ථයන් වැඩෙන දිනයක් බවට පත්කොට ගන්න පිංවත් ඔබ දක්ෂ වෙන්න. පවුල් දිවියේ කොතෙක් ප්‍රශ්න තිබුණද පිංවත් ඔබ බිරිඳට ස්වාමි පුරුෂයාට, දරුවන්ට යුතුකම් හොඳින් ඉටුකරන චරිතයක් වෙන්න. යුතුකමක් කුසලයක් බවට පත්කොට ගන්න ඔබ දක්ෂ වෙන්න. සංස්කාරයන් නිසාම ලැබුණු දෙය සංස්කාරයන්ගේ නිරෝධය උදෙසාම ප්‍රයෝජනයනට ගන්න දක්ෂ වෙන්න. දුක සඟවාගෙන ලෝකය ඉදිරියේ සිනාසීමට උත්සහ නොකරන්න. දුකට හේතුව හඳුනාගෙන දුකෙන් මිදෙන්න. දුක සඟවාගෙන ඔබ ලෝකය ඉදිරියේ සිනාසීමට ගියහොත් ඒ ඔබ සිනාසෙන්නේ ඔබගේම දුකට බව, ඔබම තේරුම් ගත යුතුයි. යහපත් රාත්‍රියක් නැමැති සටහන සටහන් තබන කොට අම්ම කෙනෙක් වේදනාවෙන් හඬමින් නැගු ප්‍රශ්නයක් මතකයට පැමිණියා. අම්මාගේ කඳුලක් කියන්නේ ගින්දරක්. අම්මාගේ කඳුල ගින්දරක් වෙන්නේ ඒ කඳුළු ගලන්නේ අම්මාගේ හදවතේ තිබෙන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා කියන ගුණයන් උණු කර ගෙන. මේ උතුම් බ්‍රහ්ම ගුණයන් උණුකරගෙන ගලන අම්මාගේ කඳුළු ගින්දරක්මයි. මනුෂ්‍යත්වය කවදාවත් හඬවන්න එපා. ඒ කඳුළු වලට ඔබ පිච්චෙන්නවාමයි. අම්මාව සතුටු කරලා බිරිඳව සතුටු කරලා ඇගේ නෙතින් සතුටු කඳුළු ගලන කොට එම සතුටු කඳුළු මල් වැස්සක් සේ දකින්න. ඒ වසින මල් වැස්සට ඔබ තෙමෙන්න. මවකගේ බිරිඳකගේ නෙතින් ගලනා ඒ මල් වැස්සමයි ඔබට සුගතියට පාර පෙන්වන්නේ. ඔබ ඉදිරියේ සිටින ඔබේ බිරිඳ සංස්සාරයේදී ඔබට දස දහස් වාරයක් අම්ම වී සිටින්නට ඇතැයි ඔබ සිතන්න. ඔබ ඉදිරියේ සිටින ඔබේ ස්වාමි පුරුෂයා සංසාරයේ ඔබට දස දහස් වාරයක් ඔබේ පියාව සිටින්නට ඇතැයි සිතන්න. එම නිසා පිංවත් ඔබ පවුල් ජීවිතයේ නාමයෙන්ම ඔබේම අම්මා, තාත්තා සමග සසන්ඩු වෙන්න එපා.

මෙය සටහන් තබන භික්ෂුව ගිහිකාලයේ අම්මාව සතුටු කරලා අම්මාගේ නෙතින් සතුටු කඳුළු ගලන කොට ඒ සතුටු කඳුළු නැමැති මල් වැස්සේ හොඳින් තෙමුණ කෙනෙක්. මේ සටහන් ලියන්නට භික්ෂුවට ශක්තිය දුන්නේ ඒ අම්මාගේ නෙතින් ගැලූ සතුටු කඳුළුමයි. අම්මාගේ සතුටු කඳුලක තව කෙනෙකුගේ දුක නිවාදමන්න පුළුවන් තරම් ශක්තියක්, සිසිලසක් මුසුවී තිබෙනවා. එවන් උතුම් ගුණයන් පිංවත් ඔබ හඬවන්න එපා.

භික්ෂුව ධර්ම සාකච්ඡාවකට සහභාගිවන අවස්ථාවක එක් පිංවත් තරුණයෙක්, චතුරාර්ය සත්‍ය ධර්මයන් ගැන ප්‍රශ්නයක් විමසුවා. බුදුරජාණන්වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය පැහැදිලි කොට ඇති ආකාරයට බොහෝම කරුණාවෙන් භික්ෂුව, එම මහත්මයාට එම ධර්ම කාරණය පැහැදිලි කොට දුන්නා. භික්ෂුව එම ධර්ම කාරණය නිරවුල්ව පැහැදිලි කොට දුන්නත්, එම තරුණ මහතා පිළිතුර නොතේරෙන බව කියමින් නැවත නැවත එම ප්‍රශ්නය විමසා සිටියා. ඒ වේලාවේ භික්ෂුව තේරුම් ගත්තා, මේ මහත්මයාට අවශ්‍ය චතුරාර්ය සත්‍ය දැනගැනීමට නොව, එකම කරුණ භික්ෂුවගෙන් නැවත නැවත විමසලා භික්ෂුව ගැටෙන ස්වභාවයෙන් කේන්තිගන්න ස්වභාවයෙන් සිටිනවාද යන්න දැනගැනීමය කියලා. එම මහත්මයාගේ අරමුණ ඉටු වුණේ නැහැ. නමුත් මෝහය නිසාම, අනාගතයේ විපාකය පිණිස, ගොඩාක් අකුසල් ඔහු රැස්කොට ගත්තා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා උතුම් සද්ධර්මයට, උවමනාවෙන්ම වක් සිතින් අගෞරව කරන්නා රැහැනින් බැඳ, වාදක බෙර හඬවා නුවරට ගෙන ගොස් හිස ගසා මරා දැමීම යම් සේ දුකක්ද මතුභවයේදී ඊටත් වඩා අතිශය දුකක් විඳිනවා කියලා. එම නිසාම සද්ධර්මයත් සමග භික්ෂු, භික්ෂුණි, උපාසක , උපාසිකාවන් සමග කටයුතු කිරීමේදී අපි බොහෝම පරිස්සම් වෙන්න ඕනේ. අනුන්ව

පරික්ෂා කිරීමට පෙරාතුව තමා තමාට දුක පිණිස හේතු වෙනවාද කියලා. එසේ නොවුනහොත් අපි දුක දෙසටමයි ගමන් කරන්නේ.

ලෝකයේ අර්ථය කියන්නේ දුක. දුක කියන්නේ තෘෂ්ණාවේ ඵලය. රූපය කෙරෙහි විඳීමේ බැසගැනීමේ ප්‍රමාණයටයි, දුක නිර්මාණය වෙන්නේ. ලෝකය සංකීර්ණ වෙන්න සංකීර්ණ වෙන්න, දුක වැඩිවෙනවාය කියන්නේ, ලෝකය සංකීර්ණ කරන්නේ මනුෂ්‍යයාගේ තෘෂ්ණාව නිසා. ලෝකය සංකීර්ණ වෙනවා නම්, මනුෂ්‍යයාගේ දුකත් වැඩිවෙනවා නම්, එහි අර්ථය මනුෂ්‍යයා දුකෙන් මිදෙන සැපය අත්කරදෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් බැහැරට යනවාය කියන කාරණයයි. මේ අර්ථය තුළ ඉඳලයි, පිංවත් ඔබ වර්තමානය විග්‍රහයට ලක්කොට ගන්න ඕනේ. පිංවත් මහත්මයෙක් ධර්ම සාකච්ඡාවකදී ප්‍රශ්නයක් ඇසුවා ස්වාමීන් වහන්ස වර්තමාන සමාජයේ ධර්මයේ මහා පිබිදීමක් තිබෙනවා. එම පිබිදීම නැවත ආපස්සට නොයන පිබිදීමක් කියලා. පිංවත් ඔබ මේ මාර සිතුවිල්ලට රැවටෙන්න එපා. මේ මොහොතේ ලෝකයේ සද්ධර්මයේ මහා පිබිදීමක් තිබෙනවා නම්, එය නිවීයාමට ආසන්න පහනක, නැගෙන ප්‍රභාශ්වර ආලෝකය හා සමානයි. පහන ඉතාමත් ඉක්මනින් නිවීයනවාය කියන සංඥාවයි. ඔබට මේ පෙනෙන්නේ නිවීයාමට ආසන්න සද්ධර්මය නැමැති පහනේ, මේ නැගෙන ප්‍රභාශ්වර ආලෝකය. පිංවත් ඔබට බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ "අප්‍රමාදී බව" කියන වචනයේ අර්ථයයි මතුකොට දක්වන්නේ. එක්තරා උගත් මහත්මයෙක් ප්‍රකාශකරලා තිබුණා, තව වසර සියයක් ගියහම ලෝකයේ ඉතිරි වෙන්නේ බුදුදහම පමණයි කියලා. ඉහත කාරණය දායක මහත්මයෙක්ගෙන් තමයි දැනගන්නට ලැබුනේ. ඉහත අදහස ප්‍රකාශ කරන මහත්මයා සම්මාදිට්ඨියට පත්වෙච්ච මහත්මයෙක් නොවේ. එතුමා දන්නේ නැහැ ශ්‍රද්ධාව කියන වචනයේ සැබෑ අර්ථය. සම්මා සම්බුද්ධ ශාසනයක සංදිට්ඨිකභාවය ආරක්ෂා කරදෙන ප්‍රාතිමෝක්ෂ සීලය ගැන එම මහත්වරු ලබා දෙන මාර සහතික වලට පිංවත් ඔබ විශ්වාසය ඇති කොට ගන්න එපා. මෙවැනි මහත්වරුන් ශාසනය හැටියට දකින්නේ පන්සල, ආරණ්‍ය, පිංකම්, වෙසක් තොරණ, ලෝක බෞද්ධ සම්මේලන. මහායාන ක්‍රමවේදයන්, මේවා තව තව මනුෂ්‍යයාගේ ආශ්වාදයන් වැඩෙන දිශාවට විකාශනය වෙමින් කාසාය කණ්ඨකලාගේ කාලය දක්වාම ඉදිරියට යනවා. ඒ දියුණුව ගැන කිසිම තර්කයක් නැහැ. මේවා ධර්මයේ අරටුව නොවේ. ධර්මයේ අතු රිකිලියි, සද්ධර්මයේ අරටුව කියන්නේ ආරය අෂ්ටාංගික මාර්ගය, චතුරාර්ය සත්‍ය සතර සතිපට්ඨානය, පටිච්චසමුප්පාදය, පංචඋපාදනස්කන්ධය, සප්ත බොජ්ජංග මේවායි ධර්මයේ අරටුව වෙන්නේ. මේ ධර්මයේ අරටුව විනාශ කොට ගෙනයි, සමාජය ඉදිරියට ගමන් කරන්නේ. ධර්මයේ සංදිට්ඨික ගුණය අතු රිකිළි වර්ණනා කරන ලෝකයක් ඉදිරියටයි ඔබ ගමන් කරන්නේ. මෙතැනදී ඔබ සප්ත බොජ්ජංග ධර්මයන් තුලින් නොවේ, සද්ධර්මයේ සැපය ලබන්නේ. පංචනීවරණයන් තුලින්මයි ආශ්වාදය බලාපොරොත්තු වන්නේ. භික්ෂුව පිණ්ඩපාතයේ වඩින කොට රබර් කිරි කැපීම ජීවිකාව කොට ගත් කුඩා නිවසක් ඉදිරියට වැඩ සිටියා. නිවසේ සිටිය පිංවත් කාන්තාව පිණ්ඩපාතය පූජා කරලා භික්ෂුව පිංඅනුමෝදන් කොට ඉවතට වඩින කොට භික්ෂුවට ඇසෙනවා එම පිංවත් කාන්තාව තමා අසල සිටි මහත්මයාට කියනවා ඒ හාමුදුරුවෝ බොහෝම හොඳයි නේද කියලා. ඒ වචන පෙළ ඇසෙන කොටම භික්ෂුවට එක පාරට මතක් වුණේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේවයි. එම පිංවත් කාන්තාවගේ මුවින් නිමවුණු ඒ ගෞරව පූර්වක වචන පෙළ, ඒ මොහොතේම බුදුරජාණන්වහන්සේටයි භික්ෂුව පූජා කළේ. මේ භික්ෂු ජීවිතයේදී යම් සත්වයෙක්ගෙන් භික්ෂුවට එක වචනයකින් හෝ, එක ඉරියව්වකින් හෝ, ගෞරවයකින්, ප්‍රශංසාවක් භික්ෂුවට ලැබුනොත් එම ගෞරවය බුදුරජාණන්වහන්සේටමයි අයිති වෙන්නේ. බුදුරජාණන්වහන්සේමයි එම ගෞරවය ලබන තැනට අපට පාර පෙන්නුවේ. එම ගෞරවයෙන් එක දශමයක්වත් භික්ෂුවට අවශ්‍ය නැහැ. එහි සැබෑම හිමිකරු බුදුරජාණන්වහන්සේමයි. දායක පින්වතුන් අපිට අර්ථවත්ව "හොඳයි" කියන තැනට එන්න බුදුරජාණන්වහන්සේ අපිට මොන තරම් විනය කාරණා පනවලා, අනුශාසනා කරලා තිබෙනවාද.

බුදුරජාණන්වහන්සේගේ ධම්ම දායාද සූත්‍රයේදී දේශනා කරනවා, ශ්‍රාවක ස්වාමීන්වහන්සේලාට ඔබලා සද්ධර්මයට දායක වෙන්න. ඔබලා ශීලයට, සමාධියට, ප්‍රඥාවට දායක වෙන්න. මේ ධර්මයේ සැබෑ හිමිකරුවෙක් වෙන්න. ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා වලට යටත්වෙන්න, ගිජුවෙන්න එපා. මා තුල ඔබලා කෙරෙහි මහානුකම්පාවක් තිබෙනවා. ඒ නිසාමයි ඔබලාට මෙතරම් අවවාද කරන්නේ. ඔබලා ධර්මයට දායාද නොවුනහොත්, මිනිසුන් ඔබලාට චෝදනා කරාවි. නිගරු කරාවි, සද්ධර්මයේ උරුමය ඔබලාට නැහැයි කියලා. එහෙම වුනොත් මිනිසුන්, ශාස්තෘන්වහන්සේ වන මටත්, චෝදනා කරාවි, අගෞරවව වන ආකාරයට හැසිරෙන්න එපා. ශාස්තෘන්වහන්සේ සදහම් සුවයෙන් වැඩසිටියදී ශ්‍රාවකයින් එසේ කරන්නේ නැහැය කියලා, මිනිසුන් චෝදනා කරාවි. සද්ධර්මයේ වටිනාකම, චිත්ත සමාධියේ වටිනාකම නැතිකොට දමනවා කියලා චෝදනා කරාවි. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා යම් භික්ෂුවක් සිව්පසය ගොඩගසාගන්නේ නැතිනම් ධර්මයේ වටිනාකම හැල්ලුකරන්නේ නැතිනම්, චිත්ත දියුණුව අඩාලකරගන්නේ නැතිනම්, එවිට එම භික්ෂුව දෙව් මිනිසුන් අතර ප්‍රශංසාවට ලක්වෙනවා කියලා. එවිටයි ශ්‍රාවකයා ශාස්තෘන්වහන්සේට නිගරු නොකලා වෙන්නේ. බුදුරජාණන්වහන්සේගේ ඉහත අවවාදය තුළ සියුම් අර්ථයක් සැඟවිලා තිබෙනවා. එම සැඟවුන අර්ථය ගෞරවනීය ස්වාමීන්වහන්සේලා මතුකොට ගත යුතුයි. ස්වාමීන්වහන්සේලා ප්‍රාතිමෝක්ෂ ශීලයෙන් දුර්වල වුනොත් ගිහි පිංවතුන් ස්වාමීන් වහන්සේලාට අවවාද කිරීමට පෙළඹීමේ තැනට පත්වීමේ අනතුරක් එහි අර්ථය තුළ තිබෙනවා. බුදුරජාණන්වහන්සේ එම අනතුර දැකලයි ශ්‍රාවකයන්ට සද්ධර්මය දායාද කොට ජීවත්වෙන්න කියලා ධර්මදායාද සූත්‍රයේදී දේශනා කරන්නේ.

මනුෂ්‍යයාට ගොඩාක් එල ප්‍රයෝජන තිබෙන ගින්දර බොහෝම පරිස්සමෙන්, පරිහරණය කරන්න ඕනේ වගේම පින කියන කාරණය අපි බොහොම පරිහරණය කරන්න ඕනේ. ගින්දර යම් සේ මනුෂ්‍යයාට අත්‍යවශ්‍යද, පිනද මනුෂ්‍යයාට අත්‍යවශ්‍ය සාධකයකි. පරණිම්මිත වසවර්තිය කියන දිව්‍යථලය, වසවර්ති මාර පුත්‍රයාට අයත් දිව්‍යතලයයි. මෙම දිව්‍යතලයේ දිව්‍යසැප කොතරම්ද කියනවා නම් මනුෂ්‍ය ලෝකයේ අවුරුදු දෙදහක් එම දිව්‍යතලයට එක දවසක් කියලයි, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මෙසා අසිරිමත් අති දීර්ඝකාලීන සැපයක් බුක්ති විඳින පරණිම්මිත වසවර්තියේ බහුතරයක් දෙවිවරු සද්ධර්මයට ප්‍රියනැහැ. ඔවුන්ගේ ශබ්ද කෝෂයේ තිබෙන එකම වචනය, කාමයේ ආශ්වාදයයි. පෙර පින නිසාම ආදීනවය ඉක්මනින් ප්‍රකට වෙන්නේ නැහැ. අතීත පින්වල ශක්තිය විසින්ම ආශ්වාදයත්, ආදීනවයත් අතර තිබෙන පරතරය වැඩිකොට තිබෙනවා. පිනේ ශක්තිමත්භාවය විසින් ඇතිකරන්නා වූ ආශ්වාදය, හේතුවෙන් සකස් වෙන ආදීනවය ප්‍රමාද කිරීම හේතුවෙන් එම දිව්‍යතලයේ දෙවියන් තව තවත් ප්‍රමාදභාවයටමයි පත්වෙන්නේ. ආදීනවය ප්‍රමාදවීම හේතුවෙන් තමන් කරනා ක්‍රියාවේ හරි වැරැුද්ද දකින්න, එම දෙවියන්ට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා ලොව්තුරා බුදුරජාණන් වහන්සේට මොනතරම් බාධාවන් සිදු කලාද, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධකොට ගත් මොහොතේ මාරයා ඇඩිව ප්‍රකාශ කරනවා. දැන් ඔබ වහන්සේ අවශ්‍ය කාරණය ඉටුකර ගත්තා. දැන් ඉතින් පිරිනිවන් පාන්නටය කියලා. ඒ වේලාවේ බුදුරජාණන් වහන්සේ පවිටු මාරයාට ප්‍රකාශ කරනවා මාරය ඔබ කී ආකාරයට මම පිරිනිවන්පාන්න සූදානම් නැහැ. මාගේ ශ්‍රාවකයින්, ධර්මධර, විනයධර ව්‍යක්ත වෙනතුරු අනුශාසනා කරන තුරු ධර්මය පතුරුවන තුරු, ධර්මයේ අර්ථයන් මතුකොට පෙන්වන තුරු මම පිරිනිවන් පාන්නේ නැහැය කියලා. බුදුරජාණන් වහන්සේගේ සිංහ නාදය සමඟ මාරයා පසුබැස යනවා. ඒ වගේම බුදුරජාණන් වහන්සේගේ ආයුසංස්කාරය අතහරින මොහොතේදී ද, ඉහත කාරණා නැවත මතක්කොට දී පිරිනිවන් පාන්නට යැයි කියලා බලකෙරුවා. ඔබ වහන්සේ ජය ශ්‍රී මහා බෝධි මූලයේදී දේශනා කල කරුණු කාරණා දැන් සියල්ල පරිපූර්ණයි, ඔබ වහන්සේ දැන් පිරිනිවන් පාන්නටය කියලා. පවිටු මාරයා ඔබ කලබල වෙන්න

අවශ්‍ය නැහැ තව නොබෝ දිනකින් මා පිරිනිවන් පාන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේට මේසා බලවත් තර්ජන බලපෑම් කරමින් මාරයා සහ මාර පිරිවර අකුසල් සිදුකර ගනිත්දීත් මාරයා තුල කාමයේ ආශ්වාදයමයි මතුවී එන්නේ. අතීත පිනේ ශක්තිය නිසා ආදීනවය මතුකොට පෙන්වන්නේ නැහැ. පින ගින්දරක්ය කියන කාරණය මුලින්ම සඳහන් කලේ ඒ නිසාමයි. නමුත් අනාගතයේදී යම් දවසක වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා පින පිරිහිමට පත්වී සතර අපායට වැටුනොත්, ඔහු ආශ්වාදයෙන් මත්වී කරගත් සියළුම ප්‍රබල අකුසල් නිසා කල්ප ගණන් නිරයෙහි දුකට වැටීමට ඔහුට අනිවාර්යෙන්ම සිදුවෙනවා. සද්ධර්මයේ සැබෑම අර්ථයන්ගෙන් මනුෂ්‍යයා ඈතට යන කොට ආමිසයට බර වූ පිංකම් තමයි මුල් තැනට එන්නේ. එවිට සමාජය තුලින් ධර්මයේ අර්ථයන් ගිලිහී යනවා. පිංකම් තුලින් ආශ්වාදයයි බලාපොරොත්තු වෙන්නේ. මෙන්න මේ ආශ්වාදය කියන ඵලය සෑම මොහොතකම අනිත්‍යයි කියලා දකින්න ඔබ දක්ෂවෙන්න. ආමිස පූජාවන්ගෙන් අපි ලබන ඵලය සෑම විටම නිත්‍ය සංඥාවන්ටයි අපිව යොමු කරන්නේ. පිංකම් සිදුකරනකොට සමාජයෙන් කීර්ති, ප්‍රශංසා, ගරු බුහුමන් ලැබෙනවා. ලකුණු ලබන ලකුණු එකතු කරන ගමනකුයි අපි යන්නේ. ලකුණු වැඩිවෙන කොට මමත්වයේ දැඩිභාවයයි වර්ධනය වෙන්නේ. භික්ෂුව දන්න වැඩිහිටි මහත්මයෙක් සිටියා. මොහු ඉතාමත් කැමැත්තෙන් උවමනාවෙන් පිංකම් විශාල ප්‍රමාණයක් සිදුකරගත්තා. මේ පිංකම් වල ඵලය නිසාම මොහුගේ ජීවිතයට කීර්ති, ප්‍රශංසා වේගයෙන් ගලාගෙන පැමිණියා. සමහර විට පිංවත් එම මහත්මයාට ඒවා දරාගන්න බැරිව ගියා. මේ අනිත්‍ය භාවයට පත් වෙන ලෞකික ආශ්වාදයන් මේ මහත්මයාම මොනතරම් මුලාවට පත් කලාද කියනවා නම්, ඔහුට හොඳ නරක පහදා දුන් කල්‍යාණමිත්‍රයාගේ අවවාදයන් අභිබවායන්න, එම පිංවත් මහත්මයා යොමුවුණා. බලන්න පින කියන කාරණය අර්ථවත්ව ජීවිතයට ගලපා නොගතහොත් එහි ඇති අනතුරුදායක භාවය විදර්ශනා නුවණ අපෙන් ඈත් කරන අධිමානය කියන කාරණය ආමිසය තුළ සැඟවී තිබෙන්න පුළුවන්. පින බලවත් වෙනකොට ඔබ ලබන ආශ්වාදයේ ශක්තිමත් භාවය නිසාම ආදීනවය ප්‍රකට වෙන්න ප්‍රමාද වෙනවා. එම නිසාම පින නිසා ලැබෙන ආයුෂ, වර්ණ. සැප, බලය, ගින්දරක් වශයෙන් දකින්න. එවිට පින කියන කාරණය ප්‍රඥාව උදෙසා සැබෑම ආයෝජනයක් කරගැනීමට ඔබට පුළුවන්. කාලය වේගයෙන් ගෙවී යනවා. ඒ වේගයෙන්ම ලෝකය දුශ්ශීල භාවයට පත් වෙනවා. ආමිසය කෙරෙහි මනුෂ්‍යයා බැඳෙන කොට සැපය, බලය, වර්ණය මනුෂ්‍යයා තුල වැඩෙනවා. ඒ හේතුවෙන් සැපය, බලය, වර්ණය තව තව වැඩි කර ගැනීමේ තෘෂ්ණාව ඇති වෙනවා. මුල් අදියරේදී පිංකම් තුලින් ලබාගත් වර්ණය, සැපය, බලය දෙවැනි අදියරේදී ලෝභ, ද්වේශ, මෝහ, අකුසල් මූලයන් තුලින් ලබාගැනීමටයි උත්සහ ගන්නේ. මෙම බියකරු අනතුර නුවණින් දකිමින් ඔබ කරගත් පිංකම් වල ආශ්වාදයේ අනිත්‍යභාවය සිහිපත් කරමින් රාත්‍රී නින්දට යන්න. එවිට එම රාත්‍රිට යහපත් රාත්‍රියක් වේවි.

තරුණියක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා. ස්වාමීන් වහන්ස දිව්‍ය ලෝකයට ගිහිල්ලා පින් සිදුකරගන්න පුළුවන්ද කියලා. මේ ප්‍රශ්නයට සුලභව පිළිතුර නම් පුළුවන් කියලයි. නමුත් භික්ෂුව ඇයට ප්‍රකාශ කළේ දිව්‍යලෝකයට ගිහිල්ලා පින්සිදු කරගැනීම ඉතාමත් අසීරු කරුණක් බවයි. පින කියන කාරණයේ ඵලය තමයි දෙවියා කියන කාරණය. දිව්‍යතලවල ජීවත් වන, මාර්ගඵල ලාභී නොවන දෙවිවරු දිව්‍යලෝකයේ ඇති කාම සම්පත් නිසාම කාමයේ ආශ්වාදය තුළමයි ජීවත් වෙන්නේ. පිනේ බලවත් භාවය නිසා ආදීනවය මතුකොට පෙන්වන්නේ නැහැ. දෙවියා කියන්නේ මනුෂ්‍යයා වගේ රැකීරක්ෂා කරගෙන උයාපිහාගෙන කන කෙනෙක් නොවේ. පින නිසාම සිතූ සිතූ සම්පත් පහළ කොට ගත් කෙනෙක්. කාමයන්ගේ අනිත්‍ය භාවය දැකීමට දෙවියාට පංචඋපාදාස්කන්ධයේ අනිත්‍යභාවය වැඩිලා නැහැ. එම නිසා දෙවියන් කාමයේ ආශ්වාද තුලමයි ජීවත් වෙන්නේ. පින නිසාම කාම පුරයක ජීවත් වන දෙවියා කෙසේ නම් ධර්මයන් ගැන සිතන්නද. ලෝකය සෑම දාම එකම විදිහට තිබෙන්නේ නැහැ. හේතුඵල

ධර්මයන්ට අනුව කරුණු කාරණා ගලපා ගන්න අවශ්‍යයි. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින කාලයක නම් ඉහත තත්ත්වය වෙනස් වෙනවා. බුදුරජාණන් වහන්සේ සහ එර්දිමත් රහතන් වහන්සේලා දිව්‍යතලයට වැඩම කොට දෙවියන්ට සද්ධර්මයේ දේශනාකොට දස දහස් ගණන් දෙවියන් ධර්මය අවබෝධකොට ගන්නවා. බුදුරජාණන් වහන්සේගේ දෙතිස්මහා පුරුෂලක්ෂණයන් දැකලා අයෝම්ය ප්‍රාතිහාර්ය ශක්තිය දැකලා සද්ධර්මය ශ්‍රවණය කරලා ධර්මය අවබෝධ කර ගන්නවා. නමුත් ඒ දෙය වර්තමානයට ගැළපෙන්නේ නැහැ. හේතුඵල ධර්මයන්ට අනුවයි ප්‍රශ්නය දෙස බැලිය යුතු වන්නේ, අතීතයේ වෙච්ච දෙය වර්තමානයේත් වෙනවාය කියලා සිතුවොත් අපි මුලාවට පත්වෙනවා. උදාහරණයක් ගන්නකෝ, මේ මනුෂ්‍යලෝකයේ පිංවත් මනුෂ්‍යයින්ට ගෞරවනීය ස්වාමීන්වහන්සේලා මොන තරම් නම් ධර්මය දේශනා කරනවාද, මොන තරම් පන්සල් ආරණ්‍යය තිබෙනවාද කොතෙක් මහා සංඝරත්නය වැඩ සිටිනවාද මොනතරම් ශීලමය, දානමය, පිංකම් සිදුවෙනවාද, එහෙත් අර්ථවත්ව ධර්මාවබෝධය ලබන අය මොනතරම් සීමිතද, රුකිරක්ෂා කරලා වෙහෙස මහන්සි වෙලා ගෙවල් දොරවල් හදලා, දරුමුණුපුරන් හදලා කාමයේ ආදීනවයන් මෙතරම් හොඳින් ප්‍රකටව පෙනිලත් මනුෂ්‍යයා ධර්මයෙන් බැහැරව යන කොට, පින නිසාම ඉබේම සිතු සිතු සම්පත් ලබන දෙවියා කාම පුරයක ජීවත් වෙන දෙවියා කෙසේ නම් කුසල් දහම් දියුණු කොට ගන්නද. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බැහැදැකීමට දිව්‍ය ලෝකයන්ට අධිපති ශක්‍ර දෙවියා පැමිණි සැම මොහොතකම බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කරන්නේ, භාග්‍යවතුන් වහන්ස, දෙවියන් වන අපිට ගොඩාක් රාජකාරි තියෙනවා. ඒ නිසා ඉක්මන් කොට යන්න ඕනේ කියලා. ලෝභ, ද්වේශ, මෝහය නිසාම දෙවියන් අතරත් ගැටුම් ප්‍රශ්න තිබෙනවා. සමහර දෙවියන් සන්ඩු වෙනවා. සමහර දෙවියෝ අනුන්ගේ දිව්‍යාංගනාවන් අරගෙන යනවා. පිනේ විවිධත්වය නිසා දෙවියන් අතර පන්ති භේදය තිබෙනවා. දෙවියා කියන්නේ පෙර ජීවිත වල මනුෂ්‍යයින්නේ. ඒ නිසා මනුෂ්‍යගති දෙවියන් තුල තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දෙවියෙක්ගේ දිව්‍ය ආයුෂ ඉවර වෙලා දිව්‍ය ලෝකයෙන් චුත වෙන්න කිට්ටු වෙන කොට දිව්‍ය ලෝකය දාලා යන්න බැරිව දෙවියන් හඬා වැටෙනවා. සිහි මුලාවට පත්වෙනවා කියලා. එතකොට අනෙක් දෙවිවරු වටවෙලා ඔබ සුගතියේ උපතක් ලබලා, නැවත පිං කරගෙන දිව්‍ය ලෝකයට පැමිණෙන්න කියලා එම දෙවියාව අස්වසනවාලු. මේ දෙවියන් සුගතිය කියන්නේ බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍ය ලෝකය. බුද්ධෝත්පාද කාල වලදී මනුෂ්‍ය ලෝකයේදී පින් කරලා එම පිනේ අසිරිය විඳින තැන තමයි දිව්‍ය ලෝකය. දිව්‍යතල වල දෙවියන්ට අවශ්‍ය නම් දිව්‍යශ්රොත වලින් මනුෂ්‍යලෝකයේ ස්වාමීන් වහන්සේලා දේශනා කරන සද්ධර්මය ඇසීම සහ එම ධර්මය නුවණින් මෙනෙහි කිරිම තුළින් ධර්මාවබෝධය ලැබීමට හැකියාව ලැබෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ පිනේ අසිරිමත්භාවය නිසාම දෙවියන් කාමච්ඡන්දයන්ගෙන් ප්‍රමාදභාවයට පත්වෙලයි දිව්‍යතලවල ජීවත් වෙන්නේ. සද්ධර්මය ඉතා අර්ථවත්ව දේශනා කරන ස්වාමීන්වහන්සේලා කොපමණ මේ රටේ වැඩ සිටිනවාද. නමුත් උන්වහන්සේලා දේශනා කරන ධර්මය ශ්‍රවණය කරලා සාදුකාර දීලා මනුෂ්‍යයා නැවතත් කාමයන් තුලමටයි බැසගන්නේ.

භික්ෂුවක් සමාධියෙන් පසුවෙන කොට දිව්‍ය අප්සරාවන් පිරිසක් දර්ශනය වෙනවා. මේ දිව්‍ය අප්සරාවන් මලින් හැදිලා තිබෙන්නේ. මනුෂ්‍යයා හැදිලා තිබෙන්නේ මසෙන් වගේ, මේ දිව්‍ය අප්සරාවන් මලින් හැදිලා තියෙන්නේ. අපේ ශරීරයේ රෝම කූප වගේ එම අප්සරාවන්ගේ ශරීරයම මලින් ගැවසිලා තිබෙන්නේ. ලස්සන තද පැහැති, ලා පැහැති රෝස පැහැයෙන්, ඒවා ඕකිඩ් මල් වගේ. ඔබ සිතන්නකෝ හොඳින් විනිවිද පෙනෙන දීප්තිමත් පොලිතීන් උරයකට රෝස පැහැති ඕකිඩ් මල් කලාවකට ඇසුරුවා කියලා. අන්න ඒ වගේ දිව්‍යාංගනාවන් පෙර මනුෂ්‍ය ජීවිතවල කාන්තාවන් ලෙස උපත ලබලා සිල් ආරක්ෂා කරලා පින් දහම් කරලා තමන්ගේ ශරීර මස අනුන්ගේ කාමච්ඡන්දයන් ඇති නොවන ආකාරයට ජීවත් වෙලා. ශරීර අඟපසඟ හොඳින් ආවරණය වන ආකාරයට ඇඳුම් පැළඳුම් ඇඳලා. එහි විපාකයන්

හැටියට දිව්‍ය ජීවිතයේදී දිව්‍ය ශරීර හැදිලා තිබෙන්නේ සුවඳවත් ලස්සන මලින්. හැමෝටම ශරීරය පෙන්වන තරු ඇටසැකිලි පායාස නිරයට වැටෙන කොට ශරීරය හොඳින් වසාගත් පින්වන්තියෝ මරණින් පසු මලින් උපන් දිව්‍යාංගනාවෝ වෙනවා. ඉහත කාරණය තුළ වර්තමානයේ නොගැළපෙන ඇඳුම් අඳින කාටත් අවශ්‍ය නම් නිවැරදි වෙන්න හොඳ පාඩමක් තිබෙනවා. මෙතනදී පිංවත් ඔබලාට හොඳින් සිතා ගන්න පුළුවන් කුසලය සහ අකුසලය අතර ඇති පරතරය. ඒවායේ විපාකයන් නිසාම සකස් වෙන දුක සහ සැප අතර තිබෙන පරතරය. අකුසලය, ඇටසැකිලි නිරිසතෙක් සම ගහපු නිරිසතෙක් බවට පත් කරන කොට කුසලය මලින් උපන් දිව්‍යාංගනාවක් බවට පත් කරනවා. අතීතයේ කල පිංකම් නිසාම මෙවැනි අසිරියක් ලබන දිව්‍යාංගනාවන් මැද්දේ දෙවියන් කෙසේ නම් ධර්මය දකින්නද.

නමුත් මාර්ගඵලලාභි දෙව්වරුන්ගේ තත්ත්වය මීට වඩා හාත්පසින්ම වෙනස්. එම දෙව්වරු පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකලා තිබෙන නිසා ශීලයේ සීමාවන් තුල සිටිමිනුයි, කාමයන් පරිහරණය කරන්නේ. එවැනි මාර්ගඵලලාභි දෙව්වරුන්ට දිව්‍යාංගනාවන්ට මේ මොහොතේදීත් දිව්‍යතලවලදී ධර්මය අවබෝධ කර ගැනීමට හැකියාව තිබෙනවා. එම නිසා පිංවත් ඔබ ලැබූ මනුෂ්‍ය ජීවිතය මාර්ගඵලලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් බවට පත්කර ගැනීමටයි ඔබ දක්ෂ වෙන්න ඕනේ. එහෙම වුනොත් ඔබ දිව්‍යතල වලදී නැවත අතරමං වෙන්නේ නැහැ. ඉහත කාරණා වලින් පිංවත් ඔබ නුවණින් දකින්න උත්සහ ගන්න ඕනේ, සාමාන්‍ය දෙවියන්ට දිව්‍යතලවලදී වර්තමානයේදි හෝ අනාගතයේදී ධර්මාවබෝධය ලැබීම දුෂ්කර කටයුත්තක් වෙන්නේ ඇයිද කියන කාරණය. බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජීවත් වෙච්ච බොහෝම වැදගත් උපාසක යුවළක් සිටියා. ඒ තමයි නකුල පියා සහ නකුල මාතා. මේ පිංවතුන් දෙදෙනාම තරුණ කාලයේදීමයි සෝවාන් ඵලයට පත්වෙන්නේ. මේ දෙදෙනා බොහෝම ආදර්ශවත් පවුල් ජීවිතයක් ගතකරපු දෙදෙනෙක්. නකුල පියා අසූවයස් වියට පත්වී බොහෝම වයෝවෘද්ධ නකුල මාතාව සමඟ බුදුරජාණන් වහන්සේ බැහැදකින්න පැමිණිලා, බුදුරජාණන් වහන්සේගෙන් බොහොම ආදරණීය ප්‍රශ්නයක් විමසනවා. භාග්‍යවතුන් වහන්ස, මම මේ නකුල මාතාව කුල ගෙදරට කැන්දගෙන පැමිණියේ ඇයට වයස අවුරුදු පහළොවේදී. එදා පටන් අද දක්වා ඇය කයෙන් හෝ සිතෙන් මාව ඉක්මවා කටයුතු කළේ නැහැ. මමත් ඒ වගේමයි. ඇය ඉක්මවා කටයුතු කලේ නැහැ. මට දැන් අවශ්‍යයි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගෙන් දැනගන්න ලබන ජීවිතයේදීත් මේ නකුල මාතාව මගේ බිරිඳ කරගන්නේ කොහොමද කියලා. නකුල පියා මේ අහන්නේ ලබන ජීවිතයේදීත් නකුල මාතාව බිරිඳ කරගන්නේ කොහොමද කියලා. නකුල පියාගේ මේ අදහසට බුදුරජාණන් වහන්සේ කිසිම බාධාවක් කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නකුල ඔබ දෙදෙනා සමසද්ධා, සමශීල, සමත්‍යාග, සමප්‍රඥා වඩන්න කියලා. ඒ කියන්නේ කෙනෙක් අනෙක් කෙනාව ඉක්මවා යන්නේ නැතිව සමව ඉහත ධර්මයන් වඩන්න කියලා. මෙතනදී පිංවත් ඔබ නුවණින් මෙනෙහි කරන්න ඕනේ. මේ නකුල අඹුසැමියන් සෝවාන් ඵලයට පත්වෙච්ච දෙපලක්. නමුත් ඒ අය තුල කාම, රාග, පටිඝ තිබෙනවා. ඒ නිසාම පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවයේ දැක්ම තුල සිටිමින්ම, ශිල්පද ආරක්ෂා කරමින්ම කාමයන් අත්විඳීමේ කැමැත්ත තිබෙනවා. කාමයන් අත් විඳිමට නකුල පියාට තිබූ කැමැත්ත නිසාම නකුල පියා මැරෙන වේලාවේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය නැවත නැවත වැඩිමට අසමත් වුණා. භික්ෂුවක් උතුම් සමාධියෙන් අරමුණු කොට බලන කොට නකුල පියාට ප්‍රභාශ්වර තැඹිලි පාට සළුවක් පැළඳගත් උඩුකය නිරාවරණය වුන රන්වන් පැහැති සෝවාන් දෙවියෙක් වෙලා දිව්‍යතලයක උපත ලබා සිටිනවා. සෝවන් ඵලයෙන් ඔබ්බට යන්න නකුල දෙවියාට පුළුවන්කමක් තිබුණේ නැහැ. මොකද මැරෙන වේලාවේ තව දුරටත් පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය නොවැඩුන නිසා. නමුත් නකුල පියා මැරුනාට පසුව නකුල මාතාගේ තත්ත්වය මීට වෙනස් වුණා. නකුල පියාගේ අභාවය දැකලා දරුවන් සමඟ තමා තනිවුණ බව දැකලා නකුල මාතාවට අනිත්‍ය සංඥාවන් වැඩුනා. මොකද ඇයත් සෝවාන් ඵලය ලැබූ

උපාසිකාවක්. ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ ශීලයන් ආරක්ෂා කරන උපාසිකාවන් අතර අග්‍රස්ථානය ලැබූ උපාසිකාව නකුල මාතාව තම ස්වාමිපුරුෂයාගේ වියෝව නිසාම අනිත්‍ය සංඥාවන් වැඩුනා. ඇය මරණයට පත්වෙන මොහොතේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය තව දුරටත් වැඩීමට දක්ෂ වුණා. ඒ නිසාම ඇය සකෘදගාමී දිව්‍යාංගනාක් වශයෙන් දිව්‍යතලයේ උපත ලබන්නේ. භික්ෂුවක් උතුම් සමාධියෙන් අරමුණු කොට බලනවා මේ මොහොතේ නකුල මාතාව කුමන ජීවිතයක් ලැබුවාද කියලා. එවිට එම භික්ෂුව දර්ශනය වෙනවාලූ ප්‍රභාශ්වරභාවයක් නැති නොදිලිසෙන කපු සුදු සාරියක්, සුදු හැට්ටයකින් සැරසුන දිව්‍යාංගනාවක්. ඇය නිවුන ගතිගුණ ඇති තැන්පත් දිව්‍යාංගනාවකි. ඉහත ලක්ෂන වලින් ප්‍රකට වෙන්නේ ඇය කාම, රාග, පටිඝ ධර්මයන් තුනී කොට ගත් දිව්‍යාංගනාවක් බවයි. එහි අදහස ඇය සකෘදාගාමී දිව්‍යාංගනාවක් බවයි. ඉහත කථාව තුල නකුල පියා කරගත් දුර්වල ක්‍රියාව ඔබට හඳුනාගන්න පුළුවන්. නමුත් අවසානයේ දෙදෙනා එකට එකතු වුනේ නැහැ. නකුල මාතාව පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය වඩමින් පියවරක් ඉදිරියට ගියා. සෝවාන් ඵලයට පත්වුණු නකුල පියාගේ ඉහත ක්‍රියාවෙන්ම දිව්‍යතලවල ජීවත් වන මාර්ගඵල ලාභී නොවන දිව්‍යාංගනාවන්ගේ කාම, රාග, පටිඝයන්ගේ ස්වභාවය හොඳින් හඳුනාගන්න.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයා ශීලයෙන් පිරිහෙන කොට ඊට සමගාමීව දෙවියන් ද ශීලයෙන් පිරිහෙන බව. දෙවියන්ද දුෂ්ශීල වන බව. දුෂ්ශීල භාවයට පත්වෙන දෙවියන් මනුෂ්‍යලෝකයේ දුසිල්වත් මනුෂ්‍යයින්ට උපකාර කරමින් තව තව ලැජ්ජාභය දෙක මනුෂ්‍යයා තුලින් නැතිකොට දමන බව. දුෂ්ශීල භාවයට පත්වෙන දෙවියන් රජවරුන්, පාලකයින් අධර්මිෂ්ඨ කරනවා. පාලකයින් රාජ්‍ය සේවකයින්, රාජ්‍ය සේනාව, සුරා බොනවා, මිනිසා විකෘති වෙනවා. අධර්මිෂ්ඨ වූ දෙවිවරුන්ට භාරහාරවී මිනිසුන් මරවනවා. අධර්මිෂ්ඨ වූ දෙවියන් වියරු වී වැස්ස වලක්වනවා, දින ගණන් දෝරේ ගලා යන වැසි ඇතිකරනවා. තැන් තැන් වලට පමණක් වසිනවා. එක ප්‍රදේශයකට වැස්ස තව ප්‍රදේශයකට ඉඩෝරය ඇති කරනවා. දීර්ඝ නියං සායවල් ඇතිකරනවා. මේවා හේතුවෙන්ම මනුෂ්‍යා තුල ලෝභ, ද්වේශ, මෝහ අකුසල මූලයන් තව තව වැඩිවෙනවා. සද්ධර්මය ක්‍රමානුකූලව අතුරුදහන්ව යන ලෝකය තුල මාර්ගඵල ලාභී නොවන දෙවියන් දුෂ්ශීලභාවයට පත්වෙනවා. විශේෂයෙන්ම මිථ්‍යාදෘෂ්ඨික දෙවියන් නපුරු පාලකයින්ට උපකාර කරනවා. තව තව අසද්ධර්මය ලෝකයේ පතුරුවන්න සද්ධර්මය ක්‍රමානුකූලව අතුරුදහන්ව යන ලෝකය තුල දිව්‍යතල වල දෙවියන් පත්වෙන අවදානම ඔබ නුවණින් තේරුම් ගත යුතු වෙනවා. මෙවැනි අවදානමක් ඔබ ඉදිරියේ තිබෙන කොට ඔබ උත්සහ ගත යුත්තේ මේ මොහොතේ සාමාන්‍ය දෙවියෙක් දිව්‍යාංගනාවක් වෙලා දිව්‍යලෝකයේදී පින් කිරිමට බලාපොරොත්තු වීම නොව මේ ලැබුවා වූ උතුම් මනුෂ්‍ය ජීවිතයේදීම සද්ධර්මයේ උතුම් අර්ථයන් ප්‍රයෝජනයට ගෙන ධර්මාවබෝධය දෙසට ගමන් කිරිමට වීර්යය සකස්කොට ගැනීමයි. එසේ නොවුනහොත් අනාගතයේදී ඔබත් දුසිල්වත්භාවයෙන් වියරු වැටුන දෙවියන් අතර තවත් එක් දෙවියෙක් වනු ඇත.

එක් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා. ස්වාමීන් වහන්ස, දිව්‍යතලවල, දීර්ඝ ආයුෂ විඳින අරහත් භාවයට පත්වුණ දෙවියන් සිටිනවාද කියලා. දිව්‍යතලවලදී යම් දෙවිකෙනෙක් දිව්‍යාංගනාවක්, චතුරාර්යසත්‍ය ධර්මයන් අවබෝධකොට රහතන් වහන්සේ නමක් බවට පත්වුනොත්, එම දිව්‍ය රහතන් වහන්සේ නමක් බවට පත්වුනොත්, එම දිව්‍ය රහතන් වහන්සේට පැවිදි උපසම්පදාව ලැබීමට දිව්‍යතල වලදී හැකියාවක් නොමැති නිසා අරහත්භාවය අවබෝධකොට දින හතක් ඇතුලත දිව්‍යතලයකදීම පිරිනිවීමට පත්විය යුතු යැයි භික්ෂුව විශ්වාස කරයි. ඉහත කරුණ සම්බන්ධව සමාජය තුල විවිධ මතයන් ඇත. සමාජය යනු කවදත් මතවාද වලින් පිරුණ තැනකි. බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වන විට දඹදිව දෘෂ්ඨි මතවාද හැට දෙකක් තිබුණු බව දේශනා වල සඳහන් වෙනවා. එහෙත් ධර්මය යනු දෘෂ්ඨියක්

මතවාදයක් නොවේ. ලෝකයේ යථාර්ථයයි. සමාජය තුල කුමන මතයක් තිබුණද පිංවත් ඔබ හේතුඵල ධර්මයන්ට ගලපා ප්‍රශ්නය නුවණින් තේරුම්ගැනීමට දක්ෂ විය යුතුය. පිංවත් ඔබ මෙහෙම සිතන්න. අංගොඩ මානසික රෝහලේ දැඩි ලෙස මානසික රෝගීභාවයට පත් වූ රෝගීන් සිටින වාට්ටුවක් තිබෙනවා. මෙම වාට්ටුවේ සිටින එක රෝගියෙක් ලෝභකම නිසා පිස්සු හැදුනු රෝගියෙක්. තව කෙනෙක් රාගය නිසා, ආදරය නිසා, අධ්‍යාපනය නිසා, ද්වේෂය නිසා පිස්සු හැදුනු රෝගීන්. මේ මානසික රෝගීන් පිස්සු නටමින් වාට්ටුව තුළ සිටින්නේ. කෙනෙක් තනිවම බනිනවා. තව රෝගියෙන් තනිව ආදරය කරනවා, තව කෙනෙක් දේශනයක් පවත්වනවා, කිසිම රෝගියෙකුට වාට්ටුවෙන් පැනලා යන්න බැහැ. දැන් පිංවත් ඔබ නුවණින් මේ මානසික රෝගී වාට්ටුවේ ස්වභාවය, පරිසරය හොඳින් දකින්න. භික්ෂුව මේ කටුසටහන සටහන් තබන වනපෙතේ ගොදුරු ගමට කිලෝමීටර් හතරක් පමණ ඇත. කුටියක වැඩ සිටින ස්වාමීන් වහන්සේ නමක් සිටිනවා. උන්වහන්සේ තුල බොහොම උත්කෘෂ්ඨ ශීලයත්, සමාධියත් තිබෙනවා. එහෙම නැති නම් මෙවැනි ඝන කැලෑවක දීර්ඝකාලීනව වැඩ සිටින්න බැහැ. උන්වහන්සේ මේ ධර්මද්වීපය තුල වනවාසීව වැඩ සිටින ශ්‍රේෂ්ඨ ගෞරවනීය ස්වාමීන් වහන්සේ නමක්. භික්ෂුව ඉහතින් සඳහන් කල ගෞරවනීය ස්වාමීන් වහන්සේව වඩම්මවාගෙන ඇවිල්ලා අර මුලින් සඳහන් කළ මානසික රෝහලේ මානසික රෝගීන් සිටින වාට්ටුවට දමා දොර අඟුළු දැම්මොත් කුමක් වේවිද. දැන් පිංවත් ඔබ ඉහත උදාහරණය අනුව නුවණින් මෙනෙහි කරන්න. වාට්ටුවේ සිටින මානසික රෝගීන් සමඟ එම ගෞරවනීය ස්වාමීන් වහන්සේ කෙසේ වැඩසිටින්නද, එක්කෝ උන්වහන්සේ අවබෝධයෙන්ම සියදිවි තොරකර ගනීවි, එසේත් නැතිනම් ආහාර ජලය නොගෙන ස්වභාවිකව අපවත් වේවි. එම ගෞරවනීය ස්වාමීන් වහන්සේට එම පිස්සු සමාජය තුළ ජීවත් වෙන්න බැහැ. අනිවාර්යෙන්ම එම ගිහි ජීවිතය නැමැති මානසික වාට්ටුවෙන් බැහැර වෙලා පැවිදි උපසම්පදාව ලබන්න ඕනේ. එම පිංවත් ස්වාමීන් වහන්සේ නැවත මානසික රෝගියෙක් කියන තැනට පත්වෙන්නේ නැහැ. දැන් පිංවත් ඔබ හේතුඵල ධර්මයන්ට අනුව නුවණින් දකින්න ඕනේ, යමෙක් ගිහි ජීවිතය තුල සිටිමින් අරහත් භාවයට පත් වුවහොත් එසේත් නැතිනම් දෙවියෙක් බ්‍රහ්මයෙක් චතුරාර්ය සත්‍ය අවබෝධය ලැබුවහොත්, ඔහු අනිවාර්යෙන්ම පැවිදි උපසම්පදාව දින කිහිපයක් ඇතුලත ලබාගත යුතුයි. එසේ නොවුනොත් එම රහතන් වහන්සේ පිරිණිවන්පාන්න ඕනේ. මොකද රහතන් වහන්සේ ලෝකය දකින්නේ ඉහතින් දැක්වූ මානසික රෝගී වාට්ටුව වගේ. ලෝභ, ද්වේශ, මෝහ බඩු මල්ල කරේ එල්ලා ගත් ලෝකය උන්වහන්සේට ගැලපෙන්නේ නැහැ. මනුෂ්‍යයාට වර්තමානයේදී පැවිදි උපසම්පදාව ලැබිය හැකි වුවද. දෙවියන්ට බ්‍රහ්මයන්ට එම අවස්ථාව නොමැති නිසා දෙවියන් බ්‍රහ්මයින් අරහත් භාවය අවබෝධකොට දින කිහිපයකින් පිරිණිවීමට පත් විය යුතු යැයි කියලා භික්ෂුව විශ්වාස කරනවා.

දෙවියා අවධානමට ලක්වෙන තවත් අවස්ථාවක් පිළිබඳව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එම අවස්ථාව බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ සප්ත සූර්යගමන සූත්‍රයේදී. මෙම සූත්‍රය වර්තමානයේ විද්‍යාව හදාරණ පිංවතුන්ලා සැකයෙන් යුතුව බලන සූත්‍රයක්. වරක් මෙම සූත්‍රයට අනුව, පිංවත් ඔබ මේ දෙපා තබාගෙන සිටින මහපොළව මත යොදුන් 84000 ක් උසැති මහාමේරු පර්වතය මේ මොහොතේ තිබෙනවාය කියලා, භික්ෂුව දේශනා කරන කොට විද්‍යාව හදාරණ ඊට නැඹුරු පිංවතුන්ලා පිරිසක් ඉහත කාරණය හාස්‍යයට ලක්කලා. නවීන තාක්ෂණය විසින් සැටලයිට් ආධාරයෙන් මේ මහපොළව ඡායාරූපගත කොටයි තිබෙන්නේ. යොදුන් 84000 ක් උස කන්දක් තිබෙනවානම් එය සැඟවී තිබෙන්න බැහැයි කියලා, මේ උතුම් ධර්ම කාරණය හාස්‍යයට ලක්කලා. භික්ෂුව ඒ මොහොතේ එම මහත්වරුන්ට ප්‍රකාශ කලේ ඔබලා ඔය සිනාවෙන්නේ බුදුරජාණන් වහන්සේටයි, උතුම් ධර්මයටයි කියලා. නමුත් එම සූත්‍රය කරුණු සහිතව විග්‍රහ කොට පෙන්වන කොට එම පිංවතුන්ලාට නවීන විද්‍යාව අභිබවාගිය සම්මා සම්බුද්ධ ඥානයේ අසිරිමත් භාවය නුවණින් මෙනෙහි

කරන්න ඇතිය කියලා භික්ෂුව විශ්වාස කරනවා. ඉහත සූත්‍රයේ සඳහන් කාරණය සිද්ධ වෙන්නේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වී එම ශාසනය අතුරුදහන්ව ගියාට පසුවයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මහාමේරු පර්වතය ගැන. එය මේ මොහොතේ විෂයවන්නේ බුදුරජාණන් වහන්සේට පමණයි. මෙහෙම කාලය ගෙවී ගිහින් අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා යොදුන් 84000 ක් උසැති මහාමේරු පර්වතය පෙනෙන්නට පටන් ගන්නවාය කියලා. සම්මා සම්බුද්ධ ඥානයෙන් දේශනා කොට වදාළ, ඉහත කාරණය අපි හේතුඵල ධර්මයන්ට අනුව මෙසේ ගලපාගත යුතුව තිබෙනවා. අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට පෘථිවියේ ඇතිවන උෂ්ණය විසින් හිම දියවෙල මහාමේරු පර්වතය පෙනෙන්නට පටන්ගන්නවා විය යුතුයි. මේ කාරණය පිංවත් ඔබට මෙහෙම ගලපාගන්න පුළුවන්. ඉන්දියාවේ ගංගා, යමුනා ගංගාවන් පටන් ගන්නා ස්ථානයන් තවම ඉන්දියාව දන්නේ නැහැ. ඒ අය දන්නවා මේ ගංගා හිමාලයෙන් පටන්ගන්නවාය කියලා. නමුත් ඒවායේ ආරම්භක උල්පත ඒ අයට හොයාගන්න බැහැ. එම ප්‍රදේශ හිමෙන් වැසිලයි තිබෙන්නේ, අහසයි පොළවයි එක්වෙලා පෙනෙන්නේ, ඒවා අභිරහස් ගුප්ත ප්‍රදේශ මනුෂ්‍යයෙකුට එම ප්‍රදේශ වලට කිට්ටු වෙන්න බැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මහාමේරු පර්වතය බොහෝම සශ්‍රීක කඳුයායකි. එය මහපොළොවෙන් යටට යොදුන් 84000 ක් තිබෙනවා. මහපොළොවෙන් ඉහළට යොදුන් 84000 ක් තිබෙනවා. මහපොළොවෙන් ඉහළට තිබෙන යොදුන් 84000 දිව්‍යතලවලටම උසයි කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ මහාමේරුව සශ්‍රීක වනස්පති වෘක්ෂයන්ගෙන්, තෘණ වර්ග වලින් හිම වළසුන්, හිම මුවන් වැනි සතුන්ගෙන් ගහන සුන්දර කඳුවැටියක්ය කියලා. අවුරුදු සියයක් දහසක් වැස්ස නැති නිසාම සියළු තණපත්, ගහකොළ වියළී මුඩු කඳුවැටිය පෙනෙන්නට තිබෙන්නේ. මේ මොහොත වන විට ඉහත මහාමේරු පර්වතය දකින්නට මනුෂ්‍යයෝ මේ ලෝකයේ නැහැ. පෘථිවියේ උෂ්ණත්වය වැඩිවීම නිසා මනුෂ්‍ය ප්‍රජාව මැරිලගොස් ඉවරයි. මනුෂ්‍යයා පිපාසය, කුසගින්න, උෂ්ණත්වය නිසාම ද්වේශයෙන්, වෛරයෙන් මිය පරලොව ගොස් ප්‍රේතයින්, භූතයින්, තිරිසත්වයින් ඉඩෝරයට ඔරොත්තුදෙන කෘමීන් වශයෙන් මැරෙමින් ඉපදෙමින් මෙම කාශ්ඨක පරිසරයේ දුක් විඳිනවා.

මෙහෙම වැස්ස නැතිව, තවත් අවුරුදු සියයක් දහසක් ගතවෙන කොට යමෙක් අහස දෙස බැලූවොත් අහසේ ඉරවල් දෙකක් පායලා තිබෙනවා. නමුත් මේ දෙවැනි ඉර දකින්න මනුෂ්‍යයෙක් මේ ලෝකයේ නැහැ. දෙවැනි ඉර පැයුවට පසුව මහාමේරු පර්වතයේ තිබෙන මහාදිය පාරවල්, මධ්‍යම දිය පාරවල්, කුඩා දිය පාරවල් සියල්ලම සිඳියනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. සශ්‍රීක දිය උල්පත් වලින් ගහනවා තිබු මහාමේරු පර්වතය කාන්තාරයක් වෙනවා. මෙහෙම තවත් අවරුදු සියක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට අහසේ තුන්වැනි ඉරත් පායනවා. දැන් ඉරවල් තුනයි, තුන්වැනි ඉර පැයුවට පසුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මෙතෙක් මහාමේරුවේ දියඋල්පත් වලින් පෝෂණය වූ පංචමහා ගංගාවන් ගංගා, යමුනා, අචරවති, සරභු, මහි, කියන ගංගාවන් සම්පූර්ණයෙන්ම වැලි තලා මතුවෙන්න සිඳී යනවා කියලා. පංච මහා ගංගාවන් යම් දවසක සිඳී යනවානම් අපේ මහවැලි, කැළණි, වලවේ ගංගා ගැන මොනවා කතා කරන්නද.

මෙහෙම තවත් අවුරුදු සියක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට අහසේ හතරවැනි ඉරත් පායලා තිබෙනවා. දැන් ඉරවල් හතරයි. හතරවැනි ඉර පැයුවට පසුව පංච මහා විල් සම්පූර්ණයෙන්ම සිඳී යනවා. අනෝතත්තය, රථකාරය, සිංහප්‍රපානය, මන්දාකිණිය, ෂඩ්දනය කියන පංචමහාවිල් සම්පූර්ණයෙන්ම සිඳි යනවා.

මෙහෙම වැස්ස නැතිව තවත් අවුරුදු සියයක් දහසක් ගතවෙනකොට ආකාසයේ පස්වැනි ඉරත් පායනවා. දැන් ඉරවල් පහයි. නමුත් ඉරවල් බලන්න දකින්න මනුෂ්‍යයෝ මේ ලෝකයේ නැහැ. මනුෂ්‍ය ප්‍රජාව උෂ්ණත්වය නිසාම විනාශ වෙලා නමුත් ඒ අය නිවන් දකින්නේ නැහැ. ඉඩෝර, කාන්තාර, දේශගුණයට ඔරොත්තු දෙන සතර අපායේ සත්වයින් හැටියට ඉපදෙමින් පිච්චෙමින් මැරෙනවා. එදාට ඔබත්, මමත් භවයේ සිටිය හොත් හේතුඵලධර්මයන්ට අනුව මේ කර්කශ පරිසරයේ මැරෙන උපදින සත්වයෙක් වේවි.

පස්වෙනි ඉර පායලා තිබෙන කොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මහපොළොවෙන් හතරෙන් තුනක් වසාගෙන තිබෙන මහා සාගරය සම්පූර්ණයෙන්ම සිඳී යනවා. මහා සාගරය වැලි තලාවක් වගෙන් පෙනෙන්නේ, ඇතින් ඇතට හරක් කුර සටහන් වල පිරුණු වතුර කළදක් වගේ වළ ගොඩැලි මත දිය කඳුලක් රැුඳී තිබෙනවා පෙනෙනවා යම් දවසක මහා සාගරයත් සිඳිලා යනවා නම් මුළු ලෝකයම මනුෂ්‍යයන්ගෙන් තොර එකම වැලි තලාවක් වෙනවානම් පිංවත් ඔබ මගේ කොට අල්ලාගෙන සිටින රට, ජාතිය, ආගම, දේශසීමා ගැන මොනවා කතා කරන්නද. මහා සාගරය දැන් සම්පූර්ණයෙන්ම සිඳිගොස් ඇති නිසා දැන් මහාමේරුව මුහුද යටට ගිලී තිබුණ යොදුන් 84000 ක් මතුවෙලා. දැන් මහාමේරු පර්වතය දිගින්, පළලින්, උසින් යොදුන් එක්ලප හැට අටදාහක් විශාලත්වයකින් පෙනෙන්නේ.

මෙහෙම තවත් අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට හයවෙනි ඉරත් අහසේ පායලා තිබෙනවා. දැන් ඉරවල් හයයි. හයවැනි ඉර පැයුවට පසුව පෘථිවියේ උෂ්ණත්වය වැඩිභාවය නිසාම මහාමේරු පර්වතය හතර වටින්ම දුම් දමනවා. එම දුමින් මුළු පෘථිවිතලයම වැසී යනවා. යොදුන් එක්ලක්ෂ හැට අට දාහක් උස, පළල මහාමේරුවයි මේ දුම දමන්නේ. පිංවත් ඔබ නුවණින් මෙනෙහි කරන්න ඕනේ මහාමේරු පර්වතය මුදුනත දිව්‍යතලවලට උස නම් මේ දුමෙන් දිව්‍යතලත් පීඩාවට පත්විය යුතුයි. දෙවියනුත් පීඩාවට පත්විය යුතුයි. ඉරවල් හයක උෂ්ණත්වය, ආලෝකය, යටපත් කොට පෘථිවිය දුමෙන් වැසී යනවා. මේ මුළු පෘථිවිතලයම දුමෙන් වැසී යනවා නම් අනාගතය ආලෝකමත් කර ගැනීම උදෙසා අපි ඇති කරගන්න බලාපොරොත්තු කුමක් කරන්නද.

මුළු පෘථිවියම දුමෙන් වැසිලා තවත් අවුරුදු සියයක් දහසක් තිබෙන කොට අහසේ හත්වෙනි ඉරත් පායලා තිබෙනවා. දැන් ඉරවල් හතයි. සත්වෙනි ඉර පැයීමත් සමඟම දුමෙන් රත්වෙලා තිබුණ මහාමේරු පර්වතය සතර වටෙන්ම ගිනිගනිමින් පෘථිවිය මතට කඩා වැටෙනවා. යොදුන් 168000 ක් උසින්, පළලින්, දිගින් යුත් මහාමේරු පර්වතය ගිනි ගනිමින් පුපුරා කඩා වැටිම නිසා මුළු පෘථිවියම ගිනිගෙන විනාශයට පත්වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ගිනිගැනීමෙන් අඟුරු කැබැල්ලක්වත් ඉතිරි වන්නේ නැහැ කියලා. සියල්ල ගිතෙල් දැවුන කළ ඉතිරි වෙන අළු බවට පත්වෙනවා. යම් දවසක මුළු පෘථිවියම ගිනිගෙන අළු බවට පත්වෙන දිනයක් එනවා නම් මේ රූපයට සැප ලබාදීම සඳහා අපි ඉදිකරන කාම රූපි, අරූපි මාළිගාවන් ගැන මොනවා බලාපොරොත්තු තබාගන්නද.

කෙනෙකුට ප්‍රශ්නයක් වෙන්න පුළුවන් පෘථිවියේ තිබෙන්නේ එක ඉරයි කොහොමද ඉරවල් හතක් පායන්නේ කියලා. ඒවා හේතුඵල ධර්මයන්. පළමු ඉර පායලා තිබී අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට ඇතිවන පෘථිවියේ උෂ්ණත්වය විසින් දෙවැනි ඉර ඇති වෙනවා. දෙවැනි ඉර පායලා අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට පෘථිවියේ ඇතිවෙන උෂ්ණත්වය විසින් තුන් වැනි ඉර ඇතිවෙනවා. මේ විදියට පෘථිවියේ උෂ්ණත්වය වැඩිවෙන්න වැඩිවෙන්න එම පෘථිවියේ උෂ්ණත්වය විසින් ඉරවල් ඇතිවෙන්නේ. මේ ආකාරයට හත්වැනි ඉර පැයුවාට පසුව ඊටත් වඩා උෂ්ණත්වයක් පෘථිවියට දරාගන්න බැහැ. පෘථිවියට එම උෂ්ණත්වය දරාගන්න පුළුවන් නම් අටවැනි ඉරකුත් පායාවී. නමුත්

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උතුම් සම්මා සම්බුද්ධ ඥානයෙන් දකිනවා හත්වැනි ඉරට වඩා උෂ්ණත්වයක් පෘථිවියට දරාගන්න බැහැය කියලා. හේතුඵල ධර්මයන් විසින් මේ විනාශය සකස්කරන්නේ.

ඉහත සූත්‍රය භික්ෂුව සටහන් කළේ දෙවියන් හා දිව්‍යතල අවදානමට ලක්වෙන අවස්ථාවක් ගැන සඳහන් කරන්න. මේ සූත්‍රයේ සඳහන් වෙනවා, දිව්‍යතලවල දෙවියන් සතුටුවන කාමාස්වාදය විඳින පංචමහා විල් සිඳිලා යනවා කියලා. මහාමේරු පර්වතයේ මුදුනත දිව්‍යතලවලට උස නිසා මහාමේරු පර්වතය අවුරුදු සියයක් දහසක් දුම් දමන කොට එම දුමෙන් දිව්‍යතල වැසියන් පීඩාවට පත් වෙන්න ඕනේ. ඉහත සූත්‍රයේදී සත්වෙනි ඉර පායලා මහාමේරුව ගිනිගැනීමේදී මුළු පෘථිවියම ගිනිජාලාවක් බවට පත්වෙමින් පවතින විට දිව්‍යතලයත් පීඩාවට පත්වෙන්න ඕනේ. මෙතැනදී සුරක්ෂිත භාවයට පත්වෙන්නේ මාර්ගඵලලාභී දෙවියා දිව්‍යාංගනාව පමණයි. ආභස්සර බ්‍රහ්මතලය සුරැකිව පවතිනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සූත්‍රය ආරම්භයේදීම සටහන් කළ පළමු ඉර පායලා තිබී, අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙන කොට කියන අවස්ථාවේදී පටන් සත්වැනි ඉර පායා පෘථිවිය ගිනිගෙන දැවෙන මොහොත දක්වා ඇති කාලය අවුරුදු දස දහස් ගණනක් වෙන්න පුළුවන්. මේ කාලවකවානුව තුල පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකපු සියළුම මාර්ගඵලලාභී දිව්‍ය දිව්‍යාංගනාවන් මේ පෘථිවියේ වෙන්නාවූ විනාශය දැකලා එම විනාශය නුවණින් මෙනෙහි කරලා අනිත්‍යසංඥාවන් වැඩිලා නිවන් අවබෝධකොට ගන්නවා. මේ සා විනාශයක් පෘථිවිය මත තම දැස් ඉදිරිපිට සිද්ධවෙන කොට අවම තරමින් සද්ධානුසාරී ධම්මානුසාරී දෙවි කෙනෙකුවත් මේ ලෝකයට සංස්කාරයන්ට බැඳෙන්නේ නැහැ. මේ විනාශය කමටහන් කොට ගෙන නිවන් අවබෝධය ලබනවා. ඉන් මෙහා සියළුම දෙවියන් මේ අනතුරේ ගොදුරු බවට පත්වෙනවා. මේසා දරුණු විනාශයක් සිද්ධවෙනකොටත් මාර්ගඵලලාභී දෙවියා, දිව්‍යාංගනාව සුරක්ෂිතයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ඉහත හේතුව නිසා විය යුතුයි.

එම නිසා පිංවත් ඔබ මේ උතුම් අවස්ථාවේදී ධර්ම මාර්ගයේ ගමන් කරමින් කල්ප විනාශයකදීවත් පීඩාවට පත් නොවන මාර්ගඵල ලාභී දෙවියෙක් දිව්‍යාංගනාවක් වීමට උත්සහ ගන්න. එසේ නොවුනහොත් ඉරවල් හතක උෂ්ණත්වය විසින් ඇතිකරන කර්කශ පරිසරයේ මනුෂ්‍ය ලෝකය තුල නිර්මාණය වන ගිනිගත් නිරයේදී මැරෙමින් ඉපදෙන කෘමීන්, ප්‍රේතයින්, තිරිසතුන් වශයෙන් ද්වේශය, වෛරය, වේදනාව, පිච්චීම ජීවිතය කොට ගත් අවාසනාවන්තයෙක් වීමට ඔබට සිදුවනු ඇත.

මෙම සූත්‍රය මෙනෙහි කරන කොට ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ඥානයේ අසිරිමත්භාවය ඔබට වැටහෙනවා, වගේම හේතුඵල ධර්මයන්ට අනුව අනාගතය දැකීමේ තියුණු ප්‍රඥාව හොඳින් පැහැදිලි වෙනවා. මුලින්ම අවුරුදු සියයක් දහසක් වැස්ස නැතිව තිබෙනවා. එම උෂ්ණත්වය හේතුවෙන්ම හිම දියවෙලා මහාමේරුව පේන්න පටන් ගන්නවා. දෙවැනිව දිය උල්පත් සිඳී යනවා. ක්‍රමානුකූලව පංචමහා ගංගා, පංචමහාවිල්, මහා සාගරය සිඳී යනවා. මීළඟට උණුසුම වැඩිනිසාම මහාමේරුව දුම් දමනවා. අවසානයේදී ගිනිගෙන විනාශ වෙනවා. එකින් එක ඉරවල් පායන කොට ඇතිවන ලෝක ස්වභායන් පිංවත් ඔබ නුවණින් දකින්න. ඉහත කල්ප විනාශය ඔබේ ජීවිතය කිට්ටුවට ගෙන සංසාරබිය ඇති කරගන්න. මේ මුළු මහ පොළවම ගස්කොළන්, තණපත්, වියළි මුඩු බිමක් වෙනවා මනසින් දකින්න. ගංගා ඇළ දොළ වියළී මහා සාගරය සිඳී ගොස් මුළු පෘථිවියම වැලි තලාවක් වෙනවා මනසින් දකින්න. මුළු පෘථිවියම දුමෙන් වැසී තිබෙනවා මනසින් දකින්න. මුළු පෘථිවියම ගිනිගෙන දැවෙනවා මනසින් දකින්න. එම කාශ්‍යක උෂ්ණත්වයට හසුවී සත්වයා පිච්චි පිච්චි මැරෙනවා, නැවත උපදිනවා මනසින් දකින්න. ඔබ මනසින් සැලසුම් කරන්නා වූ අනාගත පංචඋපාදානස්කන්ධයේ බියකරු

බව, විෂම බව, දුක්බව කුසල් අකුසල් සංස්කාරයන්ගේ ආශ්වාද රහිත බව දකිමින් ඉහත ලෝක ධර්මයන් සම්මා සම්බුද්ධ ඥාණයෙන් අවබෝධ කොට වදාළ බුදුරජාණන් වහන්සෙගේ අයෝමය ගුණයන් ඥාණයන් පිළිබඳව මෙනෙහි කරමින් රාත්‍රී නින්දට යන්න එවිට එම රාත්‍රීය යහපත් රාත්‍රියක් වේවි.

නොවැම්බර් මාසයේ වැස්ස කාලය පටන් අරගෙන කටුමැටි කුටියේ ඉදිරි පියස්සට දමා තිබෙන කළු පැහැති පොලිතින් වහලයට ජල බිංදු වැටෙන වේගවත් හඬ වැස්සේ හඬ පරයා ඇසෙනවා. කැලයේ කිචි බිචි ගාමින් සිටි කුරුල්ලන් ගැන කිසිම හෝඩුවාවක් නැහැ. එම කුරුල්ලන් ගස්වල අතුපතරට වෙලා හොඳටෝම තෙමෙනවා ඇති. උදේ ඉඳන් වැස්ස නිසාම අද දවල් වරුවම කුරුල්ලෝ කුසගින්නේ. ඒ නිසාම පණුවන්ට, දලඹුවන්ට වැස්ස නිසා අද අභය දානය ලැබෙනවා. අතීත අකුසල් නිසාම වැස්සට හෙම්බත් වී කුරුල්ලෝ දවස ගත කරන්නේ මොනතරම් පීඩාවකින්ද. අතීත සංස්කාර සත්වයාව බොහෝම සාධාරණ විදියටයි සලකන්නේ. වැස්සට නොතෙමී ඉන්න ඔබටත්, මටත්, ගෙදරක්, කුටියක් ලැබිලා තියෙන්නේ අතීත කුසල් සංස්කාර නිසාමයි. මහා ධාරාණීපාත වැස්සේ පිංවත් ඔබ සිතන්න ඕනේ වැස්ස නවතින්නේ කොයි වේලාවේද කියලා නොවේ, වැස්සේ සීතලට උණුසුම් වෙන්නේ කොහොමද කියලා නොවේ, වැස්සට තෙමෙන අප්‍රමාණ සත්වයන් අතර වැස්සට නොතෙමී ඉන්න, පිංවත් ඔබ මොනතරම් පින් කරලා ඇතිද කියන කාරණය. වැස්ස ගැන නුවණින් මෙනෙහි කරලා මතුකොට ගන්න පින, පව කියන කාරණය පිංවත් ඔබ උපයෝගීකොටගත යුත්තේ විදර්ශනා නුවණ වඩාවාගැනීම උදෙසාමයි. ඔය වැස්සට තෙමෙමින්, සීතලේ ගැහෙමින් සිටි සෑම පක්ෂියෙක්ම, සතෙක්ම, අතීත භාව වලදී ලොකු මාළිගාවල, තට්ටු දෙකේ ගෙවල් වල ජීවත් වුණ අය. අතීතයේ ඒ අය වැස්ස වහින කොට, වැස්ස පායන්නේ කොයි වේලාවේද කියලා සිතුවා මිස, වැස්සට උණුසුමකට තුරුල්වුණා මිස, තමන් වැස්සට නොතෙමී සිටියදී අනෙක් සතුන් වැස්සට තෙමෙන්නේ ඇයිද කියලා සිතුවේ නැහැ. මේ උතුම් මොහොතේ පිංවත් ඔබට පුළුවන් වැස්සට තෙමෙන සතුන් අතර වැස්සට ඔබ නොතෙමී සිටින්නේ ඇයිද කියන කාරණය සිතන්න. ආකාසයේ කඩා හැලෙන මහ වැස්සට වඩා, ඔබේ සිතෙන් කඩා හැලෙන, කෙලෙස් වැස්ස ඔබව අනාගත භවගමනේදී මහා වැසි වලට තෙමෙන තිරිසන් සතෙක් කරාවි. භික්ෂුව දන්න පිංවත් මහත්මයෙක් සිටියා. එම මහත්මයාගේ ආගම මොකක්ද කියන්න භික්ෂුව දන්නේ නැහැ. ඔහුගේ ආගම කාටවත් සොයන්නත් බැහැ. සර්ව ආගමික කියලා ආගමකුත් තිබෙනවානේ. මේ අය පන්සලටත් යනවා, පල්ලියටත්, කෝවිලටත් යනවා. එක අරමුණක සිත පිහිටලා නැහැ. විචිකිච්ඡාව, සැකය ජීවිතය තුල උඩු දුවලා. සමහර විට එම මහත්වරුන් සිතනවා තමන් පැවතෙන්නේ වඳුරාගෙන් කියලා. වඳුරා අත්තෙන් අත්තට පනිමින් යනවා වගේ, ඒ මහත්මයාත් පන්සලට, පල්ලියට, කෝවිලට පනිමින් යනවා. භික්ෂුව සඳහන් කරන මහත්මයා ඉහත ස්වභාවයේ මහත්මයෙක්. ඔහුට හොඳ තීක්ෂණ බුද්ධියක් තිබුණා. ඔහුගේ තීක්ෂණ බුද්ධියට පුළුවන්, මුළු සමාජයම යම් කාරණයක පටලවා තබලා, ඇතිවන විනාශය නිවී සැනසිල්ලේ බලා සිටින්න. මේ මහත්මයා මිය ගිහින් උපත ලබන්නේ තියුණු තීක්ෂණ රතු පැහැති ඇස් ඇති බකමූණෙක් වෙලා. ඒ බකමූණන් මේ මහා වැස්සට සමහර විට තෙමෙනවා ඇති. අපූරු සුන්දර මනස්කාන්ත නිවසක අතීතයේ දැසි දස්සන් සමඟ ජීවත් වෙද්දී ඒ මහත්මයා සිතලා නැහැ. මෙපමණ සතුන් මහා වැස්සට තෙමෙන කොට ඇයි මම නොතෙමී සුවිසල් නිවසක ජීවත් වෙන්නේ කියලා.

වැස්ස හුභාක් වේගයෙන් වහිනවා. කුටිය ඇතුලේ එල්ලී සිටි කිරි වවුල් පැටියා වේගවත් ගෙරවීම් හඬට බියවී කුටිය ඇතුලේ එහා මෙහා පියාඹනවා. ටෝච් එළියේ ආධාරයෙන් මේ කටුසටහන ලියන්නේ. වැස්ස ඔබ ඇති තරම් වහින්න. භික්ෂුවකගේ සිත අනිත්‍ය සංඥාව නැමැති, පොල් අතු වලින් හොඳින් සෙවිලි කරලයි තිබෙන්නේ. ඒ සිතේ ධර්ම මනසිකාරයන් හැර වෙන සිතුවිල්ලක් නම් ඇති වන්නේ නැහැ. මෙසා දරුණු වැස්සේ අකුසල් විපාක අත් විඳින තිරිසන් සතුන් විඳින දුක කමටහන් කොට ගෙන පිංවත් ඔබේ

සිතත් හොඳින් ධර්මයෙන් සෙවිලි කොට ගන්න. වැසි බර රාත්‍රියක නින්දට යන මොහොතේ පිංවත් ඔබ වැස්සට නොතෙමී සිටිනා හේතුඵල ධර්මයන් නුවණින් දකිමින් නින්දට යන්න. එවිට එම රාත්‍රිය යහපත් රාත්‍රියක් වේවි.

වස් කාලය ගෙවී ගිහින්, චීවර මාසයේ අවසාන පොහොය අදයි. පිංඩපාත මඩුවට දානය රැගෙන පැමිණි දායක මහත්මයෙක් ප්‍රකාශ කලා, තමන්ගේ ගමේ පන්සලේ මුල්ම වතාවට අටපිරිකර පනහක් පූජා කරලා වස්පිංකම බොහෝම උත්කර්ෂවත් අන්දමින් සිද්ධකලාය කියලා. එක ස්වාමීන් වහන්සේ නමක් පමණක් වැඩ සිටින ගමේ පන්සලේ දායක මහත්වරුන්ට හරිම සන්තෝෂයි පිංකම ගැන. අනේ සාදු සාදු පිංවතුන් ගොඩාක් පිංකම් කරගන්නවා. ගෞරවනීය ස්වාමීන්වහන්සේලාත් කුසලයේ අර්ථයන් කඨින පිංකම තුලින් මතුකොට ගන්න දක්ෂවෙන්න ඕනේ. භික්ෂුව වැඩ සිටි කුටියේ දායක පිංවතුන් භික්ෂුවට කඨින වස්ත්‍රය හැටියට අඳනයක් පූජා කළේ. භික්ෂුවගේ තුන් සිවුර පරිපූර්ණ නිසා එම අඳනයක්, කුටියේ අතහැර දමලයි භික්ෂුව දැන් වැඩ සිටින කුටියට වැඩියේ. අතිරික්තය කියන්නේ භිසරදයක්. අතිරික්ත දෙය අතහරින කම්, භික්ෂුවට සැනසිල්ලක් නැහැ. ඉහත අතහැරීම තුළ අර්ථවත්ව ජීවත් වන ගෞරවනීය ස්වාමින් වහන්සේලා විශාල පිරිසක් වර්තමානයේ වැඩ සිටිම අපි කාටත් සතුටක්, වගේම අපේ භාග්‍යයක්.

වසරකට වතාවක් එළඹෙන කඨින පිංකම ගිහි පිංවතුන්ලා සිදුකරන්නේ බොහෝම ගෞරවයෙන්. ඒ ගෞරවයේ තරමටම පිංවතුන්ලාට පින් රැස්වෙනවා. වර්තමානයේ කඨින පිංකම බොහෝම මිල අධික පිංකමක් බවට පත්වී ගෙන යනවා. මේවා ගැන සිතීම පැත්තකින් තියලා පිංවත් ඔබ උත්සහ ගන්න ඕනේ කඨින චීවර පූජාවේ සැබෑම අර්ථය ජිවිතයට එකතුකොට ගන්න. ලෝකයටම සඟවා, අනුන්ගේ පිංකමෙන් තමා ගත හැකි උපරිම ප්‍රයෝජනය ලබාගැනීමට. පින කියන්නේ සංස්කාරයන් බව ඇත්ත. නමුත් ප්‍රඥාව වඩවා ගැනීම උදෙසා පින අත්‍යාවශ්‍ය වෙනවා. ගෞරවනීය ස්වාමීන්වහන්සේලාට වස් ආරාධනා කිරීමත් සමඟම එළඹෙන තුන් මාසයේ පිංවතුන්ලා දානමය, ශීලමය, සද්ධර්ම ශ්‍රවණය පිංකම් ගොඩාක් සිද්ධකරගන්නවා. මේ කර ගන්නා වූ පිංකම් විදර්ශනා නුවණ ඇති කර ගැනීම උදෙසාමයි ප්‍රයෝජනයට ගත යුත්තේ. පිංවත් ඔබ වස් පිංකම් ආරම්භ කිරිමේදී පූජා කරන වැසි සළුවේ පටන් මුළු වස් පිංකම පුරාවටම ලෝභ, ද්වේෂ, මෝහ සිතක් සකස් වෙන්න දෙන්න එපා. වර්තමානයේ කඨින පිංකම කියන කාරණයේදී තරඟයක් කියන කාරණය අපි දකිනවා. වියදම් පක්ෂයේ වැඩිභාවය තමයි, පිංකමේ සාර්ථකත්වය මනින මිනුම් දණ්ඩ වෙන්නේ. සමාජය යන දිශාවකට ගියාදෙන් පිංවතුන් දක්ෂ වෙන්න ඕනේ සමාජයේ ඇස වහලා ඔබගේ විදර්ශනා ඇස තියුණු කරගන්න. පිංවත් ඔබ තුල ලෝභ, ද්වේෂ සිත් හීනකර ගැනීම තුලයි අමෝහය කියන අර්ථය වැඩෙන්න සුදුසු පරිසරය ඔබතුල නිර්මාණය වන්නේ. එතැන සිට පිංවත් ඔබ සිතන්න අතීත සංසාර ගමන පුරාවට අතීත සම්මා සම්බුද්ධ ශාසනවල ඉපිද පිංවත් ඔබ වැසි සළු ලක්ෂ කීයක් පූජා කරගන්න ඇතිද, ඔබේ දෑතින් අතීත සංසාරයන්හිදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේලාටත් වැසි සළු පූජා කරලා වස් ආරාධනා කරන්න ඇති. සංසාරයක් පුරාවට ඔබ පූජා කල කඨින වස්ත්‍ර ප්‍රමාණය එක ගොඩක් කලොත් එය ගිජ්ජකූට පර්වතය ප්‍රමාණය ඉක්මවා යාවි. වස් පිංකම් උදෙසා ඔබ පූජා කලාවූ ආහාර, දානය එක ගොඩක් කලොත් එයත් ගිජ්ජකූට පර්වතයේ ප්‍රමාණය ඉක්මවා යාවි. ඒ වාගේමයි කඨින චීවර පිංකම් නිසා රැස්කොට ගත් කුසල් සංස්කාරයන් නිසා ඔබ සක්විත රජ සැප, ශක්‍ර සැපය කොතෙක් ලබන්නට ඇතිද. මේ අනිත්‍ය භාවය දකිමින් විදර්ශනා නුවණ දියුණු කොට ගන්න.

පිංවත් ඔබලා පසුගිය වසරේ ගෞරවයෙන් පූජා කල කඨින චීවරය මේ වන විට දිරාගොස් ඇති, පාංශකූල චිවරයක් බවට පත්වෙලා ඇති. පසුගිය වසරේ පූජා කල කඨින චිවරයේ අනිත්‍යභාවය දකිමින්, මේ මොහොතේ ඔබ පූජාකරන නැවුම් කඨින චිවරයේද අනිත්‍ය භාවය විදර්ශනා නුවණින් දකින්න. පිංවත් ඔබගේ අතේ තිබෙන කඨින චිවරය, පාංශකූල චිවරයක් වනවා මනසින් දකින්න. දැන් ඔබ තුලින් මෝහයයි දුරුවෙන්නේ. වස් පිංකමේදී අලෝභ, අද්වේෂ සිතුවිලි අතරින් අමෝහය කියන අර්ථවත් ධර්මය මතුකොට ගන්න දක්ෂවෙන්න. එසේ නොමැතිව යන්නන් වාලයේ ඔබත් ගියොත් අතීතයේ ඔබ පූජා කල ගිජ්ජකූට පර්වර්තයේ ප්‍රමාණයට වැඩි කඨින චිවර ගොඩට තවත් එක් කඨින චිවරයක් පූජා කොට, අනිත්‍යභාවයට පත්වෙන සංස්කාරයන් පමණක් රැස්කොටගත් අදක්ෂයෙක් වේවි. එම නිසා අතීතයේ ඔබ සිදුකරගත් සෑම පිංකමකම යථාර්ථය රැස්කරගත්තාවූ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය විදර්ශනා නුවණින් දකිමින් රාත්‍රී නින්දට යන්න. එවිට එම රාත්‍රිය ඔබට යහපත් රාත්‍රියක් වේවි.

වස්කාලය ආරම්භයේදීම භික්ෂුව මුණ ගැසෙන්න තරුණ ස්වාමීන් වහන්සේලා දෙනමක් වැඩියා. වස් කාලයේ ඔබ වහන්සේලා කොහේ වඩින ගමන්ද කියලා භික්ෂුව එම ස්වාමීන් වහන්සේලාගෙන් ඇසුවා. උන්වහන්සේලා දෙනම ප්‍රකාශ කළේ, අපි වස් සමාදන් වුනේ නැති බවයි. උන්වහන්සේලා දෙනම වස් එකක් සහිත උපසම්පදා භික්ෂුව විමසුවා, ඇයි වස් සමාදන් වුනේ නැත්තේ කියලා. එතකොට උන් වහන්සේලා ප්‍රකාශ කරනවා වැස්ස තවම නැති නිසා, වස් සමාදන් වුනේ නැහැය කියලා. ඇසල පොහොයට වැස්ස නැති නිසා මේ ස්වාමීන් වහන්සේලා දෙනම වස් සමාදන් වෙලා නැහැ. භික්ෂුව ඒ වේලාවේ විමසුවා ලබන පසළොස්වක පොහොයටත් වැස්සේ නැත්නම් පසුවස් සමාදන් වෙන්නේ නැද්ද කියලා. ඊට පිළිතුරක් ලැබුනේ නැහැ. භික්ෂුව ඒ වේලාවේ විමසුවා ඔබ වහන්සේලාගේ ගුරුවරයා කවුද කියලා. උපසම්පදා වෙලා ගුරුවරයාගෙන් බැහැරව තනිපංගලමේ යන ස්වාමීන් වහන්සේලා දෙනමක්. මේ ගමන අනතුරු දායක නිසාමයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විනය කාරණාවක් පනවන්නේ පස්වැනි වස දක්වා ගුරුවරයෙක් ඇසුරේ වැඩ සිටින්න කියලා. මාරයා අපේ ඔළුවට නානාප්‍රකාර මතවාද පටවනවා. අප දක්ෂ වෙන්න ඕනේ විනයධර, ධර්මධර, ගුරු ඇසුරක් තුලින් එම මතවාද පරාජය කොට දමන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබේ නම් ඇසළ මාසයේ පසළොස්වක පොහොයට වස් සමාදන් වෙන්න කියලා. අපි එම ඇසළ පොහොයට වස් සමාදන් වෙන්න ඕනේ. කාලයත් සමඟ වෙනස් වන දෙයක් නොවේ, සද්ධර්මය. කාලය වෙනස් වන බව අවබෝධකොට දෙන ධර්මයක්, සද්ධර්මය. පිංවත් ඔබ දකිනවානම් වර්තමානයේ වස් කාලයේ වහින්නේ නැහැ කියලා. ඒ දැක්ම තුල තිබෙන්නේ ධර්මයේ අර්ථය වන අනිත්‍යයි. ඒ කියන්නේ වෙනස් වීම. මේ වෙනස් වීම නුවණින් දැකලා අපි තව තව ධර්මයට සමීපවෙන්න ඕනේ. වෙනස් වන කාලයත් සමඟ අපිත් දුවන්නේ නැතිව එසේ නොමැතිව වෙනස්වීම උදෙසා වෙනස් වීම් කරලා ධර්මය අධර්මය කිරිම, විනය, අවිනය කිරිම අපි කලයුතු නැහැ. වැස්ස, නියඟය වෙනස් වෙනවා. මේ වෙනස් වීම තමයි ධර්මය කියන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ උතුම් විනය නීති පනවන්නේ, මේ වෙනස් වීම දැකලා. වෙනස් වන ලෝකය තුළ නොවෙනස් වන අවබෝධයෙන් පරිපූර්ණ වීමට අවශ්‍ය පරිසරය සකස් කොට දීමට. වැස්ස කියන කාරණය නොවේ. අපි අදාල කරගත යුත්තේ ඇසළ පොහොය කියන කාරණයයි. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේගේ උතුම් පැනවීමයි. හෙට දවසේ මුළු ලෝකයම මහ වැසි වැහැල ගංවතුරෙන් යට වෙන්න පුළුවන්. සතර මහා ධාතුවේ වෙනස් වීම, වෙනස් වීම තුල සිටිමින්ම අවබෝධ කර ගැනීමයි අපි කළ යුත්තේ. එසේ නොවුන හොත් වෙනස් වන ඍතු නියාම ධර්මයන් සමඟ සැමදාම අපිට දුවන්න වේවි. සතර මහා ධාතුව ඔහේ අනිත්‍යභාවයට පත්වෙමින් දුවපුදෙන්. පිංවත් ඔබ ධර්ම විනය ළඟ නවතින්න. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ සතර මහා ධාතුව සද්ධර්මය අතුරුදහන් වෙනවා නම් ඒ පුද්ගලයා ඇති වන්නේ මේ ශාසනය තුලමයි කියලා. මුහුදේ යාත්‍රා කරන

නැවක් බඩු වැඩි වීමෙන් ගිලී යන්නේ යම් සේද, ඒ ආකාරයට සද්ධර්මය අතුරුදන් වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේට සද්ධර්මයට, සංඝරත්නයට අකීකරුව, ගෞරවයෙන් තොරව, ශික්ෂා පදවලට අගෞරව කිරීම සමාධිය කෙරෙහි අගෞරව කිරීම කියන කාරණා ශාසනය අතුරුදහන් වීමට හේතුවෙනවා කියලා. යම් දවසක සද්ධර්මය වේශයෙන් අසද්ධර්මය පහළවුනොත් එදාට ශාසනය අතුරුදහන් වෙනවාය කියලා. ඒ නිසාමයි ධර්මදායාද සූත්‍රයේදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ධර්මයට දායාද වෙන්න, අධර්මයට දායාද වෙන්න එපාය කියලා. විනයට දායාද වෙන්න අවිනයට දායාද වෙන්න එපාය කියලා. ඔබලා ධර්මයට දායාද නොවී අසද්ධර්මයට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා වලට දායාද වුනොත් ඔබලාට පමණක් නොවේ ශාස්තෘන්වහන්සේ වන මටත් මිනිසුන් අගෞරව කරාවි, චෝදනා කරාවි කියලා. එම නිසා අපි ගෞරවයෙන් ආරක්ෂාකර ගත්තා වූ විනය ශික්ෂාවන් සිහිකරමින් ආවර්ජනය කරමින් රාත්‍රී නින්දට ගියොත් එම රාත්‍රිය යහපත් රාත්‍රියක් වේවි.

භික්ෂුවගෙන් පිංවත් මහත්මයෙක් ප්‍රශ්නයක් විමසුවා. මෛත්‍රිය කොහොමද මාර ධර්මයක් වෙන්නේ කියලා. ඉහත කාරණ සිහිනුවණින් පිංවතුන්ලා තේරුම් ගන්න අවශ්‍යයි. එසේ නොවුනහොත් වැරදි අන්තයකුයි පිංවතුන්ලා අල්ලා ගන්නේ. බුදුරජාණන් වහන්සේ මෛත්‍රී භාවනාව වැඩීම නිසා ලැබෙන ආනිශංස එකොළහක් ගැන දේශනා කරනවා. එම ආනිශංස නම්, සුවසේ නින්ද යනවා, සුවසේ පිබිදෙනවා, සිහිනෙන් බිය නොවෙනවා, මනුෂ්‍යයින්ට, අමනුෂ්‍යයින්, දෙවියන්ට ප්‍රිය වෙනවා. ශරීරය ප්‍රසන්න වෙනවා, වස විසෙන් හානි නොවෙනවා, සිහිමුලා නොවී මැරෙනවා, සුගතියේ උපදිනවා. ඉහත ආනිශංස ධර්ම වලින් සිහිමුලා නොවී මිය යාමත්, සුගතියේ ඉපදීමත් හැර අන් සියළුම ආනිශංස භික්ෂුව අත් දැකීමෙන් අත්විදලා තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මතුවට සැප ලබා දෙන පුණ්‍ය ක්‍රියාවන් තිබෙනවානම්, ඒ සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ වන්නේ මෛත්‍රී භාවනාවයි කියලා. සඳ සියළු තාරකා පරදවා දිලිසෙනවා වගේ අනෙක් සියළුම පුණ්‍ය ක්‍රියා පරදවා මෛත්‍රී භාවනාව ආනිශංසදායක වෙනවාය කියලා. පිංවත් ඔබ හොඳින් මෛත්‍රී භාවනා පුහුණු කලොත් ඉහත ආනිශංස සියල්ලම ලැබෙනවා. නමුත් එම ආනිශංස සියල්ලම අනිත්‍යයි. වෙනස් වෙනවා. මෛත්‍රියේ, ශක්තිමත් ආශ්වාදයක් තිබෙනවා. ආශ්වාදයේ තීව්‍රරභාවය නිසාම ආදීනවය ප්‍රකට නොවී සැඟවී තිබෙනවා. භික්ෂුවට මතකයි එක්තරා ගොවි ගම්මානයක භික්ෂුව පිණ්ඩපාතයේ වඩින කොට එක්තරා අතුරු කුඩා පාරක පිණ්ඩපාතයේ වැඩිය, තවම පාත්තරයට ආහාර කිසිවක් ලැබිලා නැහැ. මීට පෙර එම අතුරු පාරේ භික්ෂුව වැඩම කරලත් නැහැ. එම ගුරු පාර දිගේ භික්ෂුව පළමු ගෙදරට වැඩම කළා. ගෙදර ඉදිරිපිට ටික වේලාවක් වැඩ සිටින විට, ගෙදර මහත්මයෙක් එළියට පැමිණ හාමුදුරුවනේ, අද උදේට ආහාරයක් හැදුවේ නැති බව ප්‍රකාශ කලා. භික්ෂුව එම මහත්මයාට පින් අනුමෝදන් කොට ඉදිරියට වැඩම කලා. දෙවැනි නිවසට ටික දුරක් තිබුනා. දෙවැනි නිවසේ වැට කඩුල්ල ඇතුල්වෙනකොටම භික්ෂුව දුටුවා නිවැසි කාන්තාවක් නිවස ඇතුලට වේගයෙන් ගියා. ඇය නැවත එළියට පැමිණියේ නැහැ. භික්ෂුව නිවස ඉදිරිපිට ටික වේලාවක් වැඩ සිට තුන්වැනි නිවසට වැඩම කළා. එම නිවසේ දොර ජනෙල් වසා තිබුණා. ඊට පසු භික්ෂුව හතරවැනි නිවසට වැඩම කලා. එම නිවසේ දොර ජනෙල් විවෘතව තිබුණා. කිසිවෙක් පෙනෙන්නට සිටියේ නැහැ. මේ ගෙවල් හතරට කිලෝමීටරයකට කිට්ටුවෙන්න භික්ෂුව වැඩම කරලා. ඒත් පාත්‍රයට කිසිදු ආහාරයක් ලැබුණේ නැහැ. භික්ෂුව නැවත ප්‍රධාන මාර්ගයට පැමිණීමට ආපසු හැරුණා. භික්ෂුව පිණ්ඩපාතයේ වැඩියේ මෛත්‍රී සංඥාවෙනි. මේ දුප්පත් ගම්මානයේ නිවැසියන් උදේට ආහාර නැතුවයි ගත කරන්නේ එය සංසාර අකුසල් විපාකයක්. එම පිංවතුන් කෙරෙහි මෛත්‍රියක්මයි භික්ෂුව තුල වැඩුනේ. මේ ගම් වැසියන්ගේ දුප්පත් බව එම ගම් වැසියන්ව දැකලා දන් පූජා කිරීමේ නොහැකියාව දැකලා භික්ෂුව තව තවත් මෛත්‍රී සංඥාවමයි වැඩුවේ. භික්ෂුවගේ මුළු ශරීරයම මෛත්‍රියේ ආශ්වාදයෙන් කුල්මත් වෙලයි තිබුණේ. සැම රෝම කූපයක්ම සිසිල් වෙලයි තිබුණේ. භික්ෂුවට එම අතුරු පාරේ කිසිදු

ආහාරයක් නොලැබ නැවත ආපසු හැරී වැඩම කළේ මහ පොළොවට ඉහළින් වගෙයි භික්ෂුවට දැනුනේ. දෙපා පොළවෙන් ඉහළයි තිබෙන්නේ කියලා. නමුත් දෙපා මහපොළව මතයි තිබුණේ. මෛත්‍රී භාවනාවට පුළුවන් මේ ශරීරය සියුම් කොට, සැහැල්ලු කොට ඉහළට ඔසවන්න. එවැනි ආශ්වාදයක් මෛත්‍රිය තුළ තිබෙනවා. නමුත් මේ ආශ්වාදය අනිත්‍යයි. ඒ නිසාමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ හොඳින් සිහිය පිහිටලා, මෛත්‍රී භාවනාව වඩනවානම් සිත කෙලෙසුන්ගේ නැසීම දකිනවා කියලා. ඒ කියන්නේ විදර්ශනා නුවණින් මෛත්‍රී භාවනාවේ ආනිශංස දැක්කොත් තමයි කෙලෙසුන්ගේ නිදහස් වීම සඳහා මෛත්‍රී භාවනාව ප්‍රයෝජනයට ගත්තා වෙන්නේ. එසේ නොමැතිව පිංවතුන් මෛත්‍රී භාවනාවේ ආශ්වාද පක්ෂයට වහල් වෙලා මෛත්‍රී වැඩුවොත් එය මාර ධර්මයක් වෙනවාමයි. මෛත්‍රී භාවනවා හොඳින් පුහුණු කරලා එහි ආනිශංස වශයෙන් ශරීරය ප්‍රසන්න භාවයට, නිරෝගි භාවයට පත්වෙන කොට එම ආශ්වාදයේ අනිත්‍ය භාවය දැකලා මෛත්‍රී භාවනාවට සැබෑම වටිනාකම ලබාදෙන්න. මෛත්‍රී භාවනාව වඩලා අනාගතයේ නැවත දෙවියෙක්, බ්‍රහ්මයෙක් වේවා කියලා ප්‍රාර්ථනා කරන්න එපා. ඔබ එහෙම ප්‍රාර්ථනා කළොත් අනාගත පංචඋපාදානස්කන්ධයකුයි ප්‍රාර්ථනා කරන්නේ. මෛත්‍රිය කියන කාරණය ඔබ තුළ වැඩෙන්නේ පංචඋපාදානස්කන්ධයක් හැටියටයි. රූපය අනිත්‍ය නම්, මෛත්‍රී භාවනාවේ විඳීමත් අනිත්‍යයි. මෛත්‍රී භාවනාව වැඩීම තුලින් දීර්ඝායුෂ, නිරෝගිභාවය ලබමින් එම දීර්ඝායුෂ විදර්ශනා නුවණ ඇති කර ගැනීම උදෙසාම යොමුකරගන්න. දිනය පුරාවට මෛත්‍රී භාවනාව පුහුණු කරලා රාත්‍රී නින්දට යනකොට මෛත්‍රී වැඩුවා වූ ඔබේත්, ඔබේ මෛත්‍රියට අරමුණු වුනා වූ අන්‍යයන්ගේත් අනිත්‍යභාවය දකිමින් නින්දට යන්න. එවිට එම රාත්‍රිය යහපත් රාත්‍රියක් වේවි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අතීතයේ සුනේත්ත කියලා ශාස්තෘවරයෙක් සිටියා කියලා. මොහුට ශ්‍රාවකයින් දසදහස් ගණනින් ඉඳලා තිබෙනවා. සුනේත්ත ශාස්තෘවරයාගෙන් ශාස්ත්‍ර උගත් ශිෂ්‍යයින් සියළු දෙනාම මරණින් පසු බ්‍රහ්මතල, දිව්‍යතල වලමයි උපත ලැබුවේ. මනුෂ්‍ය ලෝකයේ උපත ලැබුවොත් රජකුලයේ, සිටු කුලයේ, බ්‍රහ්ම කුලයේ, ගම්පති කුලවල තමයි උපත ලබන්නේ. පින නිසාම කිසිම ශිෂ්‍යයෙක් ඊට පහළ උපතක් ලබලා නැහැ. සුනේත්ත ශාස්තෘවරයා තම ශිෂ්‍යයින්ට මෛත්‍රිය වැඩිම ගැනමයි කියලා දෙන්නේ. මේ සුනේත්ත ශාස්තෘන්වරයාද මරණින් මතු බ්‍රහ්මළලයේ උපත ලබනවා. බ්‍රහ්ම ලෝකයේදී මේ සුනේත්ත ශාස්තෘවරයා තමන්ගේ අතීත ශිෂ්‍යයින් සමඟ සමතත්ත්වයේ බ්‍රහ්මයෙක් වශයෙන් තමයි උපත ලබන්නේ. සුනේත්ත බ්‍රහ්මයා කල්පනා කරනවා පරලොවදී ශිෂ්‍යයින්ට සම වීම සුදුසු නැහැ. එම නිසා බ්‍රහ්ම සංඥාවන්ගෙන් මිදි නැවත මනුෂ්‍යලෝකයේ උපතක් සකස් කොටගෙන සත්වසක් මෛත්‍රිය වැඩුවා. මෛත්‍රී ධ්‍යාන පුරුදු කලා. මෙම පුණ්‍ය මහිමයෙන් කල්ප සියයක් නැවත මනුෂ්‍ය ලෝකයට පැමිණියේ නැහැ. සියළු ශිෂ්‍ය බ්‍රහ්මණයින්ට අධිපති මහා බ්‍රහ්මයා වුණා. තිස් වතාවක් ශක්‍ර දෙවියා බවට පත්වුනා. තිස් වතාවක් සක්විති රජ බවට පත් වුණා. රන් රුවන් මතු වෙන මහා තේජස සහිත දහසකට වැඩි සතුරු සේනා පරදන දරුවන් ලැබිලා තියෙනවා. මෛත්‍රී ආනිශංස නිසාම මෙසේ සුනේත්ත ශාස්තෘවරයා මහා යස ඉසුරු ලැබුවද ඔහු තවමත් කාමයන් පසුපස හඹායන්නේ ආර්ය ශීලය, ආර්ය මෛත්‍රීය, ආර්ය සමාධිය නොදන්නා නිසාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ නිසාම සුනේත්ත ශාස්තෘවරයා ආර්ය ප්‍රඥාව කියන්නේ කුමක්ද කියලා දන්නේ නැහැ. විදර්ශනා නුවණ ඇතිකොට ගන්නාතාක් කල් සත්වයා කාමයේ ආශ්වාදයෙන් මිදීමක් නොලබනවාය කියන කාරණය ඔබට පැහැදිලියි. සුනේත්ත ශාස්තෘවරයා කල්ප සියයක් මහා බ්‍රහ්ම සම්පත, ශක්‍ර සම්පත් සක්විති රජ සම්පත් යන භවගමනේ අග්‍රම යසඉසුරු ලැබුවත් මොහු තවම සතර අපායෙන් මිදී නැතැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. කාමයේ ආශ්වාදය, වේදනාවේ ආශ්වාදය, රූපයේ ආශ්වාදයෙන් මොහු මත් වෙලයි සිටින්නේ.

කහවුණු වැස්සක් වැස්සත් සත්රුවන් වැස්සක් වැස්සත් වස්තුකාම, ක්ලේෂකාමයන්ගෙන් සත්වයා තෘප්තිමත් නොවේය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. සුනේත්ත ශාස්තෘවරයා විසින් දේවභාෂිතයක් ලෙසින් ජීවිතයට එකතු කොට ගත් අනාර්යය ශීලය, අනාර්යය සමාධිය, අනාර්යය ප්රඥාව නිසාමයි,මොහු නුවණින් අන්ධභාවයට පත්වී සිටින්නේ. නුවණින් අන්ධසත්වයාගෙන් ස්වල්පදෙනෙක් පමණයි, ලිහිණි වැද්දෙක් එලූ දැලට හසුවී එයින් මිදී පලායන වටුවෙක් මෙන් නිවන් මහට අවතීර්ණ වෙන්නේ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ දක්ෂභාවය ඔබට ලබා දෙන්නේ ආර්ය ශීලයයි, ආර්ය සමාධියයි, ආර්ය ප්රඥාව විසින්මයි. නමුත් සුනේත්ත ශාස්තෘවරයා විමුක්තිය වශයෙන් දැක්කේ වෙනස් වන දෙයක්. නෙක්ඛම්මය උදෙසායි අපි සිල්පද ආරක්ෂා කරගන්න ඕනේ. සමාධිය පුහුණු කරන්න ඕනේ. තෘෂ්ණාව හීන කරගැනීම උදෙසායි ශීලය, සමාධිය, ජීවිතයට එකතුකොට ගත යුත්තේ. කුමක් කෙරෙහි තෘෂ්ණාවද, පංචඋපාදානස්කන්ධය කෙරෙහි ඇතිකරගත් තෘෂ්ණාව, රූප කොපමණ දැක්කත්, විඳීම් කොපමණ ලැබුවත්, ඒවායේ ඇති වීමක් අපට නැහැ. සංස්කාරයන්ගේ විවිධත්වය මත, අපට ලැබුණු දෙයට බැඳෙනවා. ලාටු ගුලියකට බැඳී යන වඳුරු පැටවෙකු වගේ අප තුළ ශීලය රැකෙන්නෙත්, සමාධිය වැඩෙන්නෙත්, පංචඋපාදානස්කන්ධයන් වශයෙන්මයි. මේ උපාදානයන්ට බැඳෙන සත්වයා නුවණින් අන්ධභාවයට පත්වෙලා කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

භික්ෂුව මේ කටු සටහන ලියන මොහොතේ වැඩ සිටින්නේ දුප්පත් ගොවි ගම්මානයක. ප්රධාන පාරේ සිට කිලෝමීටර හයක් පමණ ඈතින් මෙම ගම්මානය පිහිටා තිබෙන්නේ. ගම්මානයට පැමිණෙන බොරළු පාරේ දිනකට දෙවතාවක් පමණක් ගමට පැමිණෙන බස් රථයක් තිබෙනවා. සමහර දාට බස්රථය කැඩිලා, වැස්ස කාලයට පාර එරෙන නිසා බස් රථය ගමට එන්නේ නැහැ. එදාට පාසල් දරුවන් පවා හිමිදිරි උදේම පයින් තමයි පාසලට යන්නේ. වගා කරන බෝගත් කර තබා ගෙන මහ පාරට පොළට යනවා. මේ දවස් වල ගමේ හැමෝම කුඹුරු වැඩ. සමහරුන්ගේ කුඹුරු තිබෙන්නේ ගමෙන්, කිලෝමීටරයක් පමණ ඈතින් කැලය මැද. උදෙන්ම හීල් බත් අනුභව කරලා තවත් බත් මුලක් බැඳගෙන කන්දක් නැඟලා කුඹුරු වලට යනවා. එක එළවළුවකුයි බතුයි තමයි ප්රධාන ආහාරය. මේ අය දුකක් විඳින්නේ. නමුත් මේ අයට දුකක් පිළිබඳව තේරුමක් නැහැ. බුලත් විටක් හපලා සතුටින් සිටින්නේ. තමන්ට තිබෙන දෙය ගෞරවයෙන් හොඳින් දන් දෙනවා. දවසක් දානය පූජා කරපු මහත්මයෙක්ගෙන් භික්ෂුව විමසුවා. මහත්තයෝ දානේ පූජා කරලා මහත්තයා කුමක්ද බලාපොරොත්තු වෙන්නේ කියලා, ප්රාර්ථනා කරන්නේ කියලා මේ මහත්මයා බොහොම ආඩම්බරයෙන් ප්රකාශ කලා ලබන ජීවිතයේදී මේ ගමේම ඉපදෙන්නයි කියලා. ඒ වේලාවේ භික්ෂුව ඔහුට ප්රකාශ කලා මේසා දුෂ්කර ගම්මානයක රාත්රී කාලයට අලින් සමඟ ඔට්ටුවෙලා, පැල් රැකලා, වැස්ස දවසට බස් එන්නේ නැති මෙහෙම දුකක් විඳලත්, ආයිත් මේ ගමේ මොකට උපදින්න ප්රාර්ථනා කරනවාද කියලා. ඒ වේලාවේ තමයි ඒ මහත්මයා හිතන්න ගන්නේ තමන් විඳින්නේ දුකක්ය කියලා. පංචඋපාදානස්කන්ධයට බැඳිලා, දුක කියන කාරණට තෘෂ්ණාවේ, කුණු රොඩු වලින් මැකීගොස් තිබෙන්නේ. කල්යාණමිත්ර ඇසුර නැති නිසාම නුවණින් මෙනෙහි කිරීම කියන කාරණය දන්නේ නැහැ. සැපය ගැන කියන සද්ධර්ම ශ්රවණය ඇසෙන්නේ නැහැ, නුවණින් මෙනෙහි කරන්න. තමන්ට සංස්කාරයන් නිසාම ලැබුණු ජීවිතයට බැඳිලයි සිටින්නේ. සුනේත්ත ශාස්තෘවරයා යම් සේද, කාමයේ, වේදනාවේ, ආශ්වාදයට තෘෂ්ණාවෙන් බැඳී සිටින්නේ, මේ ගමේ පිංවතාත් තමන්ට ලැබුණු දෙය කෙරෙහි ඒ ආකාරයෙන්මයි බැඳී සිටින්නේ. ඉහත අනතුර පිංවත් ඔබ නුවණින් දකිමින් රාත්රියට නින්දට යන්න. පිංවත් ඔබ ආරක්ෂාකොට ගත් ශීලය ආර්ය ශීලයක් බවට මේ රාත්රීයේ පත්කරගන්න. ශිල්පද ආරක්ෂා කරගැනීම නිසාම පිංවත් ඔබට ලැබෙන ආනිශංස ධර්මයන් වන තමාගේ කීර්තිය පැතිරෙනවා. ඕනෑම සභාවකට චකිතයකින් තොරව යනවා. අප්රමාදී බව ඇතිවෙනවා. සිහිනුවණින් මිය

යනවා. සුගතියේ උපදිනවා. කියන කරුණු කාරණාවල අනිත්‍යභාවය දකිමින් නින්දට යන්න. සුනේත්ත ශාස්තෘන්වරයාත් දිවිහිමියෙන් සිල්පද ආරක්ෂා කරගත්තා. ඒ තුලිනුයි මෛත්‍රී සමාධිය අර්ථවත් වුනේ. නමුත් ශීලය නිසා, මෛත්‍රීය නිසා ලැබෙන ආනිශංස ධර්ම වලට තෘෂ්ණාවෙන් බැඳුණා. ඒ නිසාම ඔහු තුළ ආර්ය සමාධියක් සකස් වුනේ නැහැ. ඔහු විමුක්තිය කොට අල්ලා ගත්තේ ආශ්වාදයේම අන්තයක්. උතුම් අවස්ථාවක් අපට මුණ ගැසෙන්නේ බොහෝම කලාතුරකින්, සුනේත්ත ශාස්තෘවරයාට නම් කල්ප සියයකින් වත් එවැනි උතුම් අවස්ථාවක් මුණගැසිලා තිබෙනවා. ශීලයත් ආර්ය ශීලයත් අතර වෙනස හඳුනා ගන්න. සමාධියත් ආර්ය සමාධියත් අතර වෙනස හඳුනා ගන්න. ඒ උතුම් අවස්ථාවට ආශ්වාදයේ කෙටි සැපයට බැඳිලා අතපසු කොට ගන්න එපා. අතීතයේ මෙවැනි අවස්ථාවන් අහිමි කොටගත් හුඟදෙනෙක් සිටියා. ඉන් එක්කෙනෙක් තමයි සුනක්ඛත්ත හාමුදුරුවෝ. බුදුරජාණන් වහන්සේගේ උපස්ථායකයා වශයෙන් කෙටි කලක් සිටියත් ඒ උතුම් අවස්ථාව අහිමිකොට ගත්ත. සම්මා දිට්ඨියෙන් තොරව සම්මා විමුක්තියක් සොයන මනුෂ්‍යයෝ අවසානයේ අයිති කොට ගන්නේ මිත්‍යා විමුක්තියයි. එම නිසා ගොඩාක් දේවල් පිංවතුන්ලාට සමාජය තුලින් ඇසෙන්න පුළුවන්. නමුත් වඩාත්ම නිවැරදි තැන නැවතීමට පිංවතුන්ලා දක්ෂ විය යුතුයි. වඩාත් නිවැරදිම තැන උතුම් සද්ධර්මයයි.

වර්තමාන සමාජයේ පිංවත් ඔබට අසන්නට දකින්නට ලැබෙන්නේ, ඔබ කැමති කරන දේවල් නොවේ. එයත් අපේ කර්ම විපාකයක්. කර්මයත්, කර්මඵලයත් කියන කාරණය අවබෝධයෙන් දකිනතාක්කල් පිංවත් ඔබට මේ පරස්පර හඳුනාගන්න බැහැ. අපි එකිනෙකාට ඇඟිල්ල දිගුකරමින් යහපත් හෙටක බලාපොරොත්තුයි ඇති කරගන්නේ. නමුත් හැමදාම උදාවෙන දවස ඊයේට වඩා බියකරු දවසක්. මේ විකෘතිභාවය මනුෂ්‍යයා තුල ඇතිවන්නේ කාමච්ඡන්දයන් නිසාමයි. සිතේ ඇතිවෙන කාම සිතුවිල්ලකට නිදැල්ලේ යන්න ඉඩහැරියම ඉතාමත් නිරිලැජ්ජිත අවසානයකටයි ඔබ පත්වෙන්නේ. මෙහි ඵලය තමයි වර්තමාන සමාජය තුල ඔබ දකින්නේ. එම නිසා යහපත් හෙටක් ගැන බලාපොරොත්තු පසෙක තබා උදාවෙන හෙට ගැන කළකිරීම් ඇති කොට ගන්න, පිංවත් ඔබ මෙහෙම සිතන්න. කාමාතුර මනුෂ්‍යයෙක් සිටිනවා. මේ මනුෂ්‍යයා කාමයෙන් අන්ධවෙලා, ළදැරියක් දූෂණය කොට මරා දමනවා. මේ කාමාතුර මනුෂ්‍යයා යම් දවසක මිය යන මොහොතේ ඔහු කළ අතිභයානක අකුසලය සිහිපත් වී නිරයන්ට වැටිලා දීර්ඝකාලයක් අප්‍රමාණ දුක් විඳලා යම් දවසක මනුෂ්‍ය ජීවිතයක් ලැබුවොත් ස්ත්‍රී ලිංගිකවයි උපදින්නේ. ඇයි කුඩා වයසේදීම තවත් කාමාතුරයෙකුගේ හිංසාවට ලක්වෙලා මිය යනවා. මෙතන තිබෙන්නේ නිවැරදි කළ හැකි දෙයක් නොවේ. අවබෝධ කළයුතු දෙයක්. අතීත සංස්කාරයන්ගේ ඵලයයි. සමාජයේ ඇති වෙමින් පවතින කාමරැල්ල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කාමය කියන්නේ ගිනි අඟුරු වළක්ය කියලා, ගිනි පෙනෙල්ලක්ය කියලා. තියුණු මුවහත ඇති සැතක්ය කියලා. කාම සිතුවිල්ලක මොන තරම් රුදුරු බවක්, බියකරු බවක්, සැඟවිලා තිබෙනවාද. ප්‍රේත ලෝකයේ මහා නිරිලැජ්ජිත ප්‍රේතයෝ, ප්‍රේතියෝ සිටිනවා. පිංවත් ඔබ දැක ඇති සමාජයේ සිටිනවා, විකෘති කාම මානසික තත්ත්වයන් තිබෙන මනුෂ්‍යයින්. බස් රථයේදී, දුම්රියේදී, සිනමාශාලාවේදී, මුහුදු වෙරළේදී, කාන්තාවන් දිය නාන තැන්වලදී මෙවැනි විකෘති මනුෂ්‍යයින් ඔබ දැකලා ඇති. මේ අය නිසා ඔබ අප්‍රමාණ පීඩාවට පත්වෙලා ඇති. මේ පුද්ගලයින්ගේ විකෘති කාම මනෝභාවයන් නිසාම මෙම අය මරණයෙන් පසුව උපත ලබන්නේ සිල්වත් භාවයෙන් තොර කාන්තාවන්ගේ කිහිලි වල, ඉකිලිවල ආශ්‍රිත ශරීර අවයව වල. එම ශරීර අංග තෘෂ්ණාවෙන් උපාදානයකොටගෙන ජීවත් වෙනවා. විකෘති කාම ප්‍රේතියන්, බස් රථයක් ඇතුළේ සිටිනවා භික්ෂුවක් සමාධිය තුලදී දැක තිබෙනවා. පෙර මනුෂ්‍යය ජීවිතයේදී තිබූ කුණු ආශාවන් ප්‍රේත ජීවිතයේදී වඩාත් හොඳින් සිද්ධ කරනවා. කාමයේ වරදවා හැසිරෙන පිරිමියෙක් නැවත මනුෂ්‍ය ජීවිතයක් ලැබුවොත් ඔහු නපුංසකයෙක්මයි. ස්ත්‍රී ලිංගිකවයි උපත ලබන්නේ. ලිංග පෙරලියක් කිරීමට තරම් භයානක භාවයක් කාමයේ වරදවා හැසීරීම තුල සැඟවී තිබෙනවා. සංස්කාරයන් සමඟ අපිට

හැංගිමුත්තන් කරන්න බැහැ. මැරෙන මොහොතේ බලවත්ම අකුසලය මතුකොට දෙනවා ඊළඟ ප්‍රතිසන්ධියට. සංස්කාරයන්ගේ සැබෑ ස්වභාවය නොදන්නා, පිංවතුන් වැරදිකරුවන්ට දඬුවම් දෙන්න කියලා අධිකරණයට යනවා. විත්තිකරුවා වැරදිකරුවා වුනොත් ජම්පරයක් පැළඳගෙන සිරදඬුවමක් විඳිවී. පිංවත් ඔබ වැරැද්දට දඬුවම හැටියට දකින්නේ මොන තරම් සරළ දෙයක් ද සරළ දඬුවමටත් විරෝධය පළ කරන්න, සිරකරුවන්ගේ, සැකකරුවන්ගේ, මානුෂික අයිතීන් උදෙසා පෙනී සිටින සංවිධාන කොතෙක් තිබේද. මේ මොහොතේ භික්ෂුවට සිනාවක් ඇතිවුණා. මනුෂ්‍යයා මොනතරම් මුලාවකද ඉන්නේ කියලා. අකුසල් සංස්කාර විසින් සත්වයාට මොන තරම් නම් බියකරු විෂම විපාකයන් සතර අපායේදී විඳීමට සලස්වනවාද කියලා. මේ මානුෂික අයිතීන් වෙනුවෙන් පෙනීසිටින කණ්ඩායම් දන්නවා නම් මේ උතුම් කර්මය, කර්මඵලයන් ගැන දේශනා කොට වදාළ ලොව්තුරා බුදුරජාණන්වහන්සේටත් "අමානුෂිකයි" කියන චෝදනාව එල්ල කරාවි.

සිරකරුවන් ගැන කතා කරන විට නිතැතින්ම නීති ක්ෂේත්‍රය තමයි මතකයට එන්නේ. වර්තමාන නීති ක්ෂේත්‍රය කියන්නේ හොඳින් මුදල් ගැවසෙන තැනක්. බුදුරජාණන් වහන්සේ මුදල් කියලා කියන්නේ සර්පයාට. ඒ කියන්නේ නීති ක්ෂේත්‍රය කියන්නේ හොඳින් සර්පයින් ගැවසෙන තැනක්. ඒ නිසාම එම ක්ෂේත්‍රයේ සැම දෙනාම බොහෝම පරිස්සම් වෙන්න ඕනේ. මෙවැනි සර්පයින් දෂ්ඨ කොට මිය ගොස් ප්‍රේත ලෝකයේ බරපතල වැඩ සහිත සිර දඬුවමක් විඳින ප්‍රේතයෙක් ගැන බුදුරජාණන් වහන්සේ ලක්ඛණ ස්වාමීන් වහන්සේට දේශනා කරනවා. මේ ප්‍රේතයා ඇවිදින්නේ කළගෙඩියක් වන් තම අන්ඩකෝෂය කරේ තබා ගෙන. මේ ප්‍රේතයා ඉඳ ගන්නේ තමාගේ කළගෙඩියක් වන් තම අන්ඩකෝෂය මත. ඒ නිසාම ඉඳගන්නා මොහොතක් පාසා වේදනාවට පත්වෙනවා. දකුණු පැත්තේ කරට මෙම අන්ඩකෝෂය ගනිද්දි එහි බරට මෙම ප්‍රේතයා දකුණට ඇලවෙනවා. වම් කරට කළගෙඩියක් වන් අන්ඩකෝෂය ගනිද්දී වම් පැත්තට ඇලවෙනවා. අතීතයේ කල අකුසල් හේතුවෙන් තමා තුලින්ම තමා දුකට පත්වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ප්‍රේතයා පෙර ජීවිතයේ රජගහ නුවර සිටි නීතියට සම්බන්ධ මහත්මයෙක්ය කියලා. අධිකරණයේ පාරිශුද්ධත්වය සංකේතවත් කරන "තරාදියේ" සමබර නොවන ආකාරයට තීන්දු කිරුව නිසා තමාගේම කළගෙඩියක් වන් අන්ඩකෝෂයම විපාකය පිණිස සකස් වෙලා. අන්ඩකෝෂය වම් කරට ගනිද්දි වම් පැත්තට බර වෙනවා. අන්ඩකෝෂය දකුණු පැත්තට ගනිද්දි දකුණු පැත්තට බර වෙනවා. ලාභ සත්කාර හේතුවෙන්ම පැමිණිල්ලටත්, විත්තියටත් බර දීම නිසාමයි. මේ ප්‍රේතයා තම කළගෙඩියක් වන් අන්ඩකෝෂයෙන්ම එම දුක විඳින්නේ. මෙහි වඩාත්ම දරුණු කාරණය වන්නේ මොහු අවුරුදු ලක්ෂ ගණනක් නිරයේ දුක් විඳලා තමයි මේ ප්‍රේත ජීවිතය ලබා තිබෙන්නේ. මුදල් නැමැති සර්පයින් වැඩිපුර ගැවසෙන ස්ථාන අපි බොහෝම පරිස්සමින් පරිහරණය කරන්න ඕනේ. එසේ නොවුන හොත් අසාධාරණව හම්බ කරපු සල්ලි වල බරටම ඔබට මතු ජීවිතයේදී කළගෙඩියක් වන් අන්ඩකෝෂයක් ලැබෙන්නට පුළුවන්. එම නිසාම මුදල් වැඩිපුර ගැවසෙන තැන්වල පිංවතුන් සිතන්න දක්ෂ වෙන්න ඕනේ තමන් සාක්කුවට දමා ගන්නේ සර්පයින් බව.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දේවදූත සූත්‍රයේදී නිරයේ ඉපදුනු කෙනාට යමපල්ලෝ යකඩ පොළවක බාවනවා, එහෙම බාවලා පිහියා වලින් සහිනවා, නැවත ඔළුවෙන් සිටවලා පිහියෙන් සහිනවා, ගිනියම් වූ යකඩ පොළොවේ ඇවිද්දනවා, බෙලිගෙඩි තරමට බුබුළු දමන ලොහොකුඹු නිරයේ ඔබනවා කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අසූචි නිරයේ සිටින තියුණු තුඩු ඇති පණුවන් ඔහුගේ සිවිය සිදුරු කරනවා. සිවිය සිඳ මස් සිදුරු කරනවා, මස් සිදුරු කොට නහර සිදුරු කරනවා, නහර සිදුරු කොට ඇට සිදුරු කරනවා. ඒ නිසා මොහු තියුණු දුකකට පත් වෙනවා කියලා. නිරයේ සත්වයාට යමපල්ලන්

ගින්දරත්, ලෝදියත් සමඟින් ලබා දෙන දුක මේ මානව හිමිකම් සංවිධාන වල මහත්වරුන් දන්නවා නම් කුමකින් කුමක් වේවිද, සුළු පටු මෝහයකද ලෝකයා වෙලී සිටින්නේ.

උදේනි රජතුමාගේ මාගන්දියා බිසව ද්වේෂය නිසාම උදේනි රජුගේම සාමාවති බිසව ඇතුළු පරිවාර කාන්තාවන් පන්සියයක් දෙනාව සාමාවති බිසවගේ මාළිගාවට ගිනි තබා මරා දැම්මා. මාගන්දියා බිසවගේ ද්වේශ සිතුවිල්ලට තෙරුවන් සරණ පිහිටිය පන්සියයක් කාන්තාවන් අඟුරු බවට පත් වුණා. ඒ අඟුරු තුළින් මාගන්දියා බිසවගේ ද්වේශ ගින්න නිවිලා ගියා. භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කරනවා ඊයේ රාත්‍රියේ උදේනි රජුගේ සාමාවති බිසව ඇතුළු කාන්තාවන් පන්සියයක්දෙනා මාළිගාව ගිනිගෙන මිය ගියාය කියලා. බුදුරජාණන් වහන්සේ ඒ මොහොතේ මතක් කරනවා සාමාවතිය ඇතුළු මිය ගිය සෑම කාන්තාවක්ම තෙරුවන් සරණ පිහිටිය නිසාම සුගතියේ උපත ලැබුවේ කියලා. කාන්තාවන් පන්සියක දෙනාගෙන් සමහරු අනාගාමී ඵලයට පත් වී සකෘදාගාමී ඵලයන්ට පත්වී, සෝවාන් ඵලයන්ටද පත්වී දිව්‍යතලවලම උපත ලැබුවාය කියලා. ද්වේෂයෙන් මුලාවට පත්වෙච්ච මාගන්දියා බිසව දැක්කේ පිච්චී මිය ගිය සාමාවතිය ඇතුළු කාන්තාවන් පන්සියයක් දෙනාගේ අඟුරු ගොඩාක්. මාගන්දියා බිසවගේ ද්වේෂ සිතුවිල්ල ක්‍රියාත්මක කිරිම තුළින් පන්සියයක් තෙරුවන් සරණ පිහිටිය සාමාවතිය ඇතුළු කුල කතුන් සුගතියට මාර්ගය සකස් කොට ගත්තා. මාගන්දියා බිසවට අත්වූයේ ද්වේශයයි. එම ද්වේෂයට හසුවී පිච්චී මිය ගිය බිසෝවරුනට සුගතිය හිමිවුණා. එක්තරා භික්ෂුවක් උතුම් සමාධියේ අරමුණු කොට බලනවා මාගන්දියා බිසව මේ මොහොතේ සිටින්නේ කොතනද කියලා. භික්ෂුවට දර්ශනය වෙන්නේ පිච්චි අඟුරු වෙච්ච මුහුණක්. පිංවත් ඔබ ඔබේ හිස ප්‍රමාණයේ අඟුරු කැබැල්ලක් අරගෙන එම අඟුරු කැබැල්ලේ මනුෂ්‍යය මුහුණක් කැටයම් කරන්න. හිසකෙස් නැති තට්ට හිසක් සහිත අඟුරු කැබැල්ලක් වැනි පිච්චී ගිය මුහුණක් සහිත නිරයේ දුක් විඳින වර්තමාන මාගන්දිය බිසව භික්ෂුවට අරමුණු වෙනවා. එම නිරිසතාගේ මුහුණ බොහෝම තියුණු වේදනාවකින් පෙළෙන පිච්චීගිය අඟුරු කැබැල්ලක්මයි. මනුෂ්‍යයෙක් පණ පිටින් ගිනි ගන්නා විට ඔබ මෙනෙහි කරන්න එම පිච්චෙන මනුෂ්‍යයාගේ මුහුණේ ඇති වේදනාත්මක ඉරියව්. අන්න ඒ ඉරියව්වේ ස්වභාවයෙන් වේදනාත්මක මුහුණක් මෙම නිරිසතාට තිබෙන්නේ. පේනවා නේද මාගන්ධියා බිසවගේ ද්වේෂ සිත මාගන්දියාට ලබලා දුන්න දඬුවම. පිංවත් ඔබ වැරැද්දට දඬුවම හැටියට දකින මනුෂ්‍යලෝකයේ සිරදඬුවම, මරණ දඬුවම, කස පහර වගේද මෝහයෙන් මිදී අකුසල් සංස්කාරයන්ගේ බියකරු රුදුරු බවම දකින්න. වැරදි කරන ලෝකයා වැරදි කරපුදෙන්, ඔබ දඬුවම් දෙන්න යන්න එපා. පොලිසිය, උසාවිය ගානේ ඔබ රස්තියාදු වෙන්න යන්න එපා. අනුන් කරපු වරදක් නිසා ඔබ පොලිසිය උසාවිය ගානේ ඔබ රස්තියාදු වෙනවා කියන්නේ ඔබ ඔබට දඬුවම් කරගන්නවාය කියන කාරණයයි. එය වැරදිකරුවා කෙරෙහි ඔබ තුල ඇති කරගන්නා ද්වේෂයේ දිට්ඨධම්මවේදනීය අකුසල් විපාකයයි. පිංවත් ඔබ අකුසලය දැක කුසලයෙන් ශක්තිමත් වෙන්න. ඔබ තව තව නිවැරදි වෙන්න. මාගන්දියා බිසවගේ සිතේ ඇවිළුනු ගින්නෙන් පන්සියයක් සාමාවතිය ඇතුළු බිසෝවරු පණපිටින් ගිනිගනිද්දීත්, එම වේදනාව දරාගනිමින් සියළු සත්වයෝ සුවපත් වෙත්වා කියලා සිතක් සකස් කොට ගන්න දක්ෂ වෙච්ච ඒ සුවපත් වේවායි කියලා සකස් කොට ගත් සිතත් අනිත්‍යයි කියා දකින්න දක්ෂ වෙච්ච සාමාවතිය ඇතුළු තෙරුවන් සරණ පිහිටිය කුල කතුන් පන්සියය දෙනාගේ සිතේ ඇතිවුණ සිතුවිල්ලත් ඔබ ඔබේ සිතේ ඇති කරගන්න. නීතිය කෙරෙහි නොවේ ධර්මය කෙරෙහි විශ්වාසය තබන්න. රජවරු පනවන නීතියටත් අනිවාර්යෙන් ගරු කරන්න. වැරදි කරන අයට දඬුවම් කරන්න ගිහිල්ලා ඔබ ද්වේෂය සකස් කොට ගන්න එපා. මාරයා ලෝකය පටලවා තිබෙන්නේ. පිංවත් ඔබ පැටලෙන්න එපා. සාමාවතිය ඇතුළු බිසෝවරු පණපිටින් ගිනිගනිද්දීත් මාරයා පටලවපු පැටලිල්ලේ පැටළුනේ නැහැ. පංචඋපාදානස්කන්ධය නැමැති මාරයා රූපය කෙරෙහි තෘෂ්ණාවෙන් විඳීම නැමැති පඹගාලේ සාමාවතිය ඇතුළු බිසෝවරු පටලවන්න උත්සහ ගත්තද විදර්ශනා

නුවණින් විදිමේ අනිත්‍යභාවය දැකීමට එම බිසෝවරු දක්ෂ වුනා. නමුත් තෙරුවන් සරණ පිහිටිය සාමාවති බිසවට තිබූ දක්ෂභාවය, සාමාවති බිසවට මහත් සේ ඇලූම් කල උදේනි රජුට තිබුණේ නැහැ. සාමාවතිය ඇතුළු කුලකතුන් මරා දැමීම දරාගැනීමට නොහැකි වූ උදේනි රජතුමා මාගන්දියා බිසව ඇතුළු ඇයගේ සියළුම ඥාති පිරිස අමු අමුවේම පිදුරු දමා ගිනිතබා රාජ දඬුවම් දුන්නා. සුගතියේ මාර්ගඵල ලාභී දිව්‍යාංගනාවන් ලෙස උපත ලැබූ සාමාවතිය ඇතුළු කුලකතුන් නිසා අනුවණ උදේනි රජතුමා මාරයාගේ පඹගාලේ පැටලී මහ අකුසල් කන්දරාවක් සිදුකර ගත්තා. මාරයා ඔබව පටලවාවි, පිංවත් ඔබ පැටලෙන්න එපා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටින කොට භාග්‍යවතුන්වහන්සේට ලැබෙන කීර්ති ප්‍රශංස, ගරු බුහුමන්, නොඉවසූ අන්‍ය තීර්තකයන් සුන්දරී නැමැති පිරිවැජිය පොළඹවාගෙන ඇය ජේතවනාරාමයට නිතර පිටත් කොට ජේතවනාරාමය තුලදීම ඇය අභිරහස් ලෙස මරා දමා ජේතවනාරාමයේ දිය අගලක වල දමනවා. අනතුරුව සුන්දරී පිරිවැජිය අතුරුදහන් වූ බවට කට කථා පතුරුවා ඇයගේ මළ සිරුර පිරිවැජියන්ම ගොඩ ගෙන ඇඳක හොවා සැවැත් නුවර වීථියක් වීථියක් ගානේ ප්‍රදර්ශනය කරමින් බුදුරජාණන් වහන්සේටත්, සංඝයාවහන්සේලාටත් සුන්දරී පිරිවැජිය මරා දැමූ බවට චෝදනාකළා. භික්ෂු සංඝයා අල්ජ්ජිය, දුශ්ශීලයි, පාපස්වභාවයන් ඇත්තෝයි, මුසාවාදීහුයි ආදි වශයෙන් පරිභව කළා. ස්වාමීන් වහන්සේලාට මෙම පිරිවැජියන්ගෙන් හිරිහැර චෝදනා හේතුවෙන් පිණ්ඩපාතයේ වැඩීමට පවා අපහසු වුණා. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ස්වාමීන් වහනසේලාට දේශනා කලේ මේ ශබ්දය බොහෝ කල් පවතින්නේ නැහැ සතියක්ම මෙය පවතින්නේය. සතිය ඇවෑමෙන් මේ ඝෝෂාව අතුරුදන් වෙන්නේය කියලා. ඒ බැවින් ඔබලා යම් මනුෂ්‍යයෙක්, භික්ෂූන් දැක අසභ්‍ය වචනයෙන් චෝදනා කරන්නේ නම් ඔබලා නිහඬව ඉන්න එපා, මේ ආකාරයෙන් පිළිතුරු දිය යුතුයි කියලා. බොරු කියන තැනැත්තා නිරයට පැමිණේ. යමක් කොට නොකලාමයි කියා නම් ඔහුද නිරයට පැමිණේ. පහත්කම් ඇති ඒ මිනිස්සු පරලොවේදී සම දුක් විපාක විදියි, කියලා ශබ්ද නගලා ප්‍රකාශ කරන්න කියලා ස්වාමීන් වහන්සේලාට අවවාද කලා. ස්වාමීන් වහන්සේලා එම අවවාදය ක්‍රියාත්මක කලා. සතියක් ඇවෑමෙන් එම අසත්පුරුෂ ඝෝෂාව අතුරුදහන් ගියා. කෙනෙක්ගේ පංචඋපාදානස්කන්ධය තෘෂ්ණාවෙන් ඇවිලෙන කොට පිංවත් ඔබ නිහඬ වෙන්න. ඔබේ නිහඬ ජීවිතයට ගිනි ඇවිලෙන්නේ නැහැ. පිංවත් ඔබ කලබල වුනොත් චේගවත් වුනොත් අනිවාර්යෙන්ම මධ්‍යම ප්‍රතිපදාවෙන් බැහැරව එක් අන්තයකටයි වැටෙන්නේ.

භික්ෂුව දන්න එක මහත්මයෙක් සිටියා. ඔහු බොහෝම උත්සහයෙන් සද්ධර්මය ශ්‍රවණය කරමින් දන් පූජා කරමින් ජීවිතය ධර්මය දෙට හොඳින් යොමු කොට ගත්තා. මේ මහත්මයා කිහිප වතාවක්ම භික්ෂුවට ප්‍රකාශ කොට තිබෙනවා තමා සද්ධර්මය මුණ ගැසීමට පෙර නරක යහළුවන් ඇසුර නිසා හුඟාක් වැරදි සිදුකරගත්තා කියලා. මොහුගේ යහපත් ක්‍රියාවන් දැකලා භික්ෂුවද මොහුට තව තව පිං සිදුකර ගැනීමට අවස්ථාවක් ලබා දුන්නා. මේ නිසාම මොහුට ධර්මයට සම්බන්ධ යහළුවන් මුණ ගැසුනා. දැන් නරක යහළුවන්ගෙන් මිදිලා මොහු ධර්මයට කැමති යාළුවන්ගේ ඇසුරට පත් වුණා. මෙහිදි ඇතිවන අවදානම දැකලා භික්ෂුව මොහුට අවවාද කලා, හුදකලාව සිටීමයි වඩාත් වැදගත් වන්නේ කියලා. ඒ පිංවත් මහත්මයා එම වැදගත් අවවාදය ගත්තේ නුහුරට. ඒ නිසාම එම අවවාදයෙන් බැහැරව ධර්මයට කැමති යහළුවන් ආශ්‍රය කලා. මේ මහත්මයා තමන් සමඟ යමෙක් කතාකලොත් ධර්මය තමයි කතා කලේ. ඒ නිසාම මොහු ඇසුරු කල ධර්මයට කැමති, නමුත් ප්‍රඥාව නොවැඩුනු යහළුවෝ සැම විටම මොහුව ඔසවා තැබුවා, අපි සාමාන්‍ය ව්‍යවහාරයේදී ප්‍රකාශ කරනවා මුරුංගා අත්තේ තබනවා කියලා. අනුන් තමාව මුරුංගා අත්තේ තැබුවත් තමන් ගහෙන් බිමට බහින්න ඕනේ කියන අවබෝධය ඔහුට තිබුණේ නැහැ. අනුන් දෙන ලකුණු නිසා ඇතිවන ආශ්වාදය ඔහු දැක්කේ අවබෝධයක් හැටියට. දවසක් මේ

මහත්මයා ධර්ම සාකච්ඡාවක් අවස්ථාවේදී භික්ෂුවට කියනවා නිවන් අවබෝධය කියන එක කොච්චර ලෙහෙසි දෙයක්ද කියලා. ඒ වචන පෙල ඔහුගේ මුවින් ඇසෙන කොට එම පිංවත් මහතා මොන තරම් මුලාවක වැටිලාද කියන කාරණය පැහැදිලි වුණා. ඒ අවස්ථාවේ භික්ෂුව ඔහුට අවවාද කලා නිවන් අවබෝධය කියන කාරණය ඉතා ලෙහෙසි කාරණයක්ය කියලා නැවත කියන්න එපා කියලා. එය තමා තමාටම කරගන්නා ද්‍රෝහී කමක්ය කියලා. මෙවැනි මුලාවකට ඔහුව පත් කළේ ඔහුගේ ධර්මයට කැමැති යහළුවන්මයි. මේ අවධානම දැකලයි භික්ෂුව ඔහුට අතීතයේදී අවවාද කළේ හුදෙකලාවේම සිටීමයි වැදගත් වන්නේ කියලා. කල්‍යාණ මිත්‍ර ඇසුර තුලින් අපි ධර්මයේ අර්ථවත් කොනක් අල්ලාගන්නා කොටම මාරයා කුමන හෝ තොන්ඩුවක් බෙල්ලේ එල්ලනවා. ඇති කොටගත් අර්ථය මෝහයෙන් විකෘත කරන්න. ධර්මයේ වේශයෙන්මයි මෙතැනදි මාරයා හැසිරෙන්නේ. එම නිසාම බහුතරය මෙතැනදී රැවටීමට හසුවෙනවා. ඉහත පිංවත් මහත්මයා නරක යහළුවන්ගෙන් මිදිලා ධර්මයට කැමැති යාළුවන් ඇසුරු කළාය කියලා අවසානයේදී වෙනසක් වෙලා නැහැ. මුලදී අකුසල් පක්ෂයේ ආශ්වාදයට බැඳුණා, දෙවනුව කුසල් පක්ෂයේ ආශ්වාදය බැඳුණා. දෙතැනදීම වැඩෙන්නේ මෝහයයි. අප්‍රමාදී භාවය කියන වචනයට ඔබේ ජීවිතය තුලින් සැබෑම වටිනාකම ලබාදීමට ඔබ යන මේ ගමනේදී ධර්මයේ වේශයෙන්මයි මාරයා හැසිරෙන්නේ කියන කාරණය හොඳින් සිහිතබාගත යුතු වෙනවා.

ධර්ම සාකච්ඡාවකට පැමිණි මහත්මයෙක් තමන්ගෙ භාවනා කරන හිතවතෙකුට වෙච්ච සිද්ධියක් සඳහන් කළා. තම හිතවතා භාවනා ගුරුවරයෙක් යටතේ භාවනවා පුහුණු වන අයෙක්. මොහු ආනාපානාසති භාවනාව පුහුණු වෙන කොට මැතක සිට මොහුට බඩ පුරවා දැමීමක් සමඟ ඔක්කාරය ඇතිවීමේ ලක්ෂණ ඇතිවෙනවාලු. භාවනා කරන විට නිතර නිතර මේ ලක්ෂණය ඇතිවෙන නිසා මොහු තම භාවනා ගුරුවරයාට උදරයේ ඇතිවන අපහසුතාව ප්‍රකාශ කරලා. ඒ වේලාවේ භාවනා ගුරුවරයා කියනවාලු කලබල වෙන්න බිය වෙන්න එපා. ඔබට ඉක්මනට ඵලයක් ලැබීමේ ලක්ෂණයි ඔය පහළ වෙලා තිබෙන්නේ කියලා. රෝගී භාවයක ලක්ෂණ අවබෝධයක ලක්ෂණ හැටියටයි ගුරුවරයා ප්‍රකාශ කරලා තිබෙන්නේ. මේ වැරදි උපදේශය නිසාම මෙම යෝගාවචර මහත්මයා භාවනාවට වාඩිවී මොහොතකින් තමා තුලින්ම උදරයේ ඔක්කාරයට ඒමේ ලක්ෂණ ඇතිකරගන්නවා. මොකද වැරදි ගුරු උපදේශයක් නිසා ඔහු රැවටිලා මෙම රෝගී තත්ත්වය අවබෝධයක පෙර නිමිති හැටියටයි සිතාගෙන සිටින්නේ. මෙවැනි විහිළු තහළු වලින් පිරුණු සමාජයක හොඳ සිහිනුවණින්මයි පිංවත් ඔබ මේ ධර්ම මාර්ගයේ ගමන යා යුත්තේ. උදාවෙන සෑම රාත්‍රියක්ම පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනා යහපත් රාත්‍රියක් කර ගැනීමට පිංවත් ඔබ දක්ෂ වුනොත් සමාජය ඔබට අතවනනා වැරදි මාර්ගවලට නොඇලී සිටීමට ඔබට හැකිවනු ඇත. යහපත් රාත්‍රීයක්මයි යහපත් හෙට දවසක් ඔබට උදාකර දෙන්නේ. රූපයේ අනිත්‍යභාවය දකින්න, වේදනාවේ අනිත්‍යභාවය දකින්න, ආශ්වාදයේ මත්වීමට මුලාවෙන්නේ නැහැ. හොඳ නරක දෙකටම ඔහු බැඳෙන්නේ නැහැ. ඔහු දක්ෂයි. නිවැරදි තැන නවතින්න. නැවතුන කෙනාතුලමයි අපි අවබෝධයක පෙර නිමිති දකින්නේ. එතෙක් දුවන්නන් වාලේ දුවන්නන් බවටයි අප පත්වන්නේ. දැන් දිව්වා ඇතිද, තවත් දුවනවාද, කියන කාරණය නුවණින් සිහිකරමින් රාත්‍රී නින්දට යන්න. එවිට එම රාත්‍රිය ඔබට යහපත් රාත්‍රියක් වේවි. එම යහපත් රාත්‍රියම පිංවත් ඔබට අළුත් ගමනක ආරම්භයක් ඇතිකොට දේවි. ඒ ගමනේදී පිංවත් ඔබ උඩුගං බලායන කෙනෙක්. ලෝකය දෙසට නොවේ, ඔබ ගමන් කරන්නේ ලෝකයෙන් මිදීම දෙසට. ඒ කියන්නේ ඔබ සම්මා සම්බුද්ධ ශාසනයකදී හමුවන දුර්ලභ පුද්ගලයෙක්. ඔහු තුල විශ්වාසයක් සකස් වෙනවා. කවුරුන් තමා ළඟ සිටියත් මුළු ලෝකයාම තමාගේ කරට අත්වැල් දමාගෙන සිටියත්, බුදුරජාණන් වහන්සේ තමා ළඟ නැතිනම් තමා අසරණයෙක්ය කියලා. බුදුරජාණන් වහන්සේ තමා ළඟ සිටිනවා නම්, මුළු ලෝකයම අහිමි වුනත්, ඔහුට බියක් සකස් වෙන්නේ නැහැ අපි බුදුරජාණන් වහන්සේගේ සරණ ජීවිතයට එකතුකර නොගැනීම නිසාමයි දුවන්නන් වාලේ

දුවන්නේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා බුදුරජාණන් වහන්සේගේ සරණ අභිමිකරගන්න පිංවතා හමුවෙන හමුවෙන ඇසෙන දකින හැමෝගේම මුහුණ බලමින් මට මොහුගෙන් යහපත් දියුණුවක් ලැබේවි කියමින්, මට මොහුගෙන් මගේ රැකියාවට වියාපාරය, විවාහය සාර්ථක වේවියැයි සිතමින් කටයුතු කරන බව. මේ මනුෂ්‍ය ලෝකයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා, සක්විති රජුයි. මේ සක්විති රජුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේට වන්දනා කරනවා. සියළුම දිව්‍යතලයන්ට අධිපති වන්නේ ශක්‍ර දෙවියායි. එම ශක්‍ර දෙවියාත්, බුදුරජාණන් වහන්සේට වන්දනා කරනවා. මුළු බ්‍රහ්මථල වලට අධිපති වන්නේ මහා බ්‍රහ්මයායි. එම මහා බ්‍රහ්මයාත් බුදුරජාණන් වහන්සේට වන්දනාමාන කරනවා. එහෙම නම් තුන්ලෝකයටම ශ්‍රේෂ්ඨ වන්නේ ශක්තිය වන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේමයි. ඒ උතුම් ශක්තිය ළඟ පිංවත් ඔබ නවතින්න.

භික්ෂුව දන්න පිංවත් මහත්මයෙක් සිටිනවා. ඒ මහත්මයා වත්පෝසත්කම් වලින් පරිපූර්ණ මහත්මයෙක්. ඒ මහත්මයාත් කල්පනා කරනවා තමාගේ ධනයට කුමක්ද කරන්නේ කියලා. මේ ධනය කුමකට ආයෝජනය කලොත්ද, වැඩිම පොලියක්, වැඩිම ප්‍රතිලාභයක් ගන්න පුළුවන් වෙන්නේ කියලා. මේ මහත්මයා දීර්ඝ කාලයක පටන් කල්‍යාණමිත්‍ර ආශ්‍රය සද්ධර්ම ශ්‍රවණය කරන අයෙක්. ශ්‍රවණය කලා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරිම නිසාම ඒ මහත්මයා තම මුදල් ආයෝජනය කිරිමට වැඩි පොළියක් ගෙවන බැංකු ගැන සොයා බලනවා. ඒ මහත්මයා දකිනවා වාර්ෂිකව 10% පොළියක් ගෙවන බැංකු තිබෙනවා. වාර්ෂිකව 13% ක පොළියක් ගෙවන බැංකු තිබෙනවා. මේ මහත්මයාට ඇත්තටම මේ පොළිය සොච්චම් පොළියක්. සද්ධර්ම ශ්‍රවණය කිරිම නිසාම එම ධර්මය නුවණින් මෙනෙහි කිරිම නිසාම මේ පිංවත් මහත්මයා දකිනවා සම්මා සම්බුද්ධ ශාසනය නැමැති බැංකුවේ ගෙවන පොළී අනුපාතිකය බොහොම ඉහළයි කියලා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ එක දුප්පත් මහත්මයෙක් සිටියා. ඈත ග්‍රාමීය ප්‍රදේශයක දිරාගිය පැල්පතක් උරුම කරගෙන බිරිඳ සමගිනුයි ජීවත් වුණේ. ජීවත් වෙන්න ක්‍රමයක් නැති නිසාම මේ දුගී මහත්මයා රැකියාවක් සොයාගෙන නගරයට යන්න පිටත් වුණා. බිරිඳ මඟදී අනුභව කරන්න බත් මුලක් බැඳ දුන්නා. එම බත්මුලේ තිබුණේ බතුයි කරකොල මැල්ලුමක් පමණයි. මැල්ලුමට පොල් දමලා තිබුණේ නැහැ. මේ දුගී පිංවත් මහත්මයා බත් මුලත් අරගෙන කැලේ මැදින් නගරයට ගමන් කරන කොට බඩගිනි දැනීම නිසා ගසක් මුල වාඩි වී බත්මුල අනුභව කරන්න පටන් ගත්තා.  මේ වේලාවේ මෙතන පසු කොට අනුරුද්ධ මහ රහතන් වහන්සේ වැඩම කලා. දුගී මහත්මයා දන්නේ නැහැ මේ වඩින්නේ රහතන් වහන්සේ නමක් කියලා. අඩක් අනුභව කොට තිබූ බත් පාර්සලය මේ දුගී මහත්මයා ස්වාමීන් වහන්සේට පූජා කලා. දුගී මහත්මයාට පිංඅනුමෝදන් කොට ස්වාමීන් වහන්සේ වැඩියා. මේ දුගී මහත්මයා වෙහෙස නිසාම ගසමුල නිදා සිටියදී සර්පයෙක් දෂ්ඨ කිරිම නිසා මිය යනවා. මිය යන මොහොතේ දුගී මහත්මයාට කල්පනා වෙනවා තමා පූජා කලා වූ දානය. මේ හේතුවෙන්ම සග්‍රීක දිව්‍යතලයක සියළු යස ඉසුරු ඇති දෙවියෙක්ව උපත ලබනවා. තමන් අනුභව කරමින් සිටි බත් මුලෙන් ඉඳුල් බත් කොට සම්මා සම්බුද්ධ ශාසනය නැමැති බැංකුවේ තැන්පත් කොට සශ්‍රීක අසිරිමත් මිල කල නොහැකි දිව්‍ය සැපයක් කියන ප්‍රතිලාභය, පොළිය මේ දුගී මහත්මයා ලබනවා. නොවටිනා ඉඳුල් බත්මුලකට ලැබුණු පොළිය, ප්‍රතිලාභය දැක්කම මුලින් සඳහන් කල පිංවත් මහත්මයා තීරණය කරනවා තමාගේ ධනයත් වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන සම්මා සම්බුද්ධ ශාසනය නැමැති බැංකුවේ තැන්පත් කරනවාය කියලා. එම පිංවත් මහත්මයාගේ සිතේ ඇතිවුන සත්පුරුෂ සිතුවිල්ලේ ප්‍රතිඵලයන් නිසා මහා සංසරත්නය අරමුණු කොට ගෙන ශාසනික සේවාවන් හුභාක් සිද්ධකලා නිරතුරුවම දන්දීම් සිදුකලා. ඉහත ආදර්ශයට අනුව පිංවත් ඔබත් නූතන බැංකුකරණයේ නොවටිනා පොළියට මුලානොවී, අඩුම තැන්පත් මුදලට වැඩිම ප්‍රතිලාභයක් ලබාදෙන සම්මාසම්බුදු ශාසනය තුලම ඔබේ ධනය තැන්පත් කරන්න දක්ෂවෙන්න.

යහපත් රාත්‍රියක් ගැන සටහන අවසන් කරන කොට නැවතත් කොසොල් රජතුමාව මතකයට පැමිණියා. කොසොල් රජතුමා ස්වභාවයෙන්ම බොහෝම පුෂ්ඨිමත් ශරීරයක් ඇති රජකෙනෙක්. මොහු පමණ දැන ආහාර ගැනීම සිදුකළේ නැහැ. සිතත් බඩත් හොඳින් පිරෙන්න ආහාර ගත්ත රජකෙනෙක් දිනක් දහවල් ආහාරයෙන් පස්සේ බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණ ආහාරයෙන් මත්වීම නිසාම බොහෝම අපහසුවෙන් තමයි බුදුරජාණන් ඉදිරියේ වාඩිවී සිටියේ. ඒ වේලාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හැම කල්හිම සිහිය ඇතිව ආහාරයේ පමණ දැන ආහාර අනුභව කරන්න, තමාගේ වේදනාවන් තුනී කර ගන්නවා කියලා. මේ අවවාදයෙන් පස්සේ රජතුමා ආහාර ගන්නා විට බත්කට බැගින් අඩු කොට දිනපතා අනුභව කරන ආහාර ප්‍රමාණය අඩුකර ගෙන කායිකව මානසිකව විඳි පීඩාව තුනී කොට ගත්තා. නිරෝගී ජීවිතයක් සුවදායි නින්දත් අතර ලොකු සම්බන්ධයක් තියෙනවා. ඉහත කාරණා දෙකම අර්ථවත් වීමට, සිහියෙන් යුතුව පමණ දැන ආහාර ගැනීම වැදගත් වෙනවා. යම් දවසක නිරෝගී භාවයෙන් අනිත්‍යභාවය දැකීමට නම් නිරෝගී ජීවිතයක් තිබිය යුතුයි. නිරෝගි ජීවිතයක් යහපත් රාත්‍රියක් උදෙසා හොඳ ප්‍රවේශයක් සිහියක් ඇතිව පමණ දැන ආහාර ගැනීමට පුහුණු වීම තුළ තිබෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.